Санчо и желтый змей
යූරි යාකොව්ලෙව්
සංචෝ සහ කහ සරුංගලය
අනුවාදය
මල්රේණු කස්තුරිරත්න

යූරි යාකොව්ලෙව්

සංචෝ සහ කහ සරුංගලය

කෙටි නවකතාවකි

අනුවාදකගේ වෙනත් කෘති

වලෝද්යාගේ කතාව

විරුවන්ගේ නගරය

ග්‍රිගෝරි කොතෝව්ස්කී

කවදාද මා නැවතත් පාසල් යන්නේ

රවී සහ ශෂී

ආයුබෝවන් ගෘෂෝව්කා

විසල් වාද්‍යවෘන්දය

ප්‍රතිඥාව

රුසියානු අවි සවි

යූරි යාකොව්ලෙව්

සංචෝ සහ කහ සරුංගලය

කෙටි නවකතාවකි

චිත්‍ර

ඉ. හර්කෙවිච්

අනුවාදය

මල්රේණු කස්තූරිරත්න

රුසියන් බසිනි

සංචෝ සහ කහ සරුංගලය

© මල්රේණු කස්තූරිරත්න

ප්‍රථම මුද්‍රණය - 2015
දෙවන මුද්‍රණය - 2022

ISBN 978-955-0745-09-8

ප්‍රකාශනය
රුසියාව ප්‍රකාශකයෝ
34, කනගරත්න පෙදෙස,
ලක්ෂපතිය, මොරටුව.
0714881182

පරිගණක අක්ෂර සංයෝජනය,
පිටු සැකසුම හා මුද්‍රණය
තියෝ ග්‍රැෆික්ස්
අංක 143, උඩහමුල්ල දුම්රියපොළ පාර,
ගංගොඩවිල, නුගේගොඩ.
011 2 820220

වටිනාම දෙය

විශ්වාසවන්ත මිත්‍රත්වය,

ආදරණීය

නතාරී...

දේමී... (වේරගොඩ)

ඔබගේ අවංක සහෝදරත්වයට

තිළිණ කරමි...

සංචෝ සහ කහ සරුංගලය



සංචෝ සහ කහ සරුංගලය

1

පොළෝ තලයට ඉතා ඉහළින් සුප්‍රකට 'පෑන් ඇමරිකන්' ගුවන් සේවයට අයත් ගුවන් යානයක් පියාසර කරමින් තිබිණි. යානයේ වලිගය දෙසින් එන්ජින් යන්ත්‍ර නංවන ඒකාකාරී ගෙරවුම් හඬ අහස් තලයේ දසත පැතිරී යයි. ධවල පැහැ සන වලාකුළු මතින් යානයේ පියාපත්වල අඳුරු නිල් පැහැති සෙවණැල්ල ඉක්මනින් ලිස්සා ගියේය. මහා නීල සාගරයක් බඳු ගුවන් තලයේ, යානයට ඉහළින් එකදු වලාවක්වත් දක්නට නොවීය... වලාකුළකට එතරම් ඉහළ නගින්නට ශක්තිය නොමැත. එහෙයින් යානයේ දීර්ඝ පියාසැරිය පුරාවට ම ඇස් අන්ධකාර කරවන හිරු බබළමින් සිටියේය.

හරිත වන් මහාද්වීපය, අළු පැහැති තුනී මීදුම් සළුවෙන් යන්තමින් වැසුණු මහ මුහුදු බවට පෙරළෙන අයුරු යානයේ මගීහු නොදුටුවහ. එපමණක් නොව මහා සාගරය මත, ලෝක සිතියමේ සඳහන් පරිදි කදිමට මායිම් රේඛා සටහන් කළ අතරින් පතර වූ කුඩා දූපත් පවා ඔවුහු නොදුටුවහ. කුඩා ඉස්ත්‍රික්ක සේ ගුවනේ සිට නැරඹිය හැකි සාගර තරණ

නෞකා පවා ඔවුහු නොදුටුවහ. එපමණක් නොව, යටත් පිරිසෙයින් 'නව ලෝකය' පැරණි ලෝකයෙන් වෙනස්වන සැටි පවා - උෂ්ණ ගිම්හානය, සීත ඍතුව බවට පෙරළෙන හැටි පවා ඔවුන්ගේ අවධානයට බඳුන් නොවීය. මන්දයත්, ඒ සියලු අරුමැසියන් සිදු වූයේ මහා ධවල තිරයක් සේ ගුවන් යානයට පහළින් විහිදී පැතිරී ගිය වලාකුළු ඇතිරිල්ලට පහළිනි. එම වලා තීරය මුළුමහත් පෘථිවි තලයම ගුවන් මගීන්ගෙන් සඟවාලූ සැටියකි...

ගුවන් යානය දැනටමත් ගමනාන්තය කරා ළඟා වෙමින් තිබෙන බව පසක් කරමින්, හමුදා සෙබළියකගේ පෙනුම සිහි ගන්වන, නිල් පැහැති නිල ඇඳුමකින් සැරසුණු ගුවන් සේවිකාවක් මගීන් ඉදිරියේ පෙනී සිටියාය.

"නෝනාවරුනි, මහත්වරුනි !" යි ඇය මගීන් වෙත සිය අවධානය යොමු කරමින් නිවේදනය කළාය. "දැන් අපේ ගුවන් යානය සෝවියට් දේශයේ දේශ සීමාව හරහා පියාසර කරමින් සිටියි..."

තලඑළලු පැහැ වතක් ඇති, දුම්කොළ පැහැයට හුරු ඇඳුමකින් සැරසී ගත් කුඩා කොලුවෙක් එම නිවේදනය සමග කලබල විය. සැණින් අසුනේ කෙළවරට ලිස්සා ගිය දරුවා, යානයේ රවුම් කවුළුවේ වීදුරුවට මුහුණ තද කර ගත්තේය. වීදුරුවට තද වූ ඔහුගේ නාසය පැතලි විය. ජීවයෙන් පිරී දිදුලන දෙනෙත් යමක් කඩිනමින් සොයන්නට විය.

"කෝ - කෝ දේශ සීමාව ?"

මැෂින් තුවක්කු අතින් ගත් දේශ සීමා සෙබළුන් අරක්ගත්, ශක්තිමත් 'යකඩ තිරයක්' සහිත මහා ප්‍රාකාරයක් බඳු දේශ සීමාවක් දක්නට ලැබෙතැයි කොලුවාගේ උපකල්පනය තුළ

සිත්තම්ව තිබුණා විය හැකිය. එහෙත් දැන් ඔහු ඉදිරියේ කාන්සිය ඇති කරවන මහා ක්ෂීර සාගරය වැතිරී සිටියි.

"පා[1], දේශසීමාව කොහේද තියෙන්නේ?" යි කලකිරීමට පත් වූ ඔහු අසල අසුනේ හිඳ සිටි පියා වෙත හැරෙමින් ඇසුවේය.

"අන්න අතන පල්ලෙහා" කී පියා, සරත් සමයේ වියැළුණු ඕක් පත්‍රයක් අඹරා සාදාගත්තාක් වැනි මහත සුරුට්ටුව වෙත ලයිටරයේ ගිනි දැල්ල ළං කළේය.

පියා ද පුතා මෙන් ම තලඑළලු පැහැ වතකින් ද, කාල වර්ණ දැසකින් ද හෙබියේය. තේජාන්විත ලෙසින් උඩු අතට කැරකැවූ ඔහුගේ කදිම උඩු රැවුළ උඩු තොලට ඉහළින් සියුම් ලෙස පිහිටා තිබුණේ හරියට ම ව්‍යාජ උඩු රැවුළක් ඇල වූවා සේය. පියාගේ නාසය ගැටයක් සහිත, ඍජු, තරමක් විශාල එකක් විය. දෙබැමට ඉහළින් පුළුල් නළල් තලය මත රැලි තුනකි.

කොලුවාගේ මව අසාමාන්‍ය රූ සපුවකින් හෙබියාය. ඇගේ අඳුරු විසල් දෑස අවධානයෙන් හා දොම්නසින් සැම දෙනා දෙස බැලුම් හෙලුවේය. ඒ දෙනෙත් තුළ අනුකම්පාව යදින්නාක් මෙන් හෝ නැතහොත් තමන් කිසිවකුට අනුකම්පා කරන්නාක් වැනි හැඟීමක් හෝ ගැබ් වී තිබිණි.

"වලාකුළු නිසා කිසිම දෙයක් පේන්නේ නැහැ" යි ඇය කීවාය.

"අඩු තරමේ අපි සාගරයවත් දුටුවේ නැහැ නොවැ"

"අපරාදේ, එන්න තිබුණේ නැවක නැගලයි" කොලුවා සිය අදහස පළ කළේය.

1 පා - තාත්තා

"කලබල නොවී ඉඳපන්" යැයි කී පියා ලා නිල් වන් දුම් ගුලියක් පිට කළේය. "නුඹට තව බොහෝ දේවල් දකගන්න ලැබේවි !"

කොලුවා උසැති ඇන්දක් සහිත සැප පහසු අසුනේ වැතිර ගෙන දෑස් පියා ගත්තේය. තමාගෙන් සියලු සිත් ගන්නා සුලු දේ හිතාමතාම මෙන් සඟවා තබන ක්ෂීර සාගරය දෙස බලා සිටිනවාට වඩා දෙනෙත් පියාගෙන සිටීම යෙහෙකැයි ඔහු සිතුවාක් මෙනි.

දේශ සීමාව හරහා පියාසර කිරීම ආරම්භ කෙරුණු නිවේදනයෙන් පසුව ගුවන් සේවිකාව කුඩා අත් කරත්තයක් තල්ලු කරගෙන ආවාය. එහි විවිධ පැහැයෙන් යුත් බෝතල් අසුරා තිබිණි. ඇය ඉතා මෘදු ගෘහමය හඬකින් මගීන්ගෙන් විමසීය.

"ජූස්, විස්කි... ජින්, කොකා කෝලා..."

"සංචෝ, මොනවා හරි බොන්න ඕනෑද?" යි අම්මා විමසුවාය.

"එපා" යි කොලුවා පිළිතුරු දුන්නේය. "ස්තූතියි !"

මිනිත්තු දහයක් ම ඔහු එක ලෙස නොසෙල්වී දෙනෙත් පියාගෙන හිඳ සිටියේය. එහෙත් තවදුරටත් ඉවසා සිටින්නට නොහැකි වූයෙන් ඔහු යළි දෙනෙත් හැරියේය. සැණින් ඔහු වීදුරුව මත මුහුණ තද කර ගත්තේ, අනපේක්ෂිත යමක් එක්වරම දක ගැනීමේ අටියෙනි. එවිට එක්වරම - තමා අවට නාඳුනන පිට මිනිසුන් සිටින බව පවා අමතකව ඔහු කෑගැවේය.

"මා,[2] අර බලන්නකෝ ! සුදු පාට වැලි !"

2 මා - අම්මා

"ඒ හිම" යි අම්මා සිනාවෙන් මුව සරසා ගනිමින් පහදා දුන්නාය. "ඒ වගේ හිම අපේ රටේ නම් ඉතාම උස කඳු මුදුන්වල විතරයි තියෙන්නේ..."

"ආ... මුළු පොළොවෙම හිම?" යි සංචෝ මවිතයට පත් වෙමින් කීවේය. "ඔට්ටුයි, හිම අයිස් ක්‍රීම් වගේමයි ?"

"ඒ වගේ තමයි"

"මුළු පොළොවෙම අයිස්ක්‍රීම් !"

"සීනි ටිකක් ඉහලා ගත්තා නම් තව මොනවාද?" පියා සරදම් කළේය.

තිදෙනාම සිනාසුණෝය.

ගුවන් යානයට පහළින් අති විශාල භූමි ප්‍රදේශයක් හිමෙන් වැසී පැවතිණි. සදාකාලික හරිත පැහැයෙන් හෙබි උණුසුම් රටක ඉපැදුණු කොලුවාට හිමෙන් පිරි රුසියානු සීත සෘතුව ආශ්චර්යමත් දසුනක් විය. හරියටම ඔහු දන් දුර ඈත නොදන්නා අපූරු ග්‍රහ ලෝකයකට සේන්දු වන්නාක් මෙනි. දන් වඩා පහළින් පියාසර කළ ගුවන් යානයේ කතිර හැඩැති සෙවණැල්ල ධවලමය හිම වැටි හරහා වේගයෙන් ඇදී යයි.

බොහෝ වේලාවක් හිම දෙස වශී වුණාක් මෙන් බලා සිටි සංචෝ පියාගෙන් මෙසේ ඇසුවේය.

"පා, සෝවියට් දේශයේ ළමයි 'රතු ඉන්දියානුවන්ගේ' සෙල්ලම කරනවාද?"

"දන්නේ නැහැ. බාගදා එයාලා 'හොරා පොලිස්' සෙල්ලම කරනවා ඇති. මොකද මුළු ලෝකෙම ළමයි ඒ සෙල්ලම කරනවා නොවැ" යි පියා සිය අදහස පළ කළේය.

"මම තමයි ෆන්තොමාස්[3] වෙන්නේ !" යි සංචෝ උඩ පැන්නේය.

"බලමුකෝ..." යි මැඩගත් සිනාවෙන් පැවැසූ පියා, මඳ වේලාවකින් යළිත් කටහඬ අවදි කළේය. "බාගවිට නුඹ චපායෙව් සෙල්ලම් කරාවි"

"ඒ කවුද? චපායෙව්" යි සංචෝ උනන්දු වෙමින් පියා දෙස බැලුවේය.

"රුසියානු වීරයෙක්. මම එයා ගැන චිත්‍රපටයක් නැරඹුවා."

"ඇයි මමත් බැලුවනේ" යි අම්මා කතාවට මැදිහත් වූවාය. "ඒ කතාවේ එක මහත්මියක් මැෂින් තුවක්කුවකින් වෙඩි තිබ්බා"

"ප්‍රධාන දේ හැකි තරම් යාළුවෝ ඇති කර ගනින්" යයි පියා ඔවදන් දුන්නේය. "යාළුවෝ තමයි පිටරටක දී හොඳම මාර්ගෝපදේශකයෝ වෙන්නේ"

"පා, රුසියාවේ බල්ලෝ ඉන්නවාද?"

"රුසියාවේ ව්‍යාඝ්‍රයෝ පවා ඉන්නවා" යි පියා පිළිතුරු දුන්නේය.

"ඕ-ඕ-ඕ !" යි හඬ නැගූ සංචෝ, යළිත් සීතල වීදුරු කවුළුවට ඇලුණේය.

3 ෆන්තොමාස් - මර්සෙල් අලේන් සහ පියර් සූවෙස්තර්ගේ පත්හිඳෙන් නිර්මාණය වූ මනඃකල්පිත අපූරු චරිතයකි.

2

රුසියානු භාෂාව උගන්වන ගුරුතුමිය, මාරියා පාව්ලොව්නා පන්ති කාමරයට පිවිසෙත් ම, දුටු දසුනින් විස්මයට පත් වූවාය. මුළු මහත් පන්ති කාමරය ම සපමින් සිටියි. සිසුවෝ නිහඬව සන්සුන්ව ස්වකීය බංකු මත හිඳ සිටියෝය. ඔවුහු මහත් උද්යෝගයෙන් හා කඩිසර ලෙසින් ස්වකීය හකුපාඩා ක්‍රියා කරවමින් සිටියෝය. සැපීමෙන් කෙසේවත් ජයගත නොහැකි තරම් තදැති දරදඬු මස් කැබැල්ලක් බැගින් ඔවුන් හැමටම බෙදා දුන්නාක් මෙනි. ඉතාමත් සාමකාමී ලෙසින් සපමින් සිටින සිසුන් දෙස මඳ වේලාවක් විමතියෙන් බලා සිටි ගුරුතුමිය මෙසේ ප්‍රශ්න කළාය.

"මොකද්ද මේ වැඩේ තේරුම ?"

පිටුපස පෙළෙන් සිනා හඬක් පැතිරිණි. එහෙත් පන්ති කාමරයේ සැපීම නොනවත්වාම සිදු කෙරෙයි.

"මොකද මේ - හැමෝම හපන්නේ ?" යි ගුරුතුමිය කෝප වීමට පටන් ගත්තාය.

"හැබැට ම ඔහේලට විවේක කාලයේ දී උදේ කෑම අරගන්න බැරි වුණා ද?"

සපන්නන්ගේ සංගමය දෙකට බෙදිණි. ඇතැමෙකුගේ හකුපාඩා ක්‍රියා කිරීම නැවතිණි. එහෙත් වැඩි පිරිසක් නොනවත්වාම සපමින් සිටියහ.

"වහාම සැපීම නවත්වනු !"

ඉදිරි පෙළ බංකුවක් හඬ නැංවිණි. පිරුණු දෙකොපුල් සහිත දැරියක් නැගී සිටියාය. ඇගේ හිස කෙස් කෙටි මහත කොණ්ඩා කරල් දෙකක් වන සේ ගොතා තිබිණි.

"අපේ පන්තියේ විදේශිකයෙක් !"

දැරිය යළිත් හිඳ ගත්තී, එසැණින් ම සැපීම ආරම්භ කළාය.

"පාඩම අතරතුර ආහාර ගැනීමත් සමග එහි ඇති සම්බන්ධතාවය කුමක්ද?" යි මාරියා පාව්ලොව්නා ප්‍රශ්න කළාය.

එවිට හතරවැනි පෙළ බංකුවෙන් තලඑළලු පැහැ කොලුවෙක් නැගී සිටියේය. ඔහුගේ කාලවර්ණ දෙනෙත් පාලනය කරගත නොහැකි තරම් උද්යෝගයකින් දැවුණේය. පෙනෙන හැටියට ඔහුට, ගුරුතුමිය මෙතරම් කෝප වූයේ මක්නිසාදැයි වටහා ගැනීමට නොහැකි වූ සැටියකි. තීරණාත්මක ලෙස ගුරුතුමිය වෙත ගිය කොලුවා, දිළිසෙන කවරයක් සහිත එක්තරා පැකට්ටුවක් දිගු කළේය.

"කරුණාකර මහත්මිය, සංග්‍රහය භුක්ති විඳින්න. මේ හොඳ ම හොඳ චුයින්ගම්... ලෙමන් රසයෙන් යුක්තයි"

"ස්තුතියි !" විමතියෙන් පැවසූ මාරියා පාව්ලොව්නා දුටු පමණින් ම මුහුදෙන් එතෙර වැසියෙක් බව හඳුනාගත හැකි අපූරු නවක සිසුවා දෙස ඇසිපිය නොහෙලා බලා සිටියාය. "නුඹේ නම මොකද්ද?"

"සංචෝ. සංචෝ රොද්‍රිගෙස්. එතකොට ඔබතුමියගේ, මහත්මිය ?"

"මගේ නම මාරියා පාව්ලොව්නා... ඒ වගේ ම 'මහත්මිය' නෙමෙයි... මම තව ම 'මෙණෙවිය'..."

"මාරියා මෙණෙවිය !"යි සංචෝ පුනරුච්චාරණය කළේය. "මාරියා මෙණෙවිය, ඇයි ඔබතුමිය ළමයින්ට පාඩමේ දී චුයින්ගම් හපන්න ඉඩ නොදෙන්නේ ? අපේ රටේ වුණත් දුම්බීම තහනම්. ඒත් හපන්න..."

"සංචෝ" යි ඇමතූ මාරියා පාව්ලොව්නා කොලුවාගේ උරය මත අත තැබුවාය. "අපේ රටේ එය ප්‍රිය කරන්නේ නැහැ. ඒ වගේ ම පොඳුවේ ගත්තම අපි රබර් කෑලි හපන්නේ නැහැ... ලෙමන් රස ඒවා පවා. ඉතින්, ඉඳගනින් සංචෝ"

හිස මඳක් නැඹුරු කරගත් සංචෝ සිය අසුන වෙත හැරී ගියේය.

"හොඳයි දූන් හැමෝම අභ්‍යාස පොත් අරගන්න. අපි කියවන විට ලිවීමේ අභ්‍යාසය කරමු" යි ගුරුතුමිය කීවාය. "ආ... නුඹ, සංචෝ නොලිවුවාට කමක් නැහැ..."

"ස්තුතියි, මෙණෙවිය ! ඔබ බොහෝම කරුණාවන්තයි... ඒත් මට ඕන අත්හදා බලන්න"

"අත්හදා බලන්නකෝ එහෙනම්. මම හෙමින් කියවන්නම් හොඳේ..."

"ඔන්න බලන්න, මම වැරදි සියයක්වත් කරාවි" යි සංචෝ සිය අසල්වැසි සිසුවියට රහසින් කෙඳිරිය. එවිට ඔහුගේ වත කමල රත් පැහැ ගත්තෙන්, එය වඩාත් තලඑළලු පැහැ ගත්තේය. "මම ගෙදරදි ඉගෙන ගෙන තියෙනවා... ඒත් හොඳ මදි"

"නුඹ නොලියා ඉඳපන්" යැයි අසල්වැසි සිසුවිය උපදෙස් දුන්නාය.

"මම ලියනවාමයි !"

එවිට මාරියා මෙණෙවිය සංචෝ වෙත සමීපව මෙසේ කීවාය.

"නුඹට එක පාරටම පුරුද්දෙන් අත්මිදෙන්න අපහසු නම්, ටිකක් විතර හැපුවට කමක් නෑ අර නුඹේ රබර් කැල්ල..."

"ඔබ හරි...ම කරුණාවන්තයි !" කී සංචෝ එකවරම සිය අසුනින් උඩ පැන කවුළුව වෙත දිවගොස් 'ලෙමන් රස' චුයින්ගම් තොගයම කවුළුවෙන් එපිටට වීසි කළේය.

****

සීත ඍතුව විසින් නගරය වෙළා ගන්නා ලදී. නිවෙස්හි වහල මත සුදෝ සුදු හිම ගොඩ ගැසිලාය. දුරකථන හා විදුලි රැහැන් මත පළිඟුවන් හිම කුරු එල්ලෙමින් තිබේ. වීදුරු කවුළු මත අපූරු හිම මෝස්තර පහළ විය. වසර පුරාම උණුසුම් කාලගුණයක් යළි පහළ නොවන්නාක් මෙනි.

සීත ඍතුව අස්සක් මුල්ලක් නෑර සෑම තැනක ම අරක් ගෙන සිටියි. මහ මග යන එන්නන් ප්‍රශ්වාස කරන විට, නිවෙස්වල දොරටු විවර වන විට, රථ වාහන හඬ නගන විට, පිරොෂ්කා[1] අලෙවි කරන්නන් බඳුනේ පියන් හරින විට, සෑම උණුසුම් වායු ප්‍රවාහයක් සමගින් ලොකු කුඩා සුදු පැහැති වාෂ්ප වලා ඉහළ නැංගේය.

සංචෝ පාසලෙන් පිට වී වීදියට බසිත් ම ඔහුට හුස්ම ගැනීමට නුපුරුදු බවක් සහ දෙකන් පිළිස්සෙන්නාක් වැනි වේදනාවක් ඇති විය. එක්වරම ඔහු දෑතින් දෙසවන්

1 පිරොෂ්කා - මාළු බනිස්වලට සමාන කෙටි කෑම

වසාගත්තේ, අවට මහා ශබ්දයක් ඇති වූ විටක මෙනි. දෙකන් යන්තමින් උණුසුම් විය. එහෙත් එවිටම නාසය වේදනා දෙන්නට පටන් ගත්තෙන් ඔහු කබායේ අතින් නාසය සඟවා ගත්තේය. එවිට සීතල ඔහුගේ කමිස කොළරයෙන් රිංගා ගත්තේය. නවකයා අත්අඩංගුවට ගත් සීතල ඔහුට සියලු ආකාරයේ හිරිහැර පීඩා කරන්නට සමත් විය.

"අපොයි, මේ මොකෝ?" යි හීන් හඬින් සංචෝට කියැවිණි.

හඳුනන කටහඬක් ඔහුට උත්තර දුන්නේය.

"ඒ සීතල !"

සංචෝ ඉක්මනින් ආපසු හැරී බැලීය. ඔහුට සිය අසල්වැසි සිසුවිය දක්නට ලැබිණි. ඇය කදිම ලොම් කබායක් සහ එවැනිම ලොම් හිස් වැස්මක් පැළඳ සිටියාය. සුන්දර කදිම කෙස් රොදක් ඇගේ ඇහි බැම තෙක් වැටී තිබුණේය. සිසුවියගේ දිදුලන අළු - නිල් දෙනෙත් කුතුහලයෙන් සහ සරදම්කාරී ලෙසින් සංචෝ දෙස බලා සිටියි. එම දසුනින් කොලුවාට සීත නිසා ගල් වූ සිය දෙකන් අමතකව ගියේය.

"මෙණෙවිය... මම ඔබව ගෙදර ඇරලවන්නම්... ඔබේ අවසරය ලබා දෙන්න..." යි විදේශික කොලුවා හීන් හඬින් කෙඳිරීය. එහෙත් රීතා ඔහුට වැකිය අවසන් කිරීමට ඉඩ නොදුන්නාය.

"නුඹේ පොත් මල්ල මෙහේ දෙන්න ! ඉක්මනට කන් දෙක උණුසුම් කර ගන්න ! ඒ වගේ ම මට මෙණෙවිය කියලා අමතන්නත් එපා ! ඉන් නැති කරදර ඇති වේවි..."

"මම ඔබව අමතන්නම්, ඔබ කියන හැටියට..."

"මට රීතා කියලා හරි 'නුඹ' කියලා හරි අමතන්න..."

"රීතා... නුඹ..." යි සංචෝ එය පුනරුච්චාරණය කළේය.

"මම නුඹව ගෙදර ඇරලවන්නම්. ඒ මොකද නුඹයි නවකයා"

"නවකයා !" පුනරුච්චාරණය කළ සංචෝ සිනා පෑවේය. 'නවකයා' යන වචනය ඔහු කෙරෙහි අනපේක්ෂිත හාස්‍යජනක බවක් මවා පෑවේය.

"මම නවකයා... ඒත් මමයි ඔබව... නෑ... නුඹව ගෙදර ඇරලවන්නේ... ඒ මොකද මම නවක පිරිමියා...!"

"නුඹ පුංචි කොල්ලෙක්නේ?" යි රීතා සරදම් කළාය.

ඇගේ සරදම නිසා ඔහුට එක්තරා අපහසුවක් දැනුණේය.

හරියට ම ඒ මොහොතේ, සීත නිසා නාසය රෝස පැහැගත් හීන්දෑරි උස කොලුවෙක් හිම අහුරක් අතට ගෙන ඉන් හිම බෝලයක් සාදා රීතා වෙත දමා ගැසුවේය. දැරිය යටි උගුරෙන් කෑගැසුවා, දෑතින් මුහුණ වසා ගත්තාය.

කඟවේනකු සේ සංචෝ ඉදිරියට පැන්නේය. තමාගේ හිසටත් වඩා උස හීන්දෑරී කොලුවා ඉදිරියේ ඔහු තීරණාත්මක ලෙස සිටගත්තේය. පොත් මල්ල හිම මතට විසි කළ සංචෝ සිය මව් බසින් මොන මොනවාදෝ කියා කෑගැවේය. යළිත් නොදන්නා බසකින් යමක් කෑ ගැසූ ඔහු වරදකාරයා දෑඩිව ග්‍රහණය කර ගත්තේය. එක්වරම දඬු අඬුවකට හසු වූවාක් මෙන් අනපේක්ෂිත අකරතැබ්බයකට මුහුණ පෑ දිග් දණ්ඩා, ඉන් නිදහස් වීමට වැර දරමින් පොර බැඳුවේය. එක්වරම ඔහුගේ පය ලිස්සා ගියෙන් බිම ඇද වැටුණේය. සටන්කාමියෝ මහ පොළොව මත පෙරළෙමින් මල්ලව පොරයේ යෙදෙන්නට වූහ. ඒ අතර එකිනෙකාට මදි නොකියන්නට බැට දී ගන්නට ද ඔවුහු අමතක නොකළහ. සංචෝ යළිත් සිය ප්‍රතිවාදියාට යටිගිරියෙන් යමක් කෑගැවේය.

සතරවටින් දිව ආ ළමයි අමාරුවෙන් ඔවුන් දෙදෙනා අල්ලා දෙපසට කළහ.

පළුදු වූ රාමුව සහිත උපැස් යුවළක් පැලඳ සිටි.කොලුවෙක් (ඔහුගේ නම ෂූරික් බව පසුව සංචෝ දැන ගත්තේය) බිම වැටුණු හිස් වැසුම අහුලා එය සංචෝගේ හිසෙහි පැලඳුවේය. කිසිවෙක් හීන්දෑරී දිග් දණ්ඩා දෑඩිව බඳා අල්ලා ගෙන ඉවතට ගෙන යමින් සිටියේය. දිග් දණ්ඩා ඔහුගේ ග්‍රහණයෙන් මිදෙන්නට දඟලමින් සිය දිගු දෑත් වනමින් කෑගැවේය.

"එයා තමයි ඉස්සෙල්ලාම... මම උන්දෑට!"

අසල්වැසි සිසුවිය සමග සංචෝ එහි තනි විය. ප්‍රතිවාදියාගේ පහරින් ඔහුගේ නාසය ඉදිමී තිබිණි. තොල පැලී සිහින් ලේ ගැල්මකි. ඔහුගේ පෙනුම අනුකම්පා උපදවන සුලු විය. ගැහැනු ළමයෙකු ඉදිරියේ එලෙස සිටගෙන සිටීමෙන්

සිය අදක්ෂ භාවය පෙනෙන්නේ යැයි ඔහුට හැඟුණේය. එතැනින් පැන දුවන්නට ද, කිසිවෙකුට නොපෙනෙන තැනක සැඟවී ගන්නට ද ඔහුට වුවමනා විය. එහෙත් ඔහු නොසෙල්වී සිටියේය. රීතාගේ සරදම්කාරී දෙනෙත මුණගැසෙතැයි බියෙන් හිස එසවීමට ඔහුට ධෛර්යය වඩාගත නොහැකි විය. ඔහු ඇගේ සරදම්කාරී සිනාව බලාපොරොත්තුවෙන් සිටියේය. සැබවින් ම කාන්තාවෝ, පිරිමින්ගේ එවැනි පරාජයන්ට කමා කරත් ද?

රීතා කොහෙත් ම සිනා නොපෑවා පමණක් නොව මුවින් කිසිවක් නොබිණීය. ඇය හිම අහුරක් අතට ගෙන ඉන් බෝලයක් තනා, ඔහුගේ ඉදිමුණු නාසයට එය තද කළේය. හිම මුදු බවක් කියා පෑවේය. එහි ස්පර්ශයත් සමගින් වේදනාව සැණින් අතුරුදහන් විය.

සංචෝ විමතියෙන් රීතා දෙස බැලුවේය.

"හිම..." ඇය කීවාය.

"මං හිතුවේ... ඒ ගලක් කියලා..." යි කොලුවා කෙඳිරීය. "සුදු පාට ගලක්..." පුංචි විදේශිකයා දෙස රීතා විමසුම් බැල්මක් හෙලුවාය.

"නුඹ 'දොන් - කිහෝත්' පොත කියෙව්වාද?"

"මගේ නමත් ඒ පොතෙන් තමයි" කොලුවා දොම්නසින් කීවේය. "ඇත්තමයි සංචෝ පන්සා නමට මම කැමති නැහැ..."

"නුඹ වැඩිපුරම සමාන දොන්- කිහොත්ට[2]. මේ දැන් නුඹ

2 දොන් - කිහොත් - ස්පාඤ්ඤ ගත්කරු මිගෙල් ද සෙර්වාන්තෙස්ගේ (1547-1616) ලෝපතල නවකතාවක චරිතයකි. එහි ප්‍රධාන චරිත වූ දොන් - කිහොත් සහ සන්චො පන්සො ත්‍රාසජනක කටයුතුවල නිරත වෙමින් සුළං මෝල් සහ විවිධ අද්භූත දේ සමග සටන් කරමින් චාරිකාවේ නිරත වූහ.

සටන් කළා සුළං මෝලක් සමග" යි රීතා කීවාය. "නුඹ හිම බෝල සුදු පාට ගල් කියලා වරදවා වටහා ගත්තා"

"සුළං මෝල්..." යි කී සංචෝ සුසුමක් හෙළා හිම බෝලය නාසයට තද කර ගත්තේය. "අපරාදේ මෙහේ පාන් ගස් (දෙල් ගස්) නැහැ නොවැ- තිබුණා නම් ඒවායේ පත්‍ර තුවාලවලට හොඳ ඔසුවක්"

"අපේ රටේ ලේ නවත්වන්න භාවිත කරන්නේ පදරෝෂ්නික් පැළෑටියේ පත්‍ර. ඔයාලාගේ රටෙත් පදරෝෂ්නික් වැවෙනවද?"

"ප-ද-රොෂ්-නි-ක් ?"

විටෙන් විට දොඩමලු වෙමින් ඔවුහු දෙදෙනා හිමෙන් පිරි මාවත දිගේ ඇවිද ගියෝය. රථ වාහන ඔවුන් අසලින් ගමන් කළේය. මගියෝ ඔවුන් පසුකර ඇවිද ගියෝය. වෙළෙඳසල්වල අලංකාර ප්‍රදර්ශන කවුළු ඔවුන් පසුකර පාවී ගියේය. හිම ඉවත් කරන විශාල රථය ඉමහත් උද්යෝගයෙන් සිය යකඩ අත්වලින් වීදියේ හිම ඉවත් කරමින් සිටියි.

"හනි - හනිකට! හනි - හනිකට !!"යි රීතා හිම ශුද්ධ කරන රථයට සරදම් කරමින් ප්‍රීතියෙන් කෑගෑවාය.

"හනි - හනිකට! හනි - හනිකට !!" යි ඇය අනුකරණය කරමින් කෑගෑ සංචෝට ඉදිමුණු නාසය පිළිබඳව අමතකව ගියේය. ඔහු යන්ත්‍රයේ යකඩ අත් ක්‍රියාකරවන ලෙසින් සිය දෑත් කරකැව්වේය.

"ආසයි දනගන්න, දොන් - කිහෝත් මේ යන්තරේ කවුරු හැටියට වරදවා වටහා ගනීවිද කියලා. අර සුළං මෝල් නපුරු

ඉන්ද්‍රජාලිකයන් යැයි හිතුවා වගේ?" යි දැරිය විනෝද වෙමින් ඇසුවාය.

සංචෝ සිය සහචාරිකාව දෙස පරීක්ෂාවෙන් බැලුවා මිස වචනයක්වත් නොදෙඩීය.

නිවෙස් කිහිපයක් පසුකර ගිය පසු ඔහු මෙසේ ඇසුවේය.

"නුඹේ තාත්තා මොන වැඩද කරන්නේ ?"

එම පැනයෙන් රීතා ව්‍යාකූලත්වයට පත් වූවාය.

"වැඩ ? එයාට වැඩ නැහැ... එයාට රැකියාවක් තියෙන්නේ..."

"මගේ තාත්තාටත් තමුන්ගේ ම වැඩක් නැහැ... එයා රැකියාවක් කරන්නේ කොම්පැනියේ..."

"ධනපති කොම්පැනියේ?" යි රීතා පිළිවිසීය.

"කෙසෙල් කොම්පැනියක. ඔයා අඹවලට කැමති ද? අඹ යුෂ..."

"හුඟාක් !!" දැරිය උඩ පැන්නාය.

"කොම්පැනියේ අඹත් විකුණනවා"

සංචෝ යමක් ගැන මෙනෙහි කරන්නට වූයේය. මොහොතකට පසු ඔහු යෙහෙළිය වෙත හැරී මෙසේ කීවේය.

"මගේ සීයා යුද්ධෙදි මළා. එයා බැන්චෝ රබන් කරුවෙක්"

රීතා ඔහු දෙස නොවැටහුණු බැල්මක් හෙළන අයුරු දුටු සංචෝ, බැන්චෝ රබන් භාණ්ඩයක් විලසින් පොත් මල්ල

උදරය මත තබා, සිතින් මවාගත් අදෘශ්‍යමාන තත් වයමින්, එක්තරා කාලයක සීයා විසින් ගයන ලද ගීයක් ගයන්නට පටන් ගත්තේය.

ළහිරු තඹ පාට වී දවෙන සඳ
පා ලකුණු මකාලයි දූවිල්ල
පොල් ගසේ හරිතවත් පියාපත්
එහෙත් එය ඉගිල්ලෙනු අසමත්
ලැබේ නම් නිමේෂයකට වුවත්
මට එවන් හරිතවත් පියාපත්
නීල ආකාශයේ ඈතට ම ඈතට ම
මා රැගෙන පියාඹති, පියාපත් හරිතවත්...

බෝම්බ පුපුරා යන, මහ පොළොව ගිනි ගෙන දැවුණු මහා භයානක යුද සමයේ පැන නැගි ඒ ගීතය සාමකාමී නගරයට ඉහළින් පියාඹා ගියේය. සංචෝ එම ගීතය සිය මව් බසින් ගැයුව ද, එහි එකදු වදනක්වත් රීතාට තේරුම් ගැනීමට නොහැකි වුවද, යුද බිමේ සිට යළි නොපැමිණි සංචෝගේ සංගීතකාර සීයා ගැන අනුකම්පාවකින් ඇගේ හදවත බර විය.

"ඒත් ඇයි සීයා මළේ ?" රීතා ප්‍රශ්න කළාය.

"එයා වෙඩි තියාගත්තේ නැත්නම්, බැන්චෝ රබානක් විතරක් නම් වාදනය කළේ?"

"එයා වාදනය කළේ සොල්දාදුවන්ට... ෆැසිස්ට් ජර්මාන්නු වෙඩි තිබ්බා. හැමෝටම වෙඩි තියා දැමුවා..."

බොහෝ වේලාවක් ඔවුහු දෙදෙනා නිහඬව ගමන් කළෝය. 'පොල් ගසේ හරිතවත් පියාපත්, එහෙත් එය

ඉගිල්ලෙනු අසමත්...' ගීතයේ තනුව ඔවුන්ගේ සවන් තුළ නින්නාද විය.

ඔවුන් ඉදිරියේ පැරණි සුවිසල් නිවසක් දර්ශනය විය. එහි බරැති විසල් සඳලුතල, රැවුළු සහිත ශෛලමය ප්‍රතිමා දෙකක් විසින් උරයෙන් දරා සිටියි.

"මේ අපේ ගෙදර" යි පැවැසූ රීතා යාබද පාන් විකුණන සාප්පුව හිසෙන් පෙන්වා විහිළු කළාය. "මේ තමයි අපේ පාන් ගස, දැනෙනවද එහි සුවඳ?"

උණුසුම් පාන්වලින් හමන ප්‍රණීත සුවඳ සංචෝ ළය පුරා ආශ්වාස කළේය.

"ප්‍රණීතයි ! ඒත් අපේ පාන් ගහෙන් නම් හමන්නේ වනයේ සුවඳ"

"හොඳයි, දැන් මම තුඹව තුඹේ ගෙදරට ම ඇරලවන්නම්. නැතිනම් තුඹ මංමුලා වේවි!" යි රීතා යෝජනා කළාය.

"එහෙම කොහොමද? හරි නම් තුඹයි මෙණෙවිය" යි විරෝධය පළ කළ සංචෝ, ඇය සඳහා උචිත වචනය 'මෙණෙවිය' නොව 'ගැහැනු ළමයා' බව අමතක කළේය.

"මම තුඹේ සහෝදරිය !" යි රීතා කීවාය. "ගැහැනු ළමයෙක් ද පිරිමි ළමයෙක් ද කියන එක සහෝදරවරුන්ට වැදගත් නැහැ !"

"බොහොම වැදගත් - මෙණෙවිය ද - මහත්මයා ද කියන එක!" යැයි සංචෝ ඇය සමග එකඟ නොවෙමින් තර්ක කළේය.

"මෙහේ දියන් තුඹේ පොත් මල්ල !" යි රීතා නියෝග කළාය. "දැන් කන් දෙක අතුල්ල ගනින්. තුඹේ කන්

හොඳටෝම සීතල වෙලා. අපේ රටේ මහත්තුරු නැහැ. ඉන්නේ සහෝදරවරු විතරයි!"

පුලුන් කැටි වැනි සිහින් හිම පියලි පාවෙමින් පතිත වන්නට පටන් ගත්තේය. සංචෝ, සිය දිවියේ කිසිම දවසක හිම පතනයක් සිදුවන අයුරු දැක නොතිබිණි. ඔහු නැවතී එදෙස මවිතයෙන් බලා සිටියේය.

"සුදු පාට, තිහඬ වැස්ස" යි ඔහු කීවේය.

රීතා අත්ල දිගු කර 'සුදු පාට වැස්ස' අල්ලා ගත්තාය. ඇගේ අත්ල මත හිම පියල්ලකි.

"බලන්න !"යි ඇය සිය අත්ල කොලුවාගේ නුවන් ඉදිරියට පාමින් කීවාය.

සංචෝ ඉදිරියට නැමී ඇගේ අත්ල මත වූ හිම පියල්ල දෙස දෙනෙත් විදහා බැලුවේය. ඔහු එහි තරුවක් දිටීය. දක්ෂ කලා ශිල්පියෙක් අති විශේෂ සියුම් තියනකින් කපා ඔප දැමූ දිදුලන දුර්ලභ දියමන්තියක් මෙනි, ඔහුට එය පෙනුණේ. කොලුවාගේ දෙනෙත් අඩවන් විය. පුංචි තාරකාව වැඩෙන්නට පටන් ගත්තේය. එහි කිරණ විහිදුවන සමමිතික හැඩ තල සහිත හිම මෝස්තර ඔහු දුටුවේය. හිම පියල්ලෙන් දෙනෙත් එස වූ සංචෝ රීතා දෙස බැලුවේය. ඒ අරුම පුදුම ඉන්ද්‍රජාලික හිම තරුව සිය අලුත් මිතුරිය විසින් මවන ලදැයි ඔහුට හැඟුණේය.

****

"හැබැටම මේ වැඩේ තේරුම මොකද්ද සංචෝ රොද්‍රිගෙස්? නුඹ නොදන්න පිටරටකට ඇවිල්ලා, නොදන්න පාසලකට

ගිහිල්ලා, ඒ මදිවට මුල් දවසෙම ගෙදර ආවේ... නහයත් කඩාගෙන!"

පියා සහ මව ආලින්දයේ සිටගෙන නොසතුටින් සංචෝ දෙස බලා සිටියෝය.

"නුඹව අමනාප කළා ද?" යි අම්මා ප්‍රශ්න කළාය. "හැමදාමත් නවකයන්ව අමනාපයට පත් කරනවා නොවැ"

"ඔට්ටුයි, නුඹ තමයි මුල පිරුවේ ගහන්න, නැද්ද?" යි පියා දැඩිව ප්‍රශ්න කළේය.

"මම ඉදිරිපත් වුණේ රීතා වෙනුවෙන්..."

"එක එක්කෙනා වෙනුවෙන් ඉදිරිපත් වෙන්න නුඹ හිතාගෙන ඉන්නේ, තමුන්ගේ මවුබිමේ ඉන්නවා කියලද?"

"එයා රීතාට දමලා ගැහුවා සුදු පාට ගලකින්"

"එයා - ඇයට?" යි අම්මා කෑගැවාය.

"මොනවා, ඇයට ගලකින් ගැහුවා" යි ඇය රහසින් පවසන්නාක් මෙන් යළිත් කීවාය. "නැහැදිච්ච ළමයෙක් නොවැ?"

"නැහැ" යි සංචෝ උත්තර දුන්නේය. "ඇත්තට ම ඒක ගලක් නොවෙයි - හිම ගුලියක්"

"හා - හා රුසියන් බසින් ඒකට කියන්නේ 'ස්නෙෂොක්' කියලයි" පියා සියල්ල වැටහුණ ලෙසින් සිනාපෑවේය. "මේ රටේ ඒ වගේ සෙල්ලමක් තියෙනවා. ළමයි හිම බෝල හදාගෙන එකිනෙකාට ගහ ගන්නවා. ඒක හරිම විනෝද ක්‍රීඩාවක්. කාටවත් රිදෙන්නේ නැහැ. අනේ නුඹ සංචෝ

තෙමෙයි, හරි නම් නුඹ - දොන් කිහොත් !" යැයි පියා උස් හඬින් කීවේය.

"ඒ බව මට දැනටමත් කියලයි තියෙන්නේ" යි සංචෝ සෙමින් පැවසීය.

"කවුද නුඹට එහෙම කිව්වේ ?"

"රීතා"

මව සහ පියා එකිනෙකා දෙස බැලුවෝය.

"යමු මගේ දොන් කිහොත්" යැයි අම්මා අනුකම්පාවෙන් කීවාය. "මම නුඹේ තුවාලවලට සාත්තු කරන්නම්"

"දෙකක් නෑ... හෙට නුඹව කොලීජියේ විදුහල්පති ළඟට කැඳවාවී"යි පියා සුසුම්ලමින් කීවේය. "අනිද්දට මාවත් කැඳවාවි..."

3

පසු දින සංචෝ කඩිනමින් පාසල වෙත දිව ගියේය. පාසලේ එළිපත්ත මත පය තබනවාත් සමගම රීතා හමුවෙතැයි ඔහු උදක් ම බලාපොරොත්තු විය. එහෙත් ඇඳුම් එල්ලා තබන කාමරයේ ලී ඇණය මත පිට කබාය එල්ලා තබා ඔහු කොරිඩෝවට පිවිසෙත් ම, රෝස පැහැ නාසය සහිත දිග් දණ්ඩා මඟ හරස් කැපුවේය. එක්වරම සංචෝට සිය වත ගිනි ගත්තාක් මෙන් දැනුණේය. පෙරදින හිම බෝල යළිත් සුදු පාට ගල් බවට පරිවර්තනය වූවාක් මෙනි. වහාම දිග් දණ්ඩා වෙතට පැන, ඊයේ අවසන් නොකළ ද්වන්ද්ව සටන යළි

ඇරඹීමට ඔහුට වුවමනා විය. එහෙත් ඔහු අමාරුවෙන් තමා පාලනය කර ගනිමින් වචනයෙන් වචනය මහත් කැළඹීමෙන් පිට කළේය.

"නුඹ... රීතාගෙන්... සමාව... ගත යුතුයි !"

"ආසා ඇතිනේ?" යි සටනට කැඳවමින් දිග් දණ්ඩා උපහාසයෙන් ඇද පැද කීවේය.

"ආසාවක් නැහැ !" සංචෝ කෑගැවේය.

"මහත්මයෙක්... මෙණෙවියකගෙන්..."

"මහත්තයා !"යි උපහාසයෙන් කොක් හඬලූ දිග් දණ්ඩා සිය අත්ලෙන් නාසය පිස දැම්මේය.

"නුඹ මහත්මයා... නරකයි... නුඹ මහත්මයෙක් නොවෙයි!" දිග් දණ්ඩා උමතු කරමින් සංචෝගේ වැකි ඔහු කරා පියඹා ආවේය.

"ඔන්න බලාපන් !"යැයි කී ඔහු සංචෝට මිට මෙලවූ අත පෙන්වූයේය.

"ඔන්න බලාපන්" යැයි එකට එක පිළිතුරු දුන් සංචෝ ස්වකීය තලඑළලු පැහැ කුඩා මිට මෙලවූ අත දිග් දණ්ඩාගේ නාසය ඉදිරිපිට වැනුවේය.

දිග් දණ්ඩා සංචෝව ඉවතට තල්ලු කළේය. එසැණින් ම සංචෝ දිග් දණ්ඩාව තරයේ අල්ලා ගත්තේය. ඔහු එය කොතරම් දක්ෂ ලෙස අසුරු සැණින් සිදු කළේ ද යත්, ඉන් ප්‍රතිවාදියාගේ සමබරතාවය බිඳ වැටුණෙන් බිම ඇද වැටිණි. දූන් කොල්ලන් දෙදෙනා බිම පෙරළෙමින් පොර බදන්නට වූයේ, පෙරදින මෙන් මුදු හිම මත නොව, තදැති ලී ගෙබිම මතය. දෙදෙනාම සිය ප්‍රතිවාදියා මැඩලමින් එකිනෙකා

මත නැගී සිටීමට වැර දැරුවෝය. දිග් දණ්ඩා බරින් සහ ශක්තියෙන් වැඩි විය. එහෙත් සංචෝ දක්ෂ ලෙස ඔහුගේ දෑත් අතරින් රිංගා ගියේය. සටනේ උච්චතම අවස්ථාවේ මාරියා පාව්ලොව්නා ඔවුන් ඉදිරියේ පෙනී නොසිටින්නට, ද්වන්ද්ව සටන කෙසේ අවසන් වෙත්දැයි සිතා ගන්නටවත් නොහැකි වනු ඇත.

"මොකද්ද මේ වැඩේ තේරුම?"

ඇගේ කටහඬ සටන්කාමීන්ගේ උද්යෝගය සිඳ දැමීමට සමත් විය. විමතියෙන් ඇය දෙස බැලූ ඔවුහු එකිනෙකා තරයේ ග්‍රහණය කරගත් දෑත් ලිහිල් කරමින් හනික නැගී සිටියෝය.

"සමාවෙන්න... මෙණෙවිය..."යි අමාරුවෙන් හතිලමින් සංචෝ කෙඳිරීය. අවුල් වී ගිය දුම්කොළ පැහැති කබාය ඔහු ඉක්මනින් සකසා ගත්තේය.

"මොකද්ද මේකේ තේරුම, අබ්‍රිකොස්?" යැයි දිග් දණ්ඩා වෙතට අවධානය යොමු කරමින් ගුරුතුමිය දැඩිව ප්‍රශ්න කළාය.

"ඇයි මගෙන් අහන්නේ ? එයා තමයි මුලින් ම..."

"මම තමයි - මුලින් ම" යි සංචෝ එකඟතාව පළ කරමින් කීවේය. "ඔහු මෙණෙවියට අරියාදු කළා... ඔහු සමාව ගත යුතුමයි" තර්ක කළ සංචෝ 'සමාව' යන වදන ලොකු බලයක් යොදා පැවසීය. "එහෙම නැත්නම් අපි නැවතත්..."

"රුධිරයෙන් පළිය ගන්නවා?" යි මාරියා මෙණෙවිය ප්‍රශ්න කළාය.

"රුධිරයෙන් පළිය ගන්නවා ?" යි සංචෝ මවිතයෙන් ගුරුතුමිය දෙස බැලුවේය. සැබවින් ම ඇය, සිය රටේ මධ්‍යකාලීන යුගයේ සිට පැවත එන එම චාරිත්‍රය ගැන කෙලෙස දැන ගත්තේදැයි සංචෝ මවිත විය.

"අපේ රටේ රුධිරයෙන් පළිගන්නේ නෑ සංචෝ" යි කී ගුරුතුමිය දයාබර බැල්මකින් සංචෝට සංග්‍රහ කළාය. "වඩාත් නවීන පිළිවෙළට ගැටුම් විසඳා ගැනීමයි වැදගත් වෙන්නේ"

සංචෝ හිස පහත් කර ගත්තේය. සීනුවේ හඬ කොරිඩෝව පුරා පැතිරිණි.

සෑම ඔරලෝසුවක් ම මිනිත්තු හැටකින් සමන්විත වෙයි. එහෙත් ඇතැම් ඔරලෝසුවක මිනිත්තු සියයක් හෝ ඊටත් වඩා තිබෙන්නට පුළුවන. එවැනි ඔරලෝසුවක කාලය කෙළවරක් නැති තරම් දීර්ඝය. දැන් සංචෝට ද හැඟෙන්නේ තමන් එවැනි හෝරා යන්ත්‍රයකට යටත් වී ඇති සැටියකි. තම පියා දිවැසින් දුටුවාක් මෙන්, විදුහල්පති දැන් දැන් තමා කැඳවනු ඇතැයි ඔහු බලා සිටියේය. ඒ අතර ඔහු හිසට වද දෙමින් ද්වන්ද්ව සටනින් තොරව වඩා නවීන ලෙසින් ගැටුම් විසඳා ගන්නේ කෙලෙස දැයි කල්පනා කරන්නට වූයේය. එකදු කොළ පැහැති තණ ගසක්වත් එකදු උණුසුම් වැලි ඇටයක්වත් නොමැති හිමෙන් පිරි ධවල රාජ්‍යයක තමා හුදෙකලා වූවාක් මෙන් ඔහුට හැඟුණේය.

කොහෙත් ම බලාපොරොත්තු නොවූ ආකාරයට එදින සැන්දෑවේ ඔහු රීතාගේ නිවසට ගොඩ වැදුණේ ය.

පාසල ඇරුණු පසු රීතා ඔහු සොයා ආවාය.

"මට නුඹට පෙන්වන්න දෙයක් තිබෙනවා. ඒ මොකද නුඹෙ සීයා යුද බිමේ මිය ගිය නිසා"

"මොකද්ද? නුඹ මට පෙන්වන්න හදන්නේ?"

"ඒ ගැන අහන්න එපා" යි රීතා කීවාය.

මග දිගට ම ඔහු නිහඬව සිටියේ, ඒ ගැන ප්‍රශ්න නොකරනු පිණිසය. එහෙත් සඳලුතල උරෙන් ගත් දිගු රැවුල්කාර ශෛලමය ප්‍රතිමා සහිත නිවස අබියසට පැමිණි කල ඔහු කටහඬ අවදි කළේය.

"මම මෙතන ඉන්නද?"

"යමු, යමු" බල කළ රීතා නිවසේ දොරටුව විවෘත කළාය.

නිවසේ විසිත්ත කාමරය තුළ එක් මුල්ලක ගෙබිම සිට සිවිලිම තෙක් උස්වුණු, ගුවන් යානයක දෙපෙති අවර පෙත්තක් සිටුවා තිබිණි. එහි දිළිසෙන ලෝහයෙහි කාළ වර්ණ පිළිස්සුම් පැල්ලම් ද, ඉහළ පෙත්තේ අග නැවී ගිය කොටසක් ද දක්නට ලැබිණි. අවර පෙත්ත අසලින් සාමාන්‍ය ගෘහමය උපකරණ තිබුණේය. ලීනන් මේස රෙද්දක් ඇතිරූ මේසය ද, කවර දැමූ පුටු ද, වීදුරු බඳුන් සහිත පිඟන් අල්මාරිය ද විසිත්ත කාමරය සැරසීය. පිඟන් අල්මාරිය මත ඇති වීදුරු බඳුන් ඕනෑම පා ගැටීමකදී සිහින් හඬක් නංවමින් කම්පනය වීමට සූදානමින් සිටියාක් මෙන් පෙනුණේය. හරියට ම ඒවා ද, සිවුරුහන් හඬ නගමින් ඉගිලී යන කාලතුවක්කු උණ්ඩ සහිත අනතුරුදායක පරිසරයක සිට එක්වරම මෙහි ප්‍රාදුර්භූත වූවාක් මෙනි.

"ඇල්ලුවට කමක් නැහැ" යි රීතා කීවාය.

සංචෝ පරෙස්සමෙන් අවර පෙත්තට අත දිගු කළේ, ඉන් අත පිළිස්සෙතැයි බිය වූවාක් මෙනි. එහෙත් ඔහුට ඉන් සිසිලක් ගෙන දුන්නේය.

"මේ මොකද්ද?" සංචෝ ප්‍රශ්නාන්විත බැල්මක් යෙහෙළිය වෙත යොමු කරමින් ඇසුවේය.

"මිය ගිය ගුවන් යානයක අවර පෙත්තක්"

"ගුවන් නියමුවාත් මිය ගියාද?"

"නැහැ... ඔහු ජීවතුන් අතර... ඒත් ගුවන් යානය විනාශ වුණා"

සංචෝ ඉමහත් චකිතයෙන් ගුවන් යානය දෙස බැලීය.

"යුද්ධෙදි?"

"නැහැ, පරීක්ෂණ පියාසැරියකදී... දැන් කාලේ යුද ගුවන් යානාවල අවර පෙති නැහැ" යි දැනමුතු ලෙසින් රීතා පැහැදිලි කළාය. "ඒක බොහොම කාලෙකට පෙර සිද්ධ වුණේ..."

අවර පෙත්තට නොදුරින් බිත්තිය මත එල්ලූ ඡායාරූපයක යුද ගුවන් නියමුවෙක් නිරූපණය විය. එම ගුවන් නියමුවා පුදුමාකාර ලෙස රීතාට සමාන විය. ආරක්ෂක නියමු හිස් වැස්මට යටින් නළලට වැටුණු හිස කෙස් රොද ද, අවධානයෙන් පිරි සරදම්කාරී දිදුලන දෑස ද රීතාගේ වැනිම විය.

"මේ එයාද?"

"එයා තමයි" දැරිය පිළිතුරු දුන්නාය.

සංචෝ යළිත් පරීක්ෂණ පියාසැරියේ දී විනාශ වූ ගුවන් යානයේ අවර පෙත්ත ස්පර්ශ කළේය. එහි ලෝහමය පෘෂ්ඨයේ සියුම් කම්පනයක් ඔහුගේ අතට දැනුණේය. ඒ පියාසැරියේ දී අවර පෙත්තෙන් කපා දැමූ සීත සුළං දහරාවේ සිසිලසත් සමගිනි...

****

රුධිරයෙන් පළිගන්නා පැරණි චාරිත්‍රයට පටහැනි වූ ශිෂ්‍ය රැස්වීම පසු දින පැවැත්විණි. එහිදී ගැටුමක් ඇති විය. පෙනෙන හැටියට ගැටලුව සාමාන්‍ය කොල්ලන් දෙදෙනෙකුගේ කලහයක ස්වභාවය ඉක්මවා ගිය සැටියකි. සෝවියට් දේශයේ ළමයෙක් විදේශීය බලවතකුගේ රට වැසියකුගේ නාසයට හානිකර ඇත. දහ වැනි පංතියේ ඉගැනුම ලබන ශිෂ්‍ය නායක රොමාන් පැන නැගී ඇති සියලු තත්ත්වයන් පිළිබඳ සවිස්තර වාර්තාවක් රැස්වීම හමුවේ ඉදිරිපත් කළේය. ඉන් කොතරම් කැළඹීමක් සභා ගැබ තුළ ඇති වී ද යත්, සබකෝලයෙන් පිරි නිහඬ අලීසා මහත් සේ සුදුමැලි වෙමින් මෙසේ ඇසුවාය.

"අපොයි, එහෙනම් දැන් ඉතින් යුද්ධයක් ඇති වේවිද?"

හානි වූ නාසය අරභයා දෙරට අතර යුද්ධයක් ඇති වීමේ අවදානම පිළිබඳව තක්සේරු කිරීමට ශිෂ්‍ය නායක රොමාන් හිස වෙහෙසවන්නට සූදානම් වෙත්ම, පෙර දින ජාත්‍යන්තර සංග්‍රාමයේ ප්‍රධාන චිත්තිකරු - අබ්‍රිකොස් නැගී සිටියේය.

"ඔහු තමයි මුලින් ම පොරයට ආවේ"

මුළු මහත් සභා ගැබ පුරාම දැඩි නිහඬතාවක් පැතිරී ගියේය.

"හොඳයි ඔහු පොරයට ආවේ මන්ද?" යි ශිෂ්‍ය නායකයා මහත් උනන්දුවෙන් අබ්‍රිකොස් දෙස බලමින් ප්‍රශ්න කළේය.

"ඒ මොකද? අබ්‍රිකොස් රීතාට හිම බෝලවලින් ගහපු නිසා" යි පළුදු වූ රාමුව සහිත උපැස් යුවළක් පැළඳ සිටි නොඋස් ෂූරික් පැමිණිලි කළේය.

"ඒත් ඔහුගෙන් කිසිම කෙනෙක් මැදිහත් වෙන්නයි කියා ඉල්ලා සිටියේ නැහැ නොවැ" යි අබ්‍රිකොස් අඳුරු වෙමින් නිදහසට කරුණු ගෙනහැර පෑවේය.

"කිසි කෙනෙක් ඉල්ලා සිටියේ නැහැ" යි පසු පෙළ බංකු පෙළෙන් හඬක් නැංවිණි.

එවිට රීතා තීරණාත්මක ලෙස නැගී සිටියාය.

"මමයි ඉල්ලා සිටියේ !"

සභා ගැබ පුරා මවිතය දනවන 'ෂූ' හඬක් පැතිර ගියේය.

"කොටින් ම කිවුවොත් ඔහු මගේ තොලත් පැළුවා. මෙන්න බලන්න" යි පැමිණිලි කළ අබ්‍රිකොස් සභාව දෙසට හැරී ඇඟිලිවලින් තොල ඇද පෙන්වීය. "කොල්ලනේ දක්කා නේද මම මොන තරම් අනතුරකට මුහුණ පෑවද කියලා..."

"නුඹ ඇයි ඔහුගෙන් ඉල්ලා සිටියේ?" යි ශිෂ්‍ය නායකයා රීතා දෙසට හැරෙමින් විමසීය. "අපේ අභ්‍යන්තර වැඩවලට විදේශිකයෙක් පටලවා ගැනීම නොකරන්නයි තිබුණේ..."

"ඔහු මගේ මිතුරා" යි රීතා දැඩිව කියා සිටියාය. "මිතුරා විදේශිකයෙක් ද නොවෙයි ද කියන එක වැදගත් නැහැ. ඔහුගේ පියා කෙසෙල් අලෙවි කරනවා. ඒ වුණාට මුදල් ලබාගන්නේ ධනපති කොම්පැනිය"

"ධනපති කෙසෙල් කොම්පැනිය හංග වේවා!" ෂූරික් කෑ ගැසීය.

"කෙසෙල් කොම්පැනිය සමග මෙතැන ඇති සම්බන්ධය කුමක්ද?" යි ශිෂ්‍ය නායක රොමාන් ව්‍යාකූල වෙමින් ප්‍රශ්න

කළේය. "විදේශික මිත්‍රයාගේ නාසයට හානි කිරීම - යටත් පිරිසෙයින් අන්තිම අශිෂ්ට ක්‍රියාවක් තේරුණාද?"

ශිෂ්‍ය නායක රොමාන් එසේ කියා කටගන්නටත් පෙර, එක්වරම පංති කාමරයේ දොරටුව විවර වී සංචෝ පෙනී සිටියේය.

"මම... සමාවෙන්න... මම දන්නවා... මට... මෙතන... නොහැකියි" ඔහු බෙහෙවින් කැළඹීමට පත් වූයේය. ඔහුට ඉක්මනින් සිය අදහස් කියාපෑමට වුවමනා වූ නමුදු, එකී කැළඹීම ඔහුට බාධා කළෙන් ගොත ගසන්නට විය. "මම කැමතියි කියන්න... මම... මම... ගතු කියන්නෙක් නෙමෙයි... මගේ නාසය... තිබිය යුතු තැන... යහතින් තියෙනවා"

මුළු මහත් සභාවේ සියල්ලෝ ම සිනාසුණෝය.

"සංචෝ නැවතියන්, අපි හැමෝම එකතුවෙලා මේ ගැටලුව විසඳා ගනිමු" යි ශිෂ්‍ය නායක රොමාන් සංචෝට ආරාධනා කළේය. "නුඹ කලබල වෙන්න එපා..."

"මහත්තුරු දෙන්නෙක් සටන් කළා නම් ඒ ඔවුන්ගේ ගෞරවය වෙනුවෙන්... එහි විසඳන්න දෙයක් නැහැ" යි සංචෝ පැවසීය.

පසුව ඔහු උද්යෝගයෙන් හිස එසවීය. ඔහුගේ දෙනෙත් සතුටින් බැබළිණි.

"මම හිතුවේ ඇත්තට ම ඒක සුදු පාට ගලක් කියලයි... සමාවෙන්න මට! කොල්ලනේ අපි දුවමු, බෝල සෙල්ලම් කරන්න, නැහැ වැරදුනා - හිම බෝල... මම ඔයාලා එනතුරු ප්‍රධාන දොරටුව ළඟ බලාගෙන ඉන්නවා"

හඬ නැගෙන සේ පන්ති කාමරයේ දොර වැසූ සංචෝ, පියගැට පෙළ දිගේ වේගයෙන් පහළට දිව ගියේ, පඩියක් හැර පඩියක් මග හැර පිම් පනිමිනි.

****

පාසලේ ප්‍රධාන දොරටුවෙන් සංචෝ වේගයෙන් එළියට දිව එත්ම, වීදියේ නවතා තිබූ කාර් රථය අසල නොඉවසිල්ලෙන් සුරුට්ටුවක් උරමින් බලා සිටි පියා දුටුවේය.

"මම මෙතැන නුඹ එනතුරු මිනිත්තු පහළොවකටත් වැඩියෙන් බලා ඉන්නවා !" යි පියා අසතුටින් කීවේය. "යමු !"

"මට බැහැනේ" යි සංචෝ පිළිතුරු දුන්නේ ය.

"මට හිම බෝල සෙල්ලම් කරන්න ඕන"

"හිම බෝල? අනේ හැබැටම මහ වැදගත් රාජකාරියක් නොවැ... වහාම කාරයට නැගපන්!"

"පා, ඒත් මම සහෝදරවරුන්ට පොරොන්දු වුණානේ..."

"සහෝදරවරුන්ට...?" යි විමතියෙන් ප්‍රශ්න කළ පියා සුරුට්ටුව අතට ගෙන මුවින් දුම් වලාවක් පිට කළේය. "අපේ දිහාට අද අමුත්තෙක්... මච්බිමෙන්- ක්රේදෝ මහත්මයා. අනෙක මම බලාපොරොත්තු වෙනවා, හෙට වන විට හිම දිය නොවේවි කියලා..." යි කී පියා අත් ඔරලෝසුව දෙස බලා නොඉවසිලිමත් විය. "අපි දැනටමත් පරක්කුයි. හොඳට මතක තියා ගනින්, කොම්පැනියෙන් නියෝජිතයෙක් පැමිණෙන විට, ඔහුට ගරු කිරීමක් ලෙස මුළු පවුලම එකට එකතු වෙලා සංග්‍රහ කළ යුතුයි... හැබැවටම නුඹට අපේ රටේ චාරිත්‍ර වාරිත්‍ර මේ ටිකට අමතක වුණාද?"

"ඒත් පා... මම පොරොන්දු වුණානේ..."

"කතා ඇති... කාරයට ගොඩ වනු !" යි පියා සැරෙන් නියෝග කළේය. එවිට සංචෝ අකමැත්තෙන් රථයේ දොර විවර කළේය.

රථයේ රෝද හිම මත 'කර-කර' හඬක් නංවමින් ඉක්මනින් පාලම පසුකර යත්ම, පාසලේ දොරටුව විවර වී ළමෝ වීදියට පැන්නෝය.

"කෝ නුඹේ සංචෝ ?" යි අබ්‍රිකොස් රීතාගෙන් ඇසුවේය.

"කෝ නුඹේ සංචෝ ?" ළමෝ දසතින් කෑගැවෝය. "කොහාටද මිනිහා චුත වුණේ?"

"මිනිහා මහ බය ගුල්ලෙක්!"කවුදෝ කෙනෙක් උපහාසයෙන් කීවේය.

"මහ ලොකුවට හිම සෙල්ලම් කරන්න අඬ ගහලා... බයේ පැනලා දුවලා!"යි අබ්‍රිකොස් සරදම් කළේය. "හා... හා... විදේශිකයා බය වෙලා"

"නැහැ" යි රීතා දැඩිව කීවාය. "එයා බයගුල්ලෙක් නෙවෙයි"

"එහෙනම් කෝ නුඹේ චණ්ඩියා? මොකෝ දන්නෑ උන්දැ පේන්න නැත්තේ" ළමෝ ඔච්චම් කළෝය. "බාගදා, මිනිහා හිම සෙල්ලම් නොවෙයි, හැංගිමුත්තම් කෙළිනවද දන්නේ නෑ? රීතා සොයපන් එයාව. නුඹට හමුවේවි"

"හා - හා සුදු පාට ගල්...!"

"එයා බයවෙන්නේ නැහැ!!" රීතා කෑගැවාය.

එහෙත් ළමුන්ට ඇයව නොඇසිණි. ඔවුන් එකිනෙකා තල්ලු කර ගනිමින් හිම බෝලවලින් ගසා ගනිමින්, මිදුණු අයිස් තට්ටු මත ලිස්සා යමින්, දනටමත් ඈතට ගමන් කර තිබුණේ, ඕනෑම පාසලක් අවසන් වන විට ඒ අවට සිදුවන පරිද්දෙනි.

එහෙත් රීතා සිටි තැනම නැවතී සිටියාය. ඇය සිය මිතුරා සංචෝ එනතෙක් බලා සිටියාය. ඔහුගේ පැමිණීම ඇය මුළු හදින් ම පැතුවාය.

4

මච්චිමෙන් ආ අමුත්තා කෙසෙල් කොම්පැනියේ අයිතිකරුවන්ගෙන් කෙනෙක් මෙන්ම අසාමාන්‍ය කඩිසර ජංගමශීලී බවකින් යුත් කුඩා තරබාරු පුද්ගලයෙක් විය. එක්කෝ තරබාරු බව නිසා හෝ, නැතිනම් තිමක් නැති දඟලීම නිසා හෝ ඔහුට සැම විටකම රස්නයක් දැනුණේය. ඒ නිසා සීත සෘතුවේ දී පවා ඔහුගේ නළල මත වීදුරු පබළු වැනි ඩා දිය බිඳු නිතර දක්නට ලැබිණි. කවාකාර කළු හිස කෙස්වලට මැදිව දිළිසෙන තට්ටය, රෝස පැහැ කුඩා දිය විලක් සිහිගැන්වීය. විටෙන් විට ඔහු අත්ලෙන් එය පිරිමදින්නට වූයේ, නොසිතූ විරූ ලෙස එක්වරම එම කුඩා දිය විලෙහි පන් ගස් මතුවෙතැයි බිය වූවාක් මෙනි. මචුබිමෙන් ආ ක්රේදෝ මහත්මයා විනෝදකාමී අයෙක් විය. ඔහුගේ දෙනෙත් පමණක් බැරෑරුම් දැඩි ස්වභාවයක් ගත්තේය. නිතර ඒ දෙනෙත් කතා සල්ලාපයේ යෙදෙන්නන් අවධානයෙන් අධ්‍යයනය කරන්නාක් මෙනි. අඩුම තරමින් ඔහුගේ වත

සිනාවෙන් සැරසුන විට පවා, අවට සිටින්නන් විනිවිදින්නට ඔහුගේ දැස් යුහුසුලු විය.

සංචෝලාගේ මුළු පවුලම දිවා ආහාර මේසයේ හිඳ සිටියෝය. මුළු මහත් පවුලේ ම අවධානය සහ සත්කාරය අමුත්තා වෙත යොමුව තිබුණේය. පෙනෙන හැටියට මවට සහ පියාට ආහාරවල රස ගුණ පවා නොවැටහුණු සෙයකි. ඔවුන් උනන්දු වූයේ, සිය අමුත්තාහට එම සංග්‍රහය රසවත් වූයේ ද, ඉන් ඔහු තෘප්තිමත් වූයේ ද යන්න ගැන පමණකි.

එහෙත් සංචෝ අමුත්තා ගැන නොසිතීය. ඔහුගේ සිතුවිලි යොමුව තිබුණේ, ඔහු විසින් හිම ක්‍රීඩාවට ආරාධනා කරන ලද ළමුන් පිළිබඳවය. ඇතැම් විට ඔවුන් ඔහු කටවාචාලයෙකැයි සිතනවා ඇතැයි සංචෝ දුක් විය. එහෙත් වඩාත් ම නරක දෙය - ඔවුන් ඔහු බියගුල්ලෙක් ලෙස සැලකුවහොත්?

අමුත්තා බඩ කට පුරා කා බී, සිය විනිවිදින ඇස් යොමුකොට මෙසේ පැවසීය.

"රුසියාවේ මිනිස්සු කෙසෙල්වලට බොහෝම කැමතියි. හොඳ වෙලාවට රුසියාවේ යෝල්කා ගස්වල යුෂ පිරුණු ප්‍රණීත එල නොදරන්නේ" යි කී ක්රේදෝ මහතා සිය නැබුළු සිරුර සංචෝ වෙත හරවමින් ප්‍රශ්න කළේය.

"ඒ ගැන නුඹේ අදහස කොහොමද?"

"දන්නේ නෑ" යි සංචෝ කීවේය. "රීතා නම් කැමති අඹ යුෂ පානයට"

"ඔන්න ආයෙත් පාරක් රීතා..." යි පියා කෑගැවේය.

"රීතා? කවුද? කවුද? මහත්මියක් ද? නැත්නම් මෙණෙවියක්

ද?"යි ප්‍රශ්න කළ අමුත්තා ඉදිකටු වැනි තියුණු ඇස්වලින් සංචෝ විනිවිදින්නට විය. "හැබැටම ඇය කවුද?"

"එයයි මමයි එක බංකුවේ ඉගෙන ගන්නේ" යි කොලුවා උත්තර දුන්නේය.

"නුඹ එයාලගේ ගෙදර එහෙමත් ගියාද? දෙමව්පියෝ එහෙමත් අඳුනගත්තාද? එයාගේ පියා මොනවද

කරන්නේ?" යි අමුත්තා අල ගිය මුල ගිය විස්තර අසන්නට වූයේය.

"එයාගේ තාත්තා යුද ගුවන් යානා පරීක්ෂා කරනවා" යි සංචෝ ආඩම්බරයෙන් කීවේය.

"හරි අපූරුයි නොවැ !"

"එයාලගේ කෑම කාමරයේ පිළිස්සුණු අවර පෙත්තක් පවා තබා තියෙනවා. ගුවන් යානය විනාශ වෙලා. ඒත් නියමුවා ජීවතුන් අතර..." යැයි කී සංචෝ වඩාත් විශ්වාසයෝග්‍ය ලෙස රීතාගේ වදන් පුනරුච්චාරණය කළේය. "දැන් කාලේ නවීන යුද ගුවන්යානාවල අවර පෙති නැහැ"

"ඕ... එහෙනම් දැන් නුඹ ගුවන් යානා විද්‍යාව විශ්ලේෂණය කරන්න තරම් දියුණු වෙලා!" යි අමුත්තා සිනා පාමින් සරදම් කළේය. එහෙත් ඔහුගේ තියුණු දෙනෙත් පමණක් පෙර ලෙස ම බැරෑරුම් ලෙස පැවතිණි. "සංචෝ, නුඹ කැමති නැද්ද ඒ මෙණෙවිය වඩාත් සමීපව ඇසුරු කරන්න? මං කිව්වේ ඇයට තෑග්ගක් දුන්නොත් නරකද? අඹ යුෂ ටින් එකක් - මොකද කියන්නේ?"

සංචෝ එම අදහසට එකඟ වෙමින් ආචාර කළේය.

"මම නුඹ නම් මේ වගේ වෙලාවක බොහොම නොඉවසිලිමත් වෙනවා" යි අමුත්තා පැවසීය.

"මම නොඉවසිල්ලෙන් තමයි!" සංචෝ දුක්වෙමින් කීවේය. "ඒත් පා මාව මෙහි ඇදගෙන ආවා. සංග්‍රහ කරන්න. රීතා ඉස්කෝලේ ළඟ මං එනතුරු බලාගෙන ඉන්නවා"

"එහෙනං අඹ යුෂ ටින් එකක් අරගනින්. දුවපන්!" යි අමුත්තා උඩ පනිමින් කීවේය. එක්වරම ඔහු නොසිතූ විරූ ලෙස සංචෝගේ හොඳම සගයා බවට පත් විය.

සංචෝ සිය මව සහ පියා දෙස ප්‍රශ්නාන්විත බැල්මක් හෙළුවේය. ඔවුන්ගේ දෑස් තුළ කරුණාවන්ත බවක් ගැබ් වී ඇති අයුරු දුටු ඔහු, වහා මේසයෙන් නැගිට නොඉවසිලිමත් ලෙසින් 'ස්තුතියි' කියා සැණින් දොර දෙසට පිම්මක් පැන්නේය.

****

පාසලේ ප්‍රධාන දොරටුව අසල ළමුන් හෝ රීතා හෝ දක්නට නොවීය. ගණකි ලොම් කැදලි වැනි හිම පියලි නගරයට ඉහළින් පියාසර කරමින් සෙමෙන් බිම පතිත විය. හිම පියලි දැනටමත් ළමුන්ගේ පා සටහන් මකා දමා තිබිණි. ඝෝෂාකාරී පාසල් ගොඩනැගිල්ල සීතලෙන් මිදී ගල් වූ සැටියකි. හරියට ම එය හෙට උදෑසන ළමුන් පැමිණෙන තෙක් ගැඹුරු නින්දකට වැටුණාක් මෙනි.

අඹ යුෂ පානය සහිත ටින් බඳුන හිම කබායට තදින් තෙරපාගත් සංචෝ පාසලෙන් ඉවතට පා නැගුවේය. තබන සෑම පියවරක් පාසාම ටින් බඳුන තුළින් 'ගුඩු - ගුඩු' ශබ්දයක් නැගුණේය. ඔහු පියවර නැගුවේ සිය නිවෙස දෙසට නොවේ. පෙර දින රීතා සමග ගමන් කළ මග දිගේ ඔහු පිය මැන්නේය.

හිමෙන් වැසුණු ධවල පැහැ මග දිගේ ඔහු දෙගිඩියාවෙන් ගමන් කළේ, ඉමහත් අවධානයෙන් මග දෙපස ගොඩනැගිලි, ප්‍රදර්ශන කවුළු හා කුඩා උද්‍යාන දෙස බැලුවේය. සැබෑ මාර්ගය සොයාගත් බව සැක හැරැ දැනගත් ඔහු දුවන්නට පටන් ගත්තේය. හිම වැටි සහ බාධක මත හැපෙමින් ඔහු වේගයෙන් දිව ගියේය. කබායට තෙරපී ඇති ටිං බඳුන 'ගුඩු -ගුඩු' හඬ නගන්නට වූයේ, ඔහුගේ හදවත ගැහෙන රිද්මය කියා පෑමට මෙනි.

අන්තිම වංගුවේ දී ලොම් කබායකින් සැරසීගත් නෙතට හුරු දැරියගේ හැඩරුව සංචෝගේ නෙතු ගැටිණි.

"රීතා" යි ඔහු කෑගැසුවේය. එහෙත් ඔහුගේ කටහඬ දැරියගේ සවනෙහි නොවැකිණි.

ඔහු වඩාත් වැඩි වේගයෙන් ඇය කරා දිව්වේය.

"රීතා"

දැරිය හැරී බැලුවා, නැවතුණාය. එවිට සංචෝ යන්තමින් ඇයගේ සිරුරෙහි නොවැදී නතර විය.

"රීතා මම බලාගෙන හිටියා... මාව අරගෙන ගියා..."

කැලඹීම සහ හතිලෑම නිසා ඔහු රුසියානු වචන පටලවා ගත්තේය. සයුරෙන් එතෙර මිතුරා කුමක් පවසන්නේදැයි යන්තමින්වත් වටහා ගැනීමට රීතා අපොහොසත් වූවාය.

"නුඹ බය වුණා ද?" ඇය එක්වරම ප්‍රශ්න නැගුවාය.

ඇගේ පැනයෙන් කොලුවා ගිනි ගෙන දැවුණේය.

"නැහැ !" ඔහු දැඩිව හිස වැනුවේය. "නැහැ"

"ඇත්ත කියන්න" යි දැරිය තදින් කියා සිටියාය. "මම කාටවත් කියන්නේ නැහැ"

සංචෝ රීතාගේ දෙනෙත් දෙස එක එල්ලේ බැලුවේය. ඔහුගේ වත වේදනාවෙන් මිරිකිණි.

"තාත්තා මාව කැඳවාගෙන ගියා... අමුත්තෙක්... කොම්පැනියෙන්..."

"කොල්ලෝ හිතුවේ නුඹ බයගුල්ලෙක් කියලා. නුඹ පෙන්විය යුතුයි..."

මඳ වේලාවක් ඔවුහු කළ යුත්තේ කුමක්දැයි නොදන හුන් තැනම ව්‍යාකූලත්වයෙන් සිට ගෙන සිටියෝය. ඔවුන්ගේ උරහිස් මත, හිස් වැසුම් මත මෙන් ම, හිම කබායට තෙරපුන ටිං බඳුන මත පවා හිම පියලි ගොඩගැසුණේය. තමා බියගුල්ලෙකු නොවන බව ඇයට කෙසේ පෙන්විය යුතු දැයි නොදන සංචෝ පීඩාකාරී ලෙස කල්පනාවක නිමග්නව සිටියේය.

දුම්රිය නගන බැරැණ්ඩි නළා හඬ ඈත සිට රැව් දුන්නේය. එම හඬ දැරියගේ අවධානයට බඳුන් නොවුවද, කොලුවාට එය වික්‍රමයකට කෙරෙන ආරාධනාවක් ලෙසින් හැඟුණේය. ඔහු දෙනෙත් ඔසවා රීතා දෙස බැලුවේය.

"යමු !"

"කොහේද?"

පිළිතුරු වෙනුවට ඔහු ඇගේ අත දැඩිව අල්ලා ගත්තේය. ඔහු කඩිනමින් ඇය කැටුව නළා හඬ පැතිරෙන දෙසට පා තැබුවේය.

රීතා කිහිප විටක් ම සිය අත නිදහස් කර ගැනීමට වැර දැරුවාය. එහෙත් කොලුවා ඇගේ අත දැඩිව මිරිකා ගෙන සිටියි. කුමක් හෝ අප්‍රකට ඉලක්කයක් වෙත ඔහු දැඩිව පා නැගුවේය. දැරිය ඔහුට කීකරු වෙමින් ඔහු පසපස ආවාය.

සුළං හැමීම වේගවත් විය. සුදු පැහැ හිම පොකුරු කුඩා වාසුළි සමග බමන්නට විය.

හනිකට ! හනිකට ! හනිකට! දුම්රිය මඟ දෙසින් පැන නගින නළා හඬ සුළඟ විසින් ඉක්මනින් ඔවුන් වෙත ගෙන එන ලදී. දැන් එම හඬ වඩාත් දැඩිව හා දීර්ඝ ලෙස ඇසෙන්නට වෙයි. දිව එන ළමුන් දෙදෙනා මුණ ගැසීමට ධවල දුම්රිය වේගයෙන් ඉදිරියට එන සැටියකි.

එක්වරම ඔවුන් දෙදෙනා ඉදිරියේ උසැති දුම්රිය වේල්ල මතු විය.

"මෙන්න" යි කී සංචෝ නැවතුණේය.

"දැන් මොකද වෙන්නේ?" යි රීතා ප්‍රශ්න කළාය.

"මෙන්න" යි යළිත් කී සංචෝ අඹ යුෂ සහිත ටිං බඳුන ඇය වෙත දිගු කළාය. "නුඹ අඹ යුෂ පානයට කැමති ද?"

"අඹ යුෂ සමග මෙතැනට ඇති සම්බන්ධය කුමක්ද?" යි සංචෝට කුමක් සිදු වී ඇත්දැයි වටහා ගත නොහැකිව රීතා ප්‍රශ්න කළාය.

පිළිතුරු දෙනු වෙනුවට ඔහු හතර ගාතෙන් බඩ ගා යමින් හිමෙන් පිරි දුම්රිය වේල්ලට ගොඩවන්නට පටන් ගත්තේය. උසැති වේල්ලෙන් ඔහු රූටා වැටුණ ද, යළිත් ඔහු ඉහළට බඩ ගෑවේය.

"මේ මොකද? කොහේද නුඹ යන්නේ?" රීතා ත්‍රාසයෙන් කෑගෑවාය. එහෙත් පිළිතුරු නොලැබිණි.

අන්තිමේදී සංචෝ අමාරුවෙන් දුම්රිය වේල්ල මතට ගොඩ විය. මොහොතක් බලා සිටි ඔහු දිළිසෙන ලේබලය සහිත අඹ යුෂ ටින් බඳුන දුම්රිය පීල්ල මත තැබුවේය.

"දුම්රිය එනතෙක් බලා ඉමු !" යි සංචෝ කෑගසා කීවේය. "මම පෙන්වන්නම්, මම බයගුල්ලෙක් නොවන විත්තිය. මම පෙන්වන්නම්..."

ඉතාමත් නොදුරු ස්ථානයකින් දුම්රිය එන්ජිමක නළාව නාද විය. දුම්රිය වේගයෙන් ඉදිරියට ඇදෙමින් තිබිණි. දුම්රිය පීල්ල මත සිටුවා තැබූ අඹ යුෂ ටිං බඳුන අසලින් සංචෝ සිට ගත්තේය.

කුඩා විදේශික කොලුවා කුමක් කිරීමට සැරසෙන්නේ ද? අධි වේගයෙන් ඉදිරියට ඇදෙන දුම්රියේ සහ අඹ යුෂ ටින් බඳුන අතර, සබඳතාව කුමක්ද? තවමත් පමා වැඩි නැත. වහාම ඔහු නවතාලිය යුතු නොවේද? වහාම ක්‍රියාත්මක වූ රීතා සිය පොත් මල්ල හිම මතට විසි කොට සංචෝ වෙත

හතර ගාතෙන් බඩගාන්නට වූවාය. උසැති දුම්රිය වේල්ලේ කොලුවා ගමන් ගත් මගෙහි හිම පිය ගැට පෙළක මෙන් සැකසී තිබූ බැවින් රීතා ඒ මග ඔස්සේ කඩිනමින් ඉහළට නැංගාය. එහෙත් ඇය සංචෝ වෙත ළංවත්ම දුම්රිය ඉතාම සමීපයට විත් තිබුණේය. එහි දීර්ඝ බැරෑණ්ඩි නළා හඬ කන් අඩි පුපුරුවා දමන්නට සැරසෙමින් හඬ දුන්නේය. මහ පොළොව භූමි කම්පාවකට හසු වූ විටෙක මෙන් කම්පනය විය.

"සංචෝ...!"

රීතා වහා කොලුවාගේ අතින් අල්ලා ඉවත අදින්නට වූවාය. එහෙත් ඔහු මහත් අකමැත්තෙන් ඇයට ප්‍රතිවිරෝධය දක්වමින් බිහිසුණු දුම්රියේ හඬ යටපත් කර දැමීමට වෑයම් කරමින් කෑගැවේය.

"නැහැ, නැහැ ! මම බයගුල්ලෙක් නෙවෙයි. නුඹ ඒ බව දැනගත යුතුයි. මම බයගුල්ලෙක් නොවෙයි"

දුම්රිය මුළු වැර යොදා නළාව හඬ නංවමින් බිහිසුණු ධ්වනි තරංගයෙන් පහර දුන්නේය. අධිබලැති යකඩයා අද්භූත සත්වයෙක් විලසින් ඔවුන් වෙත කඩාපැන්නේය. තවත් දරාගත නොහැකි වූ දැරිය ඉවත පැන්නාය. හරියට ම ඒ මොහොතේ, දුම්රිය එන්ජිමේ පළමු රෝදය අසලින් ම විදුලියක් සේ ටින් බඳුන ඉවතට ඇද ගැනීමට සංචෝ සමත් විය. සෝෂාකාරී, දුම්රියෙන් පියවර තුනක් ඉවතට විසි වී ගිය ඔහු හිම මත ඇද වැටුණේය. වටපිටාව කම්පනය විය. මහා ගිගිරුම් හඬ රැව් දුන්නේය. එහෙත් ලෝහමය රෝද දහස් ගණනක ගර්ජනය අතුරින් රීතාගේ සිහින් කටහඬ සංචෝට ඇසුණේය.

"නුඹ බයගුල්ලෙක් නොවෙයි, සංචෝ...!"

යෝධ සංගීත භාණ්ඩයක තත් මෙන් දුම්රිය පීලි නද දුන්නේය. දුම්රියෙහි රෝද අතරින් පැන නැගි ධවල හිම කුණාටුව බෙරයකට තඩි බාන්නා සේ හඬ නංවමින් කඩා වැදුණේය. එහෙත් ඒ සියලු බලගතු ඝෝෂාවන් අබිබවා දැරියගේ සිහින් කටහඬ රැව් දුන්නේය.

"නුඹ බයගුල්ලෙක් නොවෙයි... අනේ, නුඹ බයගුල්ලෙක් නොවෙයි..."

****

ඒ අතර පියා ක්රේදෝ මහතාට සමු දුන්නේය. පිටව යාමට සැරසෙමින් හිම කබාය පැලඳගත් අමුත්තා වඩාත් වටකුරුව පෙනුණේය. පුළුල් හිස් වැස්මට යටින් ඔහුගේ දෑස් ලෝහමය දිලිසීමකින් යුක්ත විය.

"රොද්රිගෙස් මහත්මයා, පතනවා ඔහේට සාර්ථකත්වය" යි මහත සීතල අත පියා වෙත පිරිනමමින් ඔහු කීවේය. "ඔබගේ ක්රියාකාරීත්වය මත තමයි අපේ කොම්පැනියේ සමෘද්ධිය රඳා පවතින්නේ"

"මගේ චාම් චරිතය ඔබ අතිශයෝක්තියෙන් වර්ණනා කරනවා නොවැ" යි පියා නිහතමානීව පිළිතුරු දුන්නේය.

"නැහැ, නැහැ. ඔබ මෙහි ගැඹුරටම මුල් ඇද ගන්න. ඉල්ලුම ගැන නිවැරදිව ඉගෙන ගන්න. ව්යාපාරිකයෙක් සඳහා ඉතාමත් වැදගත් දෙය අවස්ථාව පැහැර නොහැරීමයි... හොඳයි, ළඟදීම දවසක මම නැවත ඔබ හමුවීමට පැමිණෙන්නම්."

අමුත්තා පිටව ගිය පසු පියා දොර වසා දැම්මේය. අම්මා මේසය වෙත හැරී විත් අස්පස් කරන්නට පටන් ගත්තාය.

හැර දමන ලද වා කවුළුවෙන් සැහැල්ලු හිම වාෂ්පයක් පිට විය.

"ඔයා හැබැවටම දුටුවේ නැද්ද? අපේ අමුත්තාගේ පුදුමාකාර ඇස් දෙක?" යි අම්මා විමසුවාය.

"එයාගේ ඇස්වලින් ඇති වැඩේ මොකද්ද?" යි පියා උරහිස් වනමින් කීවේය. "කිසිම තේරුමක් නැහැ"

සීනුව නාද විය.

"ඒ සංචෝ !" කී අම්මා යුහුසුලුව දොරටුව වෙත ගියාය.

තිවුණු සුරුට්ටුව අතින් ගෙන වා කවුළුව අසල සිටගෙන සිටි පියා මව පුතුගෙන් ප්‍රශ්න කරන සැටි අසා සිටියේය.

"අපොයි නුඹට මක් වුණාද? නුඹ එහෙම පිටින් ම අවුල් වෙලා. මුළු සරුවාංගෙම හිම පිරිලා. නුඹ මොකද කළේ?"

"මම හිම බෝල සෙල්ලම් කළා" යි සංචෝ ගොත ගසමින් කීවේය. "ඒක ඉතා ම නිර්භීත කොල්ලෝ විතරක් කරන ජාතියේ සෙල්ලමක්"

"නුඹට ඇති වෙන්ට වැදුණ ද?"

"හොඳ ගාණට... මම වෙඩිල්ලකටවත් බය ඇති මිනිහෙක් නොවෙයි!"

"ඉක්මනින් ඇඳුම් මාරු කරගෙන උණු වතුර නා ගන්න. නුඹ සීතලට ගල් ගැහිලා... ඉක්මනින් උණුසුම් වෙයන්. නුඹට කෑම ඕනද?"

"එපා, මා"

"අඹ යුෂවලට රීතා කැමති වුණාද?"

"බොහොම කැමති වුණා."

"නුඹේ කකුල් දෙක හොඳටෝම තෙත බරි වෙලා... සංචෝ වහාම ඇඳුම් මාරු කර ගනින්"

නිහඬ හිම රාත්‍රිය නගරයට ඉහළින් අරක් ගත්තේය. පාරේ රථවාහන ගමනාගමනය අඩු විය. සීතලෙන් මිදුණු බස් රථ ගාල් තුළ නිශ්චල විය. වීදියේ මගීහු අතුරුදහන් වූහ. මුළු මහත් නගරය ම හිස සිට දෙපතුල තෙක් ධවල කම්බිලියක් පොරවා ගෙන නින්දට වැටුණාක් මෙනි.

එහෙත් එක් වීදියක හිම ශුද්ධ කරන රථය පමණක් සෙමෙන් ඉදිරියට ඇදුණේය. එය විසල් ඉස්කෝප්පයකින් ඉදිරියේ ඇති හිම කපාගෙන ගමන් කරයි. ඉස්කෝප්පය මත ගොඩ ගැසෙන සුදු පාට හිම ඇත මුහුදේ ධවල පෙණ ඇති දිය රැලි සිහිගන්වමින් නර්තනයක යෙදුණේය. සෑම දිසාවකින් ම ධවල හිම විසින් වටලන ලද යන්ත්‍රය පණැති අද්භූත සත්ත්වයෙකු මෙන් දිස් විය. එම සත්ත්වයා ගැඹුරු ලෙස හුස්ම ගනිමින් නිද්‍රෝපගත නගරය පුරා සෙමෙන් බඩගා ගියේය.

සංචෝට එම රාත්‍රිය චකිතයෙන් පිරි එකක් විය. ඔහු ඇඳ ඇතිරිලි මත පෙරළෙමින් සිට එක්වරම යටි උගුරෙන් කෑ ගා, යළි නිසොල්මන් විය. තමා දුම්රිය පීල්ල මත සිටගෙන සිටින අයුරු ද වේගයෙන් දුම්රිය තමා වෙත පියඹා එන සැටි ද ඔහු සිහිනෙන් දුටුවේය. නැත ඒ දුම්රිය නොවේ ! අති විශාල හිම බෝලයකි. ඒ ඔහු විසින් පෙර දින පාසල අසල දී සුදු පාට ගලක් යැයි වරදවා වටහාගත් හිම බෝලයයි. දැන් ඒ ධවල හිම බෝලය කන් බිහිරි කරවන මහා නළා හඬක්

නංවමින් අධි වේගයෙන් කෙළින් ම ඔහු කරා ඇදී එන්නේ අඹ යුෂ පානය සහිත ටින් බඳුන පමණක් නොව ඔහු ද යටකර දැමීමට සැරසෙමිනි. දැවැන්ත හිම බෝලය එන්න එන්න ම ප්‍රමාණයෙන් විශාල වූයේය. කන් බිහිරි කරවන මහා ඝෝෂාව තවත් වැඩි විය. එහෙත් සංචෝ දුම්රිය පීල්ල මත නිර්භීත ලෙස සිටගෙන හිම බෝලයට කෑගැවේය.

"මම බයගුල්ලෙක් නොවෙයි!"

එම කෑ ගැම සිහිනයෙන් එළියට පැන්නේය. ඒ ඇසුණු අම්මා හීන් සැරේ ඔහුගේ කාමරයට ඇතුළු වූවා, ඇඳෙහි ගැට්ටේ හිඳ ගත්තාය.

"මම බයගුල්ලෙක් නෙවෙයි !" සංචෝ යළිත් සිහිනයෙන් කෑගැවේය.

"ඔයා බයගුල්ලෙක් නෙවෙයි, සංචෝ" යි අම්මා සෙමෙන් කීවාය.

අගේ කටහඬ සිහිනයට ඇතුළු විය. එසැණින් ම, යෝධ හිම බෝලය සුණු විසුණු විය. සංචෝ දෙනෙත් හැරියේය.

"ඔයා මොනවද සිහිනෙන් දුටුවේ මගේ පුතේ?"

"මට හීනෙන් පෙනුනා, සුදු පාට දුම්රියක්" යැයි සංචෝ රහසින් කෙඳිරිය. "ඒත් මම ඒකට ඇබිත්තක්වත් බය වුණේ නැහැ !"

"නුඹේ පපුව මොන තරම් සද්දෙට ගැහෙනවද?"

සංචෝ සවන් දුන්නේය. ඔට්ටු දිවීමෙන් පසුව හදවත වැරෙන් ගැහෙන්නාක් මෙන් සිය පපුව හඬ නගන සැටි ඔහුට ඇසුණේය.

ඇතැම් විට ඒ හඬින් අම්මා අවදි වූවා විය හැකිය.

"පුතේ අනික් පැත්තට හැරිලා නිදියපං" යැයි අම්මා කාරුණික හඬකින් මිමිණුවාය. "මොනවා හරි හොඳ දෙයක් ගැන හිතන්න පුතේ..."

"මොනවා ගැන ද, මා?"

"මතකද අපි දවසක් මුහුදේ ඉස්සෝ අල්ලන්න ගිය හැටි. එදා ඩොල්ෆින් මාළුවෙක් අපේ ගාවට පීනගෙන ආවා. නුඹ වැරදිලා කෑ ගැහුවා. 'මෙන්න තල්මහෙක් ආවෝ' කියලා. ඒත් ඩොල්ෆින් මුහුදු රැලි සමග කරණම් ගැහුවා. හරියට නිහඬ නළුවෙක් වගේ. මතක ද, එයා නුඹට සෙල්ලම් කරන්න අඬගහපු හැටි?"

සංචෝ කිසිත් පිළිතුරු නොදුන්නේය. ඔහු දැනටමත් නිදි දෙව් දුව තුරුලට වැදී සිටියේය. ඇතැම් විට ඔහු අම්මාගේ කතාන්දරය තුළට වැදී සිහින දකිනවා විය හැකිය.

****

එදින රාත්‍රියේ චකිතයෙන් නිදාගත්තේ සංචෝ පමණක් නොවේ. පාන් සාප්පුවට යාබද සුවිසල් නිවසේ තෙවැනි මහලේ නිදා සිටි රීතා ද සංචෝ දුටුවාක් වැනි ම සිහිනයක් දුටුවේය. අඹ යුෂ පානය සහිත ටිං බඳුන අතින් ගත් සංචෝ දුම්රිය මගෙහි සිටගෙන සිටියේය. ඔහු කරා ධවල පැහැ දුම්රියක් වේගයෙන් ඇදී ආවේය. දුම්රිය වඩ වඩාත් සමීපයට පැමිණිය ද, සංචෝ නිර්භීත රණ ශූරයෙකු විලසින් දුම්රිය මාර්ගයේ සිටගෙන සිටියි. ඔහු පමා වන්නේ මන්ද? සෙලවීමට නොහැකි ලෙස ඔහු ගල් ගැසිලා ද? සැබවින් ම මේ පුදුම කොලුවා ධවලමය යකඩ රෝදවලට බිය නොවන්නේ ද?

තවත් රීතාට දරාගෙන සිටීමට නොහැකි වූයෙන් ඇය කෑ ගැසුවාය.

"අඹ...!"

එම වචනය යුද්ධමය විධානයක් මෙනි. කොලුවා අත දිගහැර අඹ යුෂ ටින් බඳුනෙන් ඉදිරියට එන දුම්රියට දමා ගැසුවේය. ටින් බඳුන එක්වරම අත් බෝම්බයක් බවට පරිවර්තනය විය. එය මහ හඬින් පුපුරා ගියෙන් ධවල දුම්රිය වේල්ලට ඉහළින් විසි වී ගියේය.

"අඹ" යි දැරිය සැහැල්ලුවෙන් කෙඳිරිය.

එවිට ඇය අසල මව පෙනී සිටියාය.

"අඹ?" යැයි ඇය විමසුවාය. "නුඹට අඹ ඕනෑද?"

දැරිය දෙනෙත් හැර, නොවැටහෙන බැල්මකින් මව දෙස බැලුවාය.

"එයා බයගුල්ලෙක් නෙවෙයි !" කී රීතා යළිත් නින්දට වැටුණාය.

****

හිම ඉවත් කරන ධවල රථය දියෙන් ගොඩට ආ අයිස් කපන නෞකාවක් මෙන් නගරය හරහා යාත්‍රා කළේය. හිම මිදුණු උතුරු දිග සාගරයේ මෙන් ම මෙහි ගොඩබිම මත ද උසැති අයිස් කඳු නෞකාව ඉදිරියේ මතු විය.

ඉතාමත් කලාතුරකින් නෞකා ගොඩබිමේ යාත්‍රා කරති. එමෙන් ම එකිනෙකාට වෙනස් පුද්ගලයන් දෙදෙනෙක් එකම සිහිනය එක විට දැකීම ද ඊටත් වඩා කලාතුරකින් සිදුවන්නකි.

5

පාඩම ආරම්භ වීමට පෙර සිසුවෝ පංති කාමරයේ හිඳ සිටියෝය. ඔවුන් නිකම් එහි හිඳ සිටියා නොවේ. ඔවුන්ගේ දෙපා පවා සැප පහසු ලෙස බංකු මත විය. පළුදු වූ රාමුවක් සහිත උපැස් යුවළක් පැලඳ සිටි ෂූරික් සිය දෙගා නම් සුනඛයා ගැන විස්තර කළේය.

"මම ඊයේ දෙගාත් එක්ක ලීෂි[1] පැද්දා... ඌ බොහෝම අපූරුවට මාව හිම මත ඇදගෙන දිව්වා. හරියට සුළඟ වගේ. මගේ හිම තොප්පියත් ගැලවිලා ගියා. ඒ නිසා ආපහු හැරිලා එන්නත් සිද්ධ වුණා..."

"පල්හෑලි දොඩවනවා"යි අබ්‍රිකොස් සිය අත්ලෙන් නාසය පිස දමමින් කීවේය. "නුඹේ දෙගාට කොහොමටවත් බැහැ"

"මොකද බැරි ? මම ඉතින් පැද්දනේ..."

"අපොයි, හීනෙන් වෙන්ට ඇති !" යි සරදම් කළ අබ්‍රිකොස් සිය මතයේ ම පිහිටියේය. "මෙයා හීනෙන් තමයි පැදලා තියෙන්නේ...?"

"අනේ නුඹ අබ්‍රිකොස්, කවදාවත් කිසි දෙයක් විශ්වාස කරන ජාතියේ මිනිහෙක් නොවෙයි නොවැ" යි රීතා තරහින් කීවාය.

"ඇස් දෙක විතරයි විශ්වාස. මගේ උරහිස මත ඔළු ගෙඩියක් කියලා දෙයක් තියෙනවා. ඔන්න හිම යානා අදින

1 ලීෂි - හිම මත වේගයෙන් ලිස්සා යාම සඳහා දිගැති පටි දෙකක් දෙපයට සවි කොට සිදුකරන ක්‍රීඩාව

බල්ලන්ට නම් ඒ වගේ දෙයක් කරන්න පුළුවනි. දෙගා - ඌ මොකාද? හිම යානා අදින බල්ලෙක් යැ?"

"ඌ නියම එඬේර බල්ලෙක්!" යැයි ෂුරික් කීවේය. "එඬේර බල්ලන්ට ඕනම දෙයක් කරන්න ඇහැකි. ප්‍රධාන දේ නිවැරදිව ඉගැන්වීමයි."

සංචෝ මහත් වුවමනාවෙන් හා සතුටින් ළමුන්ගේ කතාවට සවන් දී සිටියේය. එහි සියලු වචන තේරුම් ගැනීමට ඔහු අපොහොසත් වුවද, සමස්තය ඔහුට හොඳින් වැටහිණි. එක්වරම අසුනින් නැගී සිටි සංචෝ කළු ලෑල්ල අසලට දිව ගියේය. රට හුනු කැබැල්ල අතට ගත් ඔහු සරුංගලයක් අඳින්නට පටන් ගත්තේය. එය ලී කෝටු දෙකකින් සෑදූ කතිර හැඩයේ සාමාන්‍ය සරුංගලයක් නොවීය. විසල් ශරීරයක්, තුනී පියාපත් සහ වලිගයක් කළු ලෑල්ල මත සිත්තම් විය. එය ලොකු ඇස් සහ හොම්බක් සහිත ප්‍රාග් ඓතිහාසික අද්භූත පියාඹන සත්ත්වයෙකු සිහි කැඳවීය.

"මොකාද මේ බහු බූතයා?" යි අබ්‍රිකොස් ප්‍රශ්න කළේය.

"සරුංගලයක්!"යැයි සංචෝ පිළිතුරු දුන්නේය.

"බල්ලාගෙන් පුළුවන් දේ, සරුංගලයෙනුත් පුළුවනි"

ළමයි සැණින් ඔහු වටකරගත්හ.

"සරුංගලයෙන්? ලීෂී පදින්න?" අබ්‍රිකොස් උපහාසයෙන් විමසීය.

"ඔව්, ඔව්... මම දැකලා තියෙනවා. වෙනසකට තිබුණේ... ඒ ජලය මත... අපේ රටේ හිම නැහැනේ"

"ප්‍රලාප !" යි අබ්‍රිකොස් තරහින් කීවේය.

එම වදන වටහා ගැනීමට අපොහොසත් වූ සංචෝ ඔහු දෙස බැලුවේය.

"මොකද්ද ඒ... ප්‍රලාප?"

"හරියට හරි... ජලය මත පුළුවන් නම්, හිම මතත් පුළුවනි" යි 'ප්‍රලාප' යන වදනේ තේරුම පැහැදිලි කර දීමට අබ්‍රිකොස් හට ඉඩ නොදෙමින් ෂූරික් මැද්දට පැන්නේය.

"ඕන නම් සරුංගලයෙන් පියාඹන්න වුණත් පුළුවනි!" යි ෂූරික්ගේ සහයෝගයෙන් ප්‍රාණවත් වූ සංචෝ පැවැසීය. "ඒත් මුලින් ම හිම මත..."

"මුලින් ම හිම මත !"යි ෂූරික් සනාථ කළේය.

ළමුන් කොතරම් සරුංගලය පිළිබඳව උනන්දු වූයේද යත්, සීනුව නාද වන හඬ හෝ මාරියා පාව්ලොව්නා පංති කාමරයට පිවිසි අයුරු හෝ කිසිවෙකුගේ අවධානයට බඳුන් නොවීය.

"මේ මොකෙක්ද?" මකරෙක් ද?

"සරුංගලයක්" යැයි පිළිතුරු දුන් සංචෝ ඒ පැනය නැගුවේ ළමුන් අතරින් කෙනෙකු නොව පංතියේ ගුරුතුමී බව පසුව වටහා ගත්තේය.

"අපි ඒක හදනවා... පසුව පදිනවා... හිම මත ලීෂී ! ඔබත් අප සමග එනවද? මාරියා පාව්ලොව්නා?"

කළු ලෑල්ල මත සිත්තම් කර ඇති අද්භූත ජනක සරුංගලය දෙස මඳ වේලාවක් මාරියා පාව්ලොව්නා කුතුහලයෙන් බලා සිටියාය. පසුව ඇය මෙසේ කීවාය.

"මම නුඹ සමඟ එනවමයි සංචෝ ! ඒත් නුඹ දන්නවාද ලීෂී පදින්න?"

"එයා ඉගෙන ගනීවි" යි සංචෝ වෙනුවට රීතා පිළිතුරු දුන්නාය.

"ඉගෙන ගන්නවා - ගන්නවාමයි!" සංචෝ තිර කොටම කියා සිටියේය.

"හොඳයි... එහෙත් නුඹේ සරුංගලය මකා දමන්න සිද්ධ වෙනවා. නැතිනම් එයා අපේ ව්‍යාකරණ පාඩමට බාධා කරාවි..."

පාඩම ආරම්භ විය.

****

හිරු ඇස් අන්ධකාරවන තරම් දීප්තිමත්ව බැබළිණි. සංචෝ ඉන් ඉමහත් මවිතයට පත් විය. සිය රටේ දී නම් හිරු එලෙස පායා ඇති විට, මිනිසුන් සැඩ හිරු රැසින් සැඟවීමට සෙවණ ඇති තැන් කරා දිව යති. එහෙත් මෙහි ධවල හිම භූමියෙහි හිරු කොතරම් සැරෙන් සිය රශ්මි කදම්භය විහිදුවාලුවද, කිසි උණුසුමක් නොදැනෙයි. ඒ වෙනුවට ඇත්තේ ඉසිලිය නොහැකි දැඩි සීතලකි... හිම දියවී නොයයි...

එහෙත් සංචෝට සීතල නොදැනිණි. මන්දයත්, හිරු රැස් වෙනුවට ලීෂී පටි ඔහුව උණුසුම් කළ බැවිනි. රීතා පෙරමුණේ ගමන් කළාය. සංචෝ ඇය පසුපස ලීෂී මත ලිස්සා ගියේය.

හිම මත ලිස්සා යාම ඔහුට එතරම් පහසු වූයේ නැත. සෑම විටකම ඔහුගේ සමබරතාව නැති වී ගියේය. නොසන්සුන්තාවය නිසා ඔහුට විඩා නොදැනිණි. එමෙන් ම සිය මව්බිමේ උසැති කඳු ශිඛර මත විහිදුණු හිම සහ සදාහරිත වර්ණයෙන් බබළන නිම්න භූමි ඔහුගේ මනස ඉදිරිපිට මැවී පෙනුණේය. සිතින් මවාගත් ධවල හිම

සාගරයක ඔහු විශාල සරුංගලයක එල්ලී ලීෂී පටි මත වේගයෙන් ධාවනය කළේය... සිහින දකින්නට වූ සංචෝ පැය පැකිලී ගියෙන් සමබරතාව බිඳී බිම ඇද වැටුණේය.

"මේ පැත්ත බලන්න විතරක් එපා !"යි සංචෝ රීතාට කෑගැවේ, ඔහුට සිදු වූ නින්දාව ඇය දකිතැයි බිය වූ හෙයිනි.

රීතා නැවතුණාය. ඒ අතර සංචෝ එකිනෙක පැටලුණු දිගැති ලීෂී පටි ඇද ගනිමින් හනික නැගී සිටීමට වෑයම් කළේය.

"ඉක්මන් වෙන්න එපා! ශරීරය ටිකක් ඉදිරියට බර කර ගන්න" යි රීතා කෑගසා උපදෙස් දුන්නාය.

ඒ මොහොතේ සංචෝ ඇදහිය නොහැකි තරම් අතිමහත් ශක්තියකින් හිම මත කිඳා බැස තිබූ ලීෂී පටිය එළියට ඇද ගත්තේය. අන්තිමේදී ඔහු දෙපා මත සිට ගැනීමට සමත් විය. අත්දැකීම් රහිත නුහුරු පාද නවා ඔහු පියවරක් ඉදිරියට ලිස්සා ගියේය.

දුරිය බලා සිටියාය. සංචෝ ඇය අසලට විත් නැවතුණේය.

"ඇත්තට ම නුඹ ඒ සරුංගලය හදනවද?" ඇය ඇසුවාය.

"මම ඒක දැනටමත් හදන්න පටන් අරගෙන! ෂූරික්... මට උදව් වෙනවා... මම නොවැටී පදින්නට පුරුදු වෙනවාමයි... යමු ! හැබැයි මේ පැත්ත බලන්න විතරක් එපා !"

****

සංචෝගේ කාමරය සැබෑ වඩු මඩුවක සිරිය ගත්තේය. විවිධාකාර කෝටු කැබලි, කඩදාසි මිටි සහ මැලියම් බඳුන් එහි පිරී තිබුණේය. ගෙබිම මත කම්බි කෑලි සහ කැරලි ගැසුණු ලී පොතු විසිරී තිබිණි. කාමරය මැද රහසිගත නිර්මාණයේ සැකිල්ල තබා තිබුණේය. සංචෝ සිය සරුංගලය හදමින් සිටියි. එය නොවරදවාම නොදුරු දවසක හිම සාගරය මත ඔහුව ඇදගෙන යා යුතුයි.

"මේ වැඩේ කවදද ඉවරයක් වෙන්නේ?" යි අම්මා ප්‍රශ්න කළාය. "ආයෙත් පාරක් නුඹ කුස්සියේ පිහිය අරගෙන නොවැ !"

"ඔයා ළඟ හීනි කම්බි එහෙම නැද්ද?"

"මට කොහෙන් ද කම්බි? අපොයි දෙවියනේ ! මුළු පොළොවම මැලියම් හලලා නොවැ. නුඹ ඔය පාඩම් වැඩ ඉවර කරලද නටන්නේ?"

සීනුව නාද වී ෂූරික් පෙනී සිටියේය. ඔහු සාක්කුව තුළින් පන්දුවක් එළියට ගත්තේය.

"සංචෝ ඔන්න අල්ල ගනින්! නූල් පන්දුවක් !"

"මේක ඔරොත්තු දේවිද?"

"නියම කැප්රොන් නූල් !"යි ෂූරික් ස්ථිරසාර හඬකින් පැවසුවේ, ඕනෑම බරකට එය ඔරොත්තු දෙනු ඇතැයි සහතික කිරීමට මෙනි.

කොල්ලන් දෙදෙනා වශී වූවාක් මෙන් සරුංගලය වටා සක්මන් කරන්නට වූහ.

"නුඹේ බල්ලව පුහුණු කරනවද?" යි සංචෝ එක්වරම පැනයක් නැගීය.

"පුහුණු කරනවා" යි කී ෂූරික් උපැස් යුවළ සකසා ගත්තේය. "මම එයාව පුහුණු කරනවා ඉව පසුපස ලුහුබඳින්න... ඉස්කෝලේ ගිහින් ඉවර වුණ හැටියෙම මම දේශ සීමා ආරක්ෂක හමුදාවට බැඳෙනවා."

"ඕ... නුඹ ඔත්තුකාරයෝ අල්ලනවද?" උද්දාමයෙන් කෑගැසූ සංචෝ උඩ පැන්නේය. "ඒක බොහොම සිත් ගන්නා සුලු වැඩක් නොවැ... මම ඒක චිත්‍රපටයක දුටුවා... භයානකයි !"

"මිතුරා ළඟ සිටින විට බය දැනෙන්නේ නැහැ!" යි ෂූරික් කීවේය. "දෙගා මගේ මිතුරා !"

"එයාට පැටව් ලැබේවිද?"

"ලැබේවි, මම නුඹට එකෙක් තෑගි දෙන්නම්. සංචෝ"

"මමත්... වෙනවා... "යි සිය අභිලාසය පැවසීමට සංචෝ සැරසුණ ද, පෙනෙන සැටියට එක් අදහසක් අනෙකාට බාධා කළ සැටියකි. "බල්ලෙකුට... හැකිද ගුවන් නියමුවෙකුගේ මිතුරෙක් වෙන්න?"

"හැකියි !" ෂූරික් විශ්වාසයෙන් තහවුරු කළේය.

"හැකියි" සංචෝ තමන්ට ම රහසින් කියා ගත්තේය. එවිට තමන් කිමිදුම් ඇඳුමකට සමාන ගුවන් නියමු ඇඳුමකින් සැරසී සිටින අයුරු ඔහු මනසින් දුටුවේය. ඔහු උදාර ලීලාවෙන්, පිටුපසට නැවුණු රිදී පැහැ පියාපත් සහිත ගුවන් යානයක් වෙත යමින් සිටියේය. ඔහු සමග, ඔහුගේ වම් පසින් පාදය අසලින් ම කළු පැහැති කටකලියාවක් සහිත ලොකු එඬේර බල්ලෙක් දිව යයි...

"නොවරදවාම මට එකෙක් තැගි දීපන්... බලු පැටියෙක්" කී සංචෝ සිය මිතුරාගේ දෙනෙත් දෙස බැලුවේය.

කොළ අලවා අවසන් කළ සරුංගලය ගෙබිමෙන් ඉහළට එස වූ සංචෝ සතුටින් කෑ ගැවේය.

"අපේ සමාගමට ජය වේවා"

"මොන සමාගම ද?" යි ෂූරික් විමතියෙන් ඇසීය.

"සරුංගල් සමාගම! ආ ඒක නෙමේ - නුඹේ පියා මොන සමාගමේ ද වැඩ කරන්නේ?"

"මගේ පියා නැහැ" ෂූරික් අඩ ස්වරයෙන් පිළිවදන් දුන්නේය. "ඔහු උතුරු දිග මුහුදේදී මිය ගියා."

මඳ වේලාවක් කොල්ලෝ දෙදෙනා නිහඬව වැඩ කළහ. සනැති කඩදාසි කොළ ඔවුන්ගේ දෑතට හසුව 'සර - සර' ගෑවේය. නාසය කුප්පන කටුක මැලියම් පුසුඹින් කාමරය පිරී පැවතිණි.

"සමාවෙයන් යාළුවේ... නුඹේ පියා මිය ගියේ කොහොමද?" යි සංචෝ සිත තුළ කැකෑරුණු පැනය මුවගට නගා ගත්තේය.

"එයා මහ මුහුද මැදදි ස්වීඩන් රටේ ධීවරයන්ව බේරාගත්තා. ධීවරයන්ගේ ජීවිත බේරුණා... ඒත් පියා රැල්ලේ ගහගෙන ගියා..."

"එහෙනම් එයා ස්වීඩන් රටේ ධීවරයින්ව බේරාගත්තා..." යි සෙමෙන් කී සංචෝ සිය සොහොයුරාගේ අත තදින් මිරිකා ගත්තේය.

****

සරුංගලය සූදානම් ! එය කාමරයෙන් හරි අඩක් ම ආක්‍රමණය කර සිටියේය. එපමණක් ද - එය සිය ස්වාමියාට ද තදින් ඇලී සිටියේය. කාමරයේ වා කවුළුව හරින විට එය සර - සර හඬ නැංවෙමින් යන්තමින් සෙලවුණේය. මඳනලින් එය ජීවය ලැබුවාක් මෙනි. සුළඟ ඔහුගේ ජීවමාන පරිසරයයි.

සංචෝ සිය ගුවන් සගයාව කහපාටින් පාට කළේය. කොළ පැහැති විශාල දෙනෙත් සහ ගිනි පිඹින හකු පාඩා ඇන්දේය. එහි තුනී පියාපත් වවුලකුගේ තටු මෙන් එකට බැඳිලාය. මුළු මහත් සිරුර පුරාම කොර පොතුවලින් වැසිලාය. සංචෝ සායම්වලට මසුරෙකු නොවේ.

රාජකාරිය අවසන් වත්ම ඔහු පියාගේ අතට අසු විය.

"මේ අරුම පුදුම සත්ත්වයා සමග නුඹ කරන්නට සැරසෙන්නේ මොනවාද?" යි පියා ප්‍රශ්න කළේය.

"මම එයාව අහසට යවනවා. එයා මාව හිම මත ඇදගෙන යාවි... හරියට දෙගා බල්ලා වාගේ..."

පියා කොළ පැහැ ඇස් ඇති සරුංගලය දෙස බැලුවේය. පසුව සිය පුත්‍රයා දෙස විමසුම් බැල්මක් හෙලූ ඔහු හිස වැනුවේය.

"ඔන්න බලන්න සංචෝ. නුඹ කලින් හිම සුදුපාට වැලි යයි වරදවා වටහා ගත්තා. දැන් සරුංගලයකට කටකලියාවක් දමාගෙන හිම මත ලිස්සා යාමට තරම් දක්ෂයෙක් වෙලා... කොහොම වුණත් ඔන්න නත්තල් උත්සවය උදා වෙලා... මගේ ළඟ මාලිගාවට ටිකට් පත් දෙකක් ම තියෙනවා. ඕන නම් නුඹේ අර අඹ යුෂවලට කැමති 'මෙණෙවියට' ආරාධනා කරන්න පුළුවනි"

"මොනවා ජනාධිපතිගේ මාලිගාවට?"

"මේ රටේ මාලිගා තියෙන්නේ ජනාධිපතිට විතරක් නොවෙයි. ළමයින්ටත් තමුන්ගේ ම මාලිගා තියෙනවා"

"ඉතින් ළමයි මොනවාද ඒ මාලිගාවල කරන්නේ?"

"උත්සව පවත්වනවා... අනේ මන්දා, මම නම් හරියට ම ඕවා දන්නේ නෑ... නුඹේ සහෝදරවරුන්ගෙන් ම අසා දැනගනින්"

සංචෝ හිස පහත් කරගෙන කල්පනා කළේය. පසුව ඔහු කටහඬ අවදි කළේය.

"දන්නවද මගේ යාළුවා ෂූරික්ගේ... තාත්තා මිය ගිහින්.... ස්වීඩන් රටේ ධීවරයින්ව බේරාගන්න ගිහින්..."

"ඒක බොහෝම දුක්බරයි" පියා දොම්නසින් පැවසීය. "මගේ තාත්තා මිය යන විට මම උන්නෙත් නුඹේ... ෂූරික්ගේ වයසෙමයි. 'පොල්ගසේ හරිතවන් පියාපත්, එහෙත් එය ඉගිල්ලෙනු අසමත්..."

****

යෝල්කා[2] ! යෝල්කා ! යෝල්කා ! බැලූ බැලූ අත යෝල්කා ගස් ! වෙළෙඳ සල්වල ප්‍රදර්ශන කවුළු මත, නගරයේ චතුරස්‍ර මත, නිවෙස්හි කවුළු අසල සෑම තැනෙක ම අලුත් අවුරුදු ගස්ය. රන් රිදී පැහැ කුඩු ඉසින ලද සෙල්ලම් බඩු සෑම අලුත් අවුරුදු ගසකම එල්ලා තිබිණි. යෝල්කා නම් එම මනරම් ගසින් වනයේ නැවුම් පුසුඹ උත්සවාකාරී හැඟීමක් සමගින් වහනය විය. යෝල්කා - එය ළමුන්ගේ උත්සවයයි.

2 යෝල්කා - රුසියාවේ අලුත් අවුරුදු ගස ඒ නමින් හැඳින් වේ.

ළමුන් පමණක් නොව වැඩිහිටියෝ ද යෝල්කා ගස වටා රැස් වෙන්නට ආසා කරති. එය ඔවුන් හට දිවියේ සුන්දරම අවධිය - ළමා විය සිහිකර දුන්නේය.

සංචෝ සහ රීතා, ජනාධිපතිවරුන් උදෙසා නොව ළමුන් සඳහා වෙන් වූ මාලිගය වෙත යමින් සිටියෝය. ප්‍රවේශ පත්‍ර පපුවට තුරුලු කරගත් ඔවුන් යුහුසුලුව ඒ වෙත ගමන් කළේ දනටමත් පමා වී ඇතැයි බිය පත් වෙමිනි.

"නුඹේ සරුංගලය හැදුවද?" යි රීතා සිය මිතුරාගෙන් විමසුවාය.

"හැදුවා... ඒක තව වේළන්න විතරයි තියෙන්නේ..."

"වේළන්න?" යි දැරිය මවිතයට පත්වෙමින් ඇසුවාය. "නුඹ ඒක සේදුවද?"

"නැහැ... මම සරුංගලය පාට කළා... කොළ පාට ඇස් දෙකක්... පියාපත් කහ පාටයි"

"කොළ පාට ඇස් ඇති, කහ පාට සරුංගලය?" යි විමසූ රීතා සිනාපෑවාය.

"ඇයි- කහපාට සරුංගලය හිනාවට කාරණයක් ද?"

"නැහැ" යි රීතා තවත් සිනාසෙමින් කීවාය. "ඒ සතුටට ! ආ... මෙන්න මාලිගය දැක්කද?"

තමන් සිතින් මවාගෙන සිටි මාලිගයට වඩා මෙම සැබෑ මාලිගය මුළුමනින් ම වෙනස් බව එය දුටු සැණින් සංචෝට පසක් විය. ළමා මාලිගයෙහි විවිධ ප්‍රතිමා හෝ පැරණි පහන් හෝ දක්නට නොවීය. කොටින් ම මාලිග යේ දොරටුව අබියස, අසිපත් අතින් ගත් මුර සෙබළුන්

පවා දක්නට නැත. මේ සියල්ල වෙනස් අන්දමකින් පැවතිණි.

විශාල වීදුරු කවුළුවලින් හෙබි සුවිසල් මාලිගාවේ ප්‍රධාන දොරටුව අසල ළමයි රැස්කමින් සිටිති. විවර වූ දොර තුළින් සුදු පැහැ හුමාලයක් පිට විය. දොරටුව අසල දෙපසින් සිට වූ යෝල්කා හෙවත් අලුත් අවුරුදු ගස් දෙකකි. ඒවා එකිනෙකට කොතරම් සමාන වී ද යත්, කදිමට හැඳ පැලඳ ගත් නිවුන් සොහොයුරියන් දෙදෙනෙකු මෙනි.

එම අසාමාන්‍ය මාලිගය දෙස සංචෝ දෙනෙත් දල්වාගෙන බලා සිටියේය. එවිට රීතා ඔහුගේ අතින් ඇද්දාය.

"යමු, යමු, අපි පරක්කුයි !"

අනතුරුව ඔවුහු දෙදෙනා පුළුල් විශාල කිරිගරුඬ පිය ගැට පෙළක් නැග යෝධ ආලෝකමත් ශාලාවකට ඇතුළු වූහ. එම ප්‍රීතිමත්, සංගීතයෙන් පිරී ඉතිරී ගිය ශාලාව තුළ ළමුන් සිය ගණනක් අතරේ මංමුලා නොවනු වස් සංචෝ රීතාගේ අත තදින් මිරිකා ගත්තේය. යෝල්කා ගස්වලින් වහනය වන මත්මත් කරවන දුම්මල හා තීන්ත සුවඳත්, එක්වරම තමා ඉදිරියේ දිග හැරුණු සුරංගනා කතාවක් බඳු පරිසරයත් නිසා සංචෝගේ සිත බෙහෙවින් කැලඹිණි. ඔහු එහි චමත්කාරයෙන් උමතු වූවාක් මෙනි. එකරවම තමා අවට මිනිසුන් සිටින බව පවා අමතකව ගිය ඔහු කෑගැසුවේය.

"පාපා නොයෙල්[3] ! අන්න බලන්න, පාපා නොයෙල් !"

"නැහැ" යි රීතා කීවාය.

3 පාපා නොයෙල් - ඇතැම් ලතින් ඇමරිකානු රටවල නත්තල් සීයා ලෙසින් සලකයි. රුසියාවේ ළමුන්ට තෑගි බෙදීමට පැමිණෙන්නේ හිම සීයාය.

"අනේ නුඹ හිතන්නේ ඒ බල්තසාර් හරි ගස්පර් හරි කියලද?" යි ප්‍රශ්න කළ සංචෝගේ දෙනෙත් දිළිසිනි. තලඑළලු පැහැ ඔහුගේ වත කැලඹීම නිසා වඩාත් අඳුරු පැහැ ගත්තේය.

"නැහැ, රීතා ! මම එයාව හොඳට දන්නවා. ඒ පාපා නොයෙල්"

"මොන පාපා නොයෙල් ද?" යි මවිතයෙන් දැරිය විමසුවාය.

"හැබෑවටම නුඹ ඒ බව දන්නේ නැද්ද? ඒ රජ තුන් කට්ටුවේ වඩාත් ම කරුණාවන්ත කෙනානේ! නමුත් එයාට ඔටුන්නක් තිබිය යුතුයි..."

සංචෝ අරහයා ඒ සියල්ල සිදු වූයේ, හිම සීයා ළමුන්ගේ කවය මැද්දට සපැමිණීමත් සමගයි. සුදු පාට ලොකු රැවුළක් සහිත රුසියානු හිම සීයාට රතු පාට සත හිස්වැස්මක් සහ විශාල රතු හිම කබායක් තිබුණේය.

"ඒ හිම සීයා" යි රීතා ඔහුට පැහැදිලි කළාය. "එයා ළමයින්ට තෑගි බෙදනවා"

"අමතක නොකර සපත්තුවක් සූදානම් කරන්න ඕනේ"

"සපත්තුවක් මොකට ද?"

"තෑගි වෙනුවෙන්, ඒ වගේ චාරිත්‍රයක් අපේ රටේ තියෙනවා" යි සංචෝ පැහැදිලි කළේය.

තෙරපෙන ළමුන් විසින් ඔවුන් දෙදෙනාව එක් දිසාවකට ඇදගෙන යනු ලැබීය. දැන් ඔවුන් වාද්‍ය වෘන්දය අසලට ම පැමිණ තිබේ. සැණකෙළි සිරියගත් එම වාද්‍ය වෘන්දයේ සෑම සංගීතකාරයෙක් ම සර්කස් සංදර්ශනයක විකටයන්ගේ මෙන් විචිත්‍රවත් ඇඳුමෙන් සැරසී සිටියේය. ඔවුන් හැමටම විසල් රතු නාසයක් ද, ඇස් වටා ලොකු සුදු පුල්ලි වැනි යෝධ උපැස් ද තිබුණේය.

"අන්න බලන්න රීතා !"යි කී සංචෝ රීතාව වාද්‍ය වෘන්දය අසලට ම කැඳවාගෙන ගියේය. ඔහු එහි එක් සංගීත ශිල්පියෙකු ඇයට පෙන්වීය. "ඒ බැංචෝ සංගීත භාණ්ඩයක්. මගේ සීයා හුයන් - මරීයා වාදනය කළොත් ඒ වගේ එකක් තමයි."

බැංචෝ යනු රබානකට සවි කළ ගිටාරයක වැනි තත් සහිත පුවරුවක් ඇති සංගීත භාණ්ඩයකි. සංගීත ශිල්පියා එය ගිටාරයක් මෙන් වාදනය කළේය.

"මම දැක්කා" යි සිහින් හඬින් කී රීතා, සිනා උපදවන විකට පෙනුමෙන් යුත්, රතු නාසය සහ සුදු උපැස් පැලැඳි වාදකයා දෙස බලා සිටියාය.

"ඇත්තම ම සංචෝගේ සීයා හුයන් - මරියා ඔහුට සමාන නොවන්නේදැයි?" ඇය කල්පනා කළාය.

"ඇතැම් විට සංගීත ශිල්පියාගේ විකට රතු නාසය සහ සුදු පුල්ලි සෝදා ඉවත් කළ විට, ඔහු නියම සොල්දාදුවෙකුගේ නිර්භීත පෙනුමකින් යුතු නොවේවිද?"

සංචෝ රීතා වෙත නැඹුරු වී මෙසේ කීවේය.

"හෙට තමයි දවස. නුඹ මොකද කියන්නේ, මගේ සරුංගලය වැඩ නොකරාවිද?"

"එය නුඹ හිතන විදියට ම පියාසර කරාවි !"

"එතකොට මාරියා මෙණෙවියත් අප සමග ඒවිද?"

"ඇය පොරොන්දු වුණා අපව හිම මිදුණු විශාල විලට කැඳවාගෙන යන්න. මිදුණු විල මත සමතලා අයිස් තට්ටුව. ඒ වගේ ම එතැන සුළං පාරත් හරි සැරයි."

"ෂූරික් කිව්වා, එයා දෙගා බල්ලත් කැටුව එන බව. කවුද වඩාත් ම වේගවත් - දෙගා ද, සරුංගලය ද?"

එවිට මිතුරෝ දෙදෙනාගේ කටහඬ යටපත් කරමින් වාද්‍ය වෘන්දය උච්ච ස්වරයෙන් වාදනය ඇරඹීය.

6

මිදුණු අයිස් තට්ටුව සහිත සමතලා විල මත ළමයි කණ්ඩායමක් ගමන් කරමින් සිටිති. දිගු දම්වැලක් සේ දිස් වුණ ඔවුනට පිටුපසින් හිම තලාව මත ලීෂී පටිවලින් පැන නැගි ඒකාකාර සලකුණු හිරු රැසින් බබළන්නට වූයේ හිම මිදුණු විල මත දුම්රිය පීලි සවි කළාක් මෙනි. ළමා පෙළ සෙමෙන් ඉදිරියට ඇදුණහ. එහි ඉදිරියෙන් ම වටහා ගත නොහැකි අන්දමේ එක්තරා කහ පාට වස්තුවකි. සුළං හමන විට එම උපකරණය තිගැස්සෙන්නට වූයේ, අතින් මිදී ඉගිලෙන්නට වෙර දරන්නාක් මෙනි. එය රුවල් නැවකට සමාන විය. නිවැරදිව කිවහොත්, එය විසල් නෞකාවක මහ කුඹයේ රුවල මෙනි. ලීෂී පදින්නන්ගේ කුඩා කණ්ඩායම එම අපූරු කහ රුවලත් සමග හිම තලාව මත පාවී යමින් සිටිති. ඔවුන් අසලින් දිව යන සුනඛයෙකි.

දුර සිට පෙනෙන දර්ශනය එසේ විය. එහෙත් වඩා සමීපව නරඹන විට ඒ අන් කිසිවෙක් නොව සංචෝ සහ ඔහුගේ සෝවියට් මිතුරන්ය. ඔවුන් සමගින් 'මාරියා' මෙණෙවිය ද වූවාය. අද සරුංගලය අත්හදා බැලීමට නියමිත දිනයයි. සංචෝ සහ ඔහුගේ මිතුරන් විසින් හිම සාගරය මැදින් රැගෙන යන, රහැතින් ගැට ගැසූ එම පක්ෂියා පියාසර කරන්නට සමත් වේවිද?

"හා, හා... බලාගෙනයි !" ෂුරික් නොසන්සුන් ලෙස නිතර අනතුරු ඇඟවීය. "කඩදාසි සිදුරු කරන්න විතරක් එපා"

"කොල්ලනේ, නවතින්න !" රීතා කීවාය. "සුළං පාර සැරයි"

"මුලින් ම සරුංගලය උඩ යවන්න ඕනෑ" යි අබ්‍රිකොස් උපදෙස් දුන්නේය.

"මුලින් ම සරුංගලය ඇදගෙන දුවන්න ඕනෑ. පසුව එයා තනියම ගුවන් ගත වේවි" යි ගුරුතුමිය කීවාය. ක්‍රීඩා ඇඳුමකින් සැරසී ලීෂී පටි පයලාගෙන සිටි ගුරුතුමිය කුඩාවුන්ගෙන් වෙනස් වූයේ යන්තමිනි.

"මම ලීෂී පටි ගලවලා පයින් දුවන්නම්" යැයි ෂූරික් ඇයගේ අදහස අනුමත කරමින් කීවේය. "සංචෝ නුඹ ඒ අතරේ සූදානමින් ඉඳපන් !"

ළමෝ දෙපසට වී ඉඩ දුන්නෝය. ෂූරික් ලීෂී පටි ගලවා ඉවත් කළේය. සංචෝ සූදානමින් බලා සිටියේය.

මුලදී සරුංගලය සිය සහචරයන්ගෙන් වෙන් වීමට අකමැති වූවාක් මෙනි. ෂූරික් වේගයෙන් දිව ගියේය. එහෙත් සරුංගලය ඔහු පසුපසින් පාවුණේ ඕනෑවට එපාවට මෙනි. වරක් හිම මත වැටී එය ඇතිල්ලෙන්නට පවා විය.

"මං කිව්වේ, උඩ යන්නේ නැහැ !" යි අබ්‍රිකොස් කෑගැවේය. "මං හිතුවා ඔහොම වෙයි කියලා..."

"යනවාමයි ! එයා උඩ යනවාමයි !" සංචෝ කෑගැවේය.

ෂූරික් වේගයෙන් දිව්වේය. එඬේර බල්ලා - ෂූරික්ගේ මිතුරු දෙගා - විශාල පිම් පනිමින් ඔහු අසලින් දිව ගියේය. අනෙක් ළමෝ ඔවුන් ලුහුබඳිමින් ලීෂී මත ලිස්සා ගියෝය.

එක්වරම සරුංගලය සුළං ධාරාව හසුකර ගත්තේය. එය සැණින් ඉහළ නැංගේය. දැන් එය අතින් ඇල්ලීමට පවා නොහැකි තරම් උසකිනි, පාව යන්නේ. ෂූරික් නූලෙන් සරුංගලය ඇද්දේය. එවිට එය තවත් ඉහළට ඇදී ගියේය. කැප්රොන් නූල වීණා තත් මෙන් ඇදුණේය. කොලුවා මුළු වැර යොදා සරුංගලය තමා වෙත ඇද්දේය. ගුවන් ගැබ, සිය

සජීවී පරිසරය මත ප්‍රකෘතිමත් වූ සරුංගලය කොලුවා ගුවනට අදින්නට පටන් ගත්තේය.

"අදිනවා" යි ෂූරික් කෑගැසුවේය.

"අදිනවා ! අදිනවා !"යැයි අවට සිටි අය සතුටින් කෑගෑවෝය.

"සංචෝ, ඔන්න අල්ල ගනින් !"

"පරෙස්සමෙන් ! බලාගෙනයි !" මාරියා මෙණෙවිය නොසන්සුන් වෙමින් කෑගෑවාය.

සංචෝ යන්තමින් කැප්රොන් නූල අල්ලා ගැනීමට සමත් විය. එසැණින් ම ඔහුගේ සිරුර ඉදිරියට නැමුනේ, සරුංගලයේ ඇති බලය ඔහු හට පසක්කර දෙමිනි.

"යනවා ! යනවා !"

සමතලා හිම තලාවේ සංචෝ ලීෂී මත ලිස්සා ගියේය. සරුංගලයේ රැහැන ඔහු තදින් අල්ලා ගෙන සිටියි. "නොවැටී දෙපා මත සිටගෙන සිටින්නට හැකි වුණොත් ඒ ඇති!" යි ඔහු ප්‍රාර්ථනා කළේය. සිය සරුංගල් මිතුරා මහ පොළොවට ඉහළින් පියාපත් විදහා පියාසර කරන පණැති යෝධ සත්ත්වයෙකු මෙන් ඔහුට දැන් හැඟුණේය. එම සජීවී සත්ත්වයා, අජීවී කැප්රන් නූල හරහා ඔහුට සම්බන්ධ වී සිටියේය. ඔවුන් දෙදෙනා - සරුංගලය සහ කොලුවා - බිඳ හෙළිය නොහැකි එකම අරමුණකින් බැඳ දැමුවාක් මෙනි. දෙදෙනාට ම එකම අභිලාෂයක් සහ එකම ක්‍රියාකාරීත්වයක් තිබුණේය. දැනටමත් ඔවුහු සෙසු ළමුන්ගෙන් බොහෝ දුරස් වී සිටියෝය.



සරුංගලය
එක්වරම වේගය
අඩු කළාක්
මෙන් සංචෝට
දැනුණේය.
එහෙත් ඒ
සමගම නව
ජවයකින් එය
යළි පියාසැරිය
ඇරඹීය.
කොලුවා
වේගයෙන් හිම මත ලිස්සා ගියේය. පෙනෙන හැටියට සිය ගුවන් සගයා මෙල්ලකර ගැනීමට ඔහු කොහෙත් ම අපොහොසත් වන සැටියකි. දැන් සරුංගලය ඔහු සමග තරග කිරීමට ඉදිරිපත් වූවාක් මෙනි. කවුද වඩාත් ම ශක්තිමත්? සරුංගලය වඩාත් වැඩි බලයකින් සංචෝව තමා වෙත අදින්නට විය. තවත් සුළු මොහොතකින් එය සංචෝව ගුවනට ඇද ගැනීමට වුවද ඉඩ ඇත !

කොලුවා හිස ඔසවා සරුංගලය දෙස බැලුවේය. මහ මුහුද මැද පිහිනන කහ පැහැති විශාල මත්ස්‍යයකු විලසින් ඔහුට සරුංගලය පෙනුණේය. මත්ස්‍යයා පිහිනීය. සංචෝ ඌ රැහැනකින් බැඳ අල්ලා ගත්තේය. මත්ස්‍යයාට බේරී පලා යාමට වුවමනා වූ නමුදු සංචෝ ඌ අත් නොහැරියේය. එම අසහාය මත්ස්‍යයා අත් නොහැර මෙල්ල කිරීමට ශක්තිය ඔහු සතුව තිබේ...

ඒ අතර වේගවත් ගැස්මක් ඔහුට දැනුණේය. පෙනෙන හැටියට සරුංගලය තවත් ගුවනේ ඉහළට පියාසර කොට වඩාත්

වේගවත් සුළං ධාරාවකට හසු වූ සෙයකි. සංචෝ කැප්රන් නූල දැඩිව අල්ලා ගත්තේය. එහෙත් එක්වරම සමබරතාව බිඳ වැටුණෙන්, ඔහු බිම ඇද වැටුණේය. එහෙත් සරුංගලය ඔහුව දිගට ම තමා දෙසට අදින්නට වූයේය. සිය මිතුරා බිම ඇද වැටුණ සැටි සරුංගලය නොදිටීය. එය වැටුණු සංචෝව හිම තලාව මත ඇදගෙන ගියේය. කොලුවාට කිසිසේත් යළි දෙපයින් නැගී සිටීමට හැකියාවක් නොමැත. සංචෝ කෑගැසුවේය. එහෙත් ඔහුගේ කටහඬ කිසිවෙකුට ඇසුණේ නැත.

ළමෝ පමා වූහ. වේගවත් සුළං පහර සියලු හඬ යටපත් කළේය.

සංචෝගේ කම්මුල ගොරෝසු හිම මත ඇතිල්ලිණි. කම්මුලේ හම සීරිණි. ඔහුට සිය කම්මුල පිළිස්සෙන්නාක් මෙන් වේදනා දැනුණේය.

"නූල අතහරින්න ඕනෑ" යි සංචෝ සිතුවේය. එහෙත් වෙනත් සිතුවිල්ලක් ඔහුට බාධා කළේය. "මොන දේ සිදු වුණත්, සරුංගලය නම් අත හරින්නට නොහැකියි"

ඔහු කිටි කිටියේ දැතින් රැහැන මිරිකා ගත්තේය. දැන් ඔහු එක්වරම ඉගිලෙන ප්‍රාණියාගේ වෙනත් සගයෙකුගේ

භූමිකාව භාර ගත්තේය. ඒ නැංගුරමකි. ඔහු මුළු වෙර යොදා සරුංගලයේ ගමන නැවැත්වීමට එය තමා වෙත ඇද්දේය. සරුංගලය සමග බිහිසුණු අරගලය ඇරඹිණි.

ළමෝ සිදු වූ අකරතැබ්බය දුටුවෝ, ඔහු වෙත වේගයෙන් දිව එමින් කෑ මොර දුන්නෝය.

"සංචෝ ! සරුංගලය අත ඇරපන් ! සරුංගලය අත ඇරපන්"

එහෙත් ඔහුට මිතුරන්ගේ ඔවදන් නොඇසුණි.

වහාම ඔහුට ආධාර අවශ්‍යය. එහෙත් ළමුන් සහ සංචෝ අතර විශාල දුර පරාසයකි. ෂූරික් එක්වරම උස් හඬින් කෑගැවේය.

"දෙගා - මා ළඟට !"

සුනඛයා එසැණින් ම ඔහු වෙතට පැත්තේය. ෂූරික් දිගැති රේන්ස් පටිය සුනඛයාගේ කරපටියට සවි කළේය.

"ඉදිරියට දෙගා - ඉදිරියට !" යි ඔහු අණ දුන්නේය.

සුනඛයා වේගයෙන් ඉදිරියට පිම් පනින්නට වූයේ සිය කුඩා ස්වාමියා ද හිම මත වේගයෙන් ඇදගෙන යමිනි. වියළි හිම දූහුවිලි සැහැල්ලු වලාවක් මෙන් ඉහළ නැංගේය. ෂූරික් රේන්ස් පටිය දැඩිව අල්ලාගෙන සිටියේය. දෙගා වේගය අඩු නොකළේය. සරුංගලය සමගින් බිහිසුණු අරගලයක යෙදී සිටින සංචෝ වෙත ඌ ඊ ගසක් බඳු වේගයෙන් දිව්වේය.

අනෙක් ළමෝ රිටිවලින් හබල් ගසමින් ලීසි මත එදෙසට ලිස්සා එමින් සිටියෝය.

ඔවුන් අතරින් මාරියා පාව්ලොව්නා පෙරටුව ගමන් කළාය. සිය විදේශික දරුවා මුහුණ පෑ හදිසි අනතුර නිසා ඇය බෙහෙවින් චකිතයට පත් වූවාය.

"ඉක්මනට ! ඉක්මනට ! ඉක්මනට !"

ඒ අතරතුර ෂූරික් සංචෝ වෙත සමීප වීමට සමත් විය. ඔවුහු දැන් එක පෙළට ධාවනයේ යෙදෙති. ෂූරික් නැඹුරු වී සරුංගලයේ නූල අතින් ඩැහැ ගත්තේය. සංචෝ එය අත හැරියේය. දැන් ෂූරික් සරුංගලය සමග පොර බැදීමට පටන් ගත්තේය.

හිම මත වැතිර ඉඳිමින් ම සංචෝ මෙසේ සිතුවේය. 'එයාගේ තාත්තා ස්වීඩන් රටේ ධීවරයන්ව බේරාගත්තා... ඒත් එයා මුහුදට බිලි වුණා. දැන් ෂූරික් මාව බේරාගත්තා... එතකොට එයාවත්...' කොලුවා හනික නැගී සිටීමට වෑයම් කළේය. එහෙත් පාදයෙන් පැන නැග තියුණු වේදනාව ඔහුට පහර දුන්නේය. සංචෝ හිම මත වැතිර දෙනෙත් පියා ගත්තේය. එවිට ඔහුට ඉහළින් උණුසුම් හුස්ම ගැනීමක පහස දැනුණේය. උණුසුම් දිගු දිවක් ඔහුගේ සීරුණු කම්මුල ලෙව කෑවේය. සංචෝ දෙනෙත් හැරියේය. ඒ අන් කිසිවෙකු නොව - දෙගා ය. ෂූරික්ගේ විශ්වාසවන්ත මිතුරා !

"දෙගා" යි සංචෝ මිමිණීය.

සුනඛයා සතුටින් වලිගය වැනුවේය.

"ඔන්න එහෙනම් අපි හඳුනාගත්තා" යි ඔහු සිය මාතෘ භාෂාවෙන් කීවේය. එහෙත් පෙනෙන හැටියට එවදන් දෙගා වටහා ගත්තාක් මෙනි. ඌ හනික ඔහුගේ අනෙක් කම්මුල ද ලෙවකන්නට වූයේය.

ඒ අතර ෂූරික් ටිකෙන් ටික සරුංගලය මෙල්ල කර ගැනීමට සමත් විය. නිදහස පතා මහා අරගලයක නිරත වූ සරුංගලය අන්තිමේ දී සිය විසල් පියාපත් හිම තලාව මත දිග හැර වැතිර ගත්තේය. ඒ අතර අනෙක් ළමෝ සංචෝ වෙත සමීප වූහ.

"නුඹට තුවාල ද?" බියපත් ගුරුතුමිය සංචෝ වෙතට දිව එමින් ඇසුවාය.

"කකුල" යි සංචෝ කීවේය. "රිදෙනවා"

"නුඹේ කකුල කැඩිලා ද?" රීතා බියපත් වෙමින් ඇසුවාය.

"දන්නේ නැහැ"

සරුංගලය සමග ඇදී ගිය වේගවත් ගමනේ කම්පනයෙන් සංචෝ තවමත් මිදී නොසිටියේය. ඔහුගේ සවන් තුළ ඝෝෂාවක් පැන නැංගේය. හදවත වැරෙන් ගැහුණේය.

"මම සරුංගලය අත ඇරියේ නෑ" යි කොලුවා කෙඳිරිය.

"දැන් මම නුඹේ ලීෂි පටි ගලවන්නම්" යැයි ගුරුතුමිය යෝජනා කළාය.

"අනේ මම කරගන්නම් මෙණෙවිය. ඔබට බැහැ..."

"මම නුඹේ යාළුවා. මෙණෙවිය නොවෙයි" කී රීතා දණ නමා පහත් විය.

"ස්තුතියි යාළුවේ...!"යි කෙඳිරූ සංචෝ සීරුණු කම්මුල අත ගෑවේය.

කොල්ලෝ එකතු වී සරුංගලය මුළුමනින් ම මෙල්ල කළෝය. දැන් එය තටු සිඳුණු පක්ෂියෙකුගේ සිරිය ගත්තේය. සරුංගලය අල්ලා ගැනීමට බොහෝ දුර ගිය ෂූරික්, අබ්‍රිකොස්

හා අලීසා යළි හැරී සංචෝ වෙත එමින් සිටියෝය. සරුංගලය කටකලියාවක දමා මෙල්ල කළ වල් අසෙකු සේ ඔවුන්ගේ ග්‍රහණයට පත් වී තිබිණි.

"මම සටනේ දී තුවාල ලැබුවා" යි සංචෝ රීතාට රහසින් කීවේය. "නුඹ හෙද සොහොයුරිය... මගේ දිවි බේරා ගන්නවා..."

"නුඹ නිර්භීත කොල්ලෙක් !" රීතා කීවාය. "කිසිම සුළං මෝලකට බය නැති කොල්ලෙක් ! නුඹට බොහොම රිදෙනවද?"

"නියම පුරුෂයා වේදනාව දරාගත යුතුයි" පිළිතුර එසේ විය.

සරුංගලය රැගෙන ළමෝ පැමිණියහ.

"නුඹේ වැඩේ ඉස්තරම් විදියට සාර්ථක වුණා" යි අබ්‍රිකොස් පැසසීය. "ඇත්තමයි මම හිතුවේ වැඩේ හරියන එකක් නැහැ කියලයි"

ළමෝ එකතු වී ලීෂි පටි එකතු කොට කුඩා හිම යානයක් තැනූහ. ඒ මත තුවාල වූ සහෝදරයා නංවා ගත් ඔවුහු හිම තලාව මත ඔහු ඇදගෙන යන්නට වූහ. රීතා ඔහු අසලින් ම පිය නැගුවාය.

"අනේ පරෙස්සමෙන්!" යි ඇය ළමුන්ගෙන් අයැදීය. "එයාට ගොඩක් රිදෙනවා"

"මට රිදෙන්නේ නෑ !" යි සංචෝ ඇය සැනසුවාය. "කොහොම වුණත් සරුංගලය උඩ ගියා නොවැ...!"

****

"දෙවියනේ මක් වුණාද සංචෝ?"

අම්මා දොර අසල සිට කෑගෑවාය. ඇය ඉදිරියේ පිය ගැට පෙළ අසල කුඩා චතුරස්‍රයේ, තුවාල ලැබූ සහෝදරයාව නිවසට ඇරලවීමට ආ ළමෝ පිරී සිටියෝය. සංචෝගේ එක් පයක් පාවහන් රහිතව, වෙළුම් පටිවලින් ඔතා තිබුණේය. කම්මුලෙහි පැලැස්තරයකි.

"මගේ දෙවියනේ ! නුඹට අනතුරක් වුණාද?"

"මම සරුංගලේ එල්ලිලා ලිහිී පැද්දා!" යි කී සංචෝ, වරදකාරී බැල්මකින් සහෝදර කැළ දෙස බැලුවේය.

එවිට ගුරුතුමිය - 'මාරියා මෙණෙවිය' අම්මා වෙතට ළං වූවාය.

"ආයුබෝවන් ! මම සංචෝගේ ගුරුතුමිය" යි ඇය තමා හඳුන්වා දුන්නාය.

"එතකොට ඔබතුමියත්... සරුංගල් අරින්න?" අම්මා මවිතයට පත්වෙමින් ගොත ගැසුවාය.

"ඔව් මමත්... මම දරුවෝ ටික එකතු කරගෙන ලිහිී පදින්න ගියා... ඒත් ඔන්න හිතපු නැති කරදරයක් සිද්ධ වුණා"

"මගේ දෙවියනේ !"යි අම්මා සංවේගයෙන් කෑගෑවාය.

"බය වෙන්න කිසි දෙයක් නැහැ" යි සංචෝ කීවේය.

"හැමෝටම මෙහෙම දේවල් සිද්ධ වෙනවා"

"දොස්තර කිව්වා, ඉක්මනට ම සුවවේවි කියලා" යි රීතා කතාවට මැදිහත් වෙමින් කීවාය. "සංචෝ නිර්භීත බව පෙන්නුවා"

"නිර්භීත බව !" පිළිවදන් දුන් අම්මා සුසුම් ලෑවාය.

"අපේ පරම්පරාවේ හැමෝම නිර්භීත බව පෙන්නන්න ගිහිල්ලා මැරුම් කෑවා..."

"මම දන්නවා, ඔබේ සීයා බැංචො සංගීත ශිල්පියෙක් වෙලා හිටියා..."

"අපේ පවුලේ සංගීත කාරයෝ පවා සටනේ දී මිය යනවා... අනේ මම ඒ නිසා සංචෝ ගැන මොන තරම් බයකින් ද ඉන්නේ...?"

එවිටම එක්වරම, පැමිණ සිටියවුන් තවමත් එළියේ සිටගෙන සිටින බව අම්මාගේ අවධානයට බඳුන් වූයෙන් ඔවුන් හැමටම නිවසට ඇතුළු වන ලෙස ඇය ආරාධනා කළාය.

"අනේ ඔයාලා ඇයි හිටගෙන ඉන්නේ? කරුණාකර ගෙට ගොඩවෙන්න. දැන් ඉතින් ඉක්මනට දොස්තර මහත්මයාව කැඳවන්න ඕනෑ..."

"අපි දැනටමත් දොස්තර හමුවෙලා ඉන්නේ" යි රීතා ඇයට මතක් කර දුන්නාය.

"සංචෝ ! දොස්තරට ගෙවන්නට නුඹ ළඟ සල්ලි තිබුණ ද?" යි කලබලයෙන් විමසූ අම්මා මාරියා පාව්ලොව්නා වෙත අවධානය යොමු කළාය. "සමහරවිට, ඔබ ද දොස්තරට ගෙව්වේ?"

"දොස්තරට ගෙවන්නේ මොකටද?" ෂූරික් මවිතයෙන් විමසීය.

"අපොයි, ඇත්ත නේන්නම්. මුළු ලෝකයේ ම දොස්තරලාට ගෙවන්න ඕන වුණාට, ඔයාලගේ රටේ හැමදේම නොමිලේ නොවැ" යි අම්මා සැනසුම් සුසුමක් හෙලුවාය.

පියගැට පෙළ අසල කුඩා චතුරස්‍රයේ ළමෝ තෙරපෙමින් සිටිති. ප්‍රධාන වරදකරු - සරුංගලයා, සිය කොළ පැහැති ඇස්වලින් වරදකාරී ලෙස බලා සිටියි. ඔහුගේ ගිනි පිටකරන මුඛය දැන් සිසිල් වී ඇති සේය.

"අපට යන්න වේලාව හරි !" යි මාරියා පාව්ලොව්නා කීවාය.

"ඉක්මනට සුව වෙන්න සංචෝ !" රීතා දයාබර ලෙස සුභ පැතුවාය.

"මම ඉක්මනින් සුව වෙනවා !" යි සංචෝ ස්ථිර ලෙස පිළිතුරු දුන්නේය.

"ඔයාලා තව ටික වේලාවක් නොසිටීම ගැන කණගාටුයි!"යි අම්මා පැවසුවාය. "කරුණාකර ආයෙත් දවසක අපේ දිහා ඇවිත් යන්න එන්න. අපි බොහෝ ම සතුටු වෙනවා..."

"ස්තූතියි" හැම දෙනා වෙනුවෙන් රීතා කීවාය.

"මා, ඒ තමයි රීතා" යි සංචෝ අම්මාට රහසින් කීවේය.

"අර අඹවලට කැමති කෙනා?"

"ඔව් !"

ළමෝ පියගැට පෙළ බැස යන්නට වූහ. පහළ සිට ළමෝ යළිත් කෑගැවෝය.

"සුවපත් වෙන්න"

දොරටුව අසල තිදෙනෙක් පමණක් ඉතිරි වූහ. අම්මා, සංචෝ සහ කහ සරුංගලය.

"විසිකර දමන්න එය" අම්මා තදින් කීවාය.

"බැහැ, ඊළඟ පාර එයා මාව දිය මත ඇදගෙන යාවි! එයා හොඳම හොඳ සරුංගල් මිතුරෙක්"

"යමු, ආබාධිතයා" යි කී අම්මා සුසුමක් හෙලා සංචෝ උරයට හේත්තු කර ගත්තේය.

7

කාලය ඉගිලී ගියේය. සීත ඍතුව සිය හිම කටයුතු නවත්වා, වසන්ත ඍතුවට සිය භූමිකාව ලබා දුන්නාය. සංචෝ මවිතයේ අන්තයටම පත් විය. සිය කම්මුල් සිප ගනිමින් හමන උණුසුම් සුළං රැලි සහ නග්න තුරු මත නව දලු දිග හැරෙන විට ඔහුගේ මවිතය තවත් වැඩි විය. ඔහු මෙතෙක් සිතා සිටියේ, මෙහි - සෝවියට් දේශයෙහි - සදාකාලික සුදු පැහැය පමණක් පවතිනු ඇත කියාය. සදාකාලික හරිත පැහැය බබළන්නේ සාගරයෙන් එපිට සිය මාතෘ භූමියේ පමණකැයි ඔහු සිතුවේය.

සංචෝ දැනටමත් සැලකිය යුතු කාලයක් රුසියානු පාසලට ගොස් තිබිණි. එහෙයින් දැන් ඔහු හොඳින් රුසියානු භාෂාව වටහා ගත්තා පමණක් නොව, පන්තියේ ළමුන් සමග හරි හරියට කියවන විට ලිවීමේ අභ්‍යාසවල නිරත විය. එහි වැරදි තිබුණ ද, ඒ පෙර මෙන් මහ ගොඩක් නොවේ. ඔහුගේ පාදය ද දැන් සුව වී තිබේ. කහ සරුංගලය

ගිම්හානය උදාවන තෙක් අල්මාරිය අසල සිටුවා තිබුණේය. සරුංගලය කොළ පාට දෑස් දල්වා බලා සිටියේය. වා කවුළුව විවර වන සෑම විටකම එය යන්තමින් තිගැස්සී, සර සර හඬක් නංවයි.

මේ අතර රොද්‍රිගෙස් නිවසට මව්බිමේ සිට ආ අමුත්තා යළි පහළ විය. මෙවර ක්රේදෝ මහත්මයා දින කිහිපයක් එහි ලැගුම් ගත්තේය. ඔහුට පියාගේ කන්තෝරු කාමරය සූදානම් කර දෙනු ලැබිණි. එහෙයින් දූත් නිතර ඔහු දොරටුව අසල පෙනී සිටින විට ඔහුගේ කටහඬ නිවස පුරා රැව් දුන්නේය.

"සංචෝ, තොරතුරු කොහොමද?"

"අපේ කට්ටිය හොකී තරගය හතරට එකක් ලෙස දිනුවා !"

"අපේ ?" විමතියෙන් ප්‍රශ්න කළ අමුත්තා, ඉදිකටු වැනි තියුණු දෙනෙතින් සංචෝ විනිවිදින්නට වූයේය. "හැබෑවටම අපේ එරිගන් - සිටි කණ්ඩායම මෙහේ ඇවිල්ලාද?"

"නැහැ, නැහැ, අපේ ස්පාර්තාක් [1]"

"අපේ...? ස්පාර්තාක් !" යි ඇද පෑද කී ක්රේදෝ මහතා වටකුරු උරහිස් නැටවූයේය. "එහෙනම් දූනටමත් ස්පාර්තාක් අපේ වුණා, ඈ...? මගේ හිතේ නුඹ තවමත් පයනියර්වරයෙක්[2] වුණේ නැහැ කියලා...?"

****

1 ස්පාර්තාක් - සෝවියට් දේශයේ ජනප්‍රිය ක්‍රීඩා සමාජයකි.

2 පයනියර් - සෝවියට් දේශයේ පාසල්වල තිබූ ළමා පුරෝගාමීන්ගේ සමාජය

දිනක් පියා කැඩපත ඉදිරියේ රැවුල බාමින් සිටියේය. ඔහුගේ මුහුණේ සබන් පෙණ කොතරම් ආලේප කර තිබුණේ ද යත්, දුටු සැණින් ඔහු අලුත් අවුරුදු උළෙලේ සිටි හිම සීයාට සමාන විය. දැලි පිහියේ දිළිසෙන තලය කම්මුලේ තැවරුණු සබන් පෙණ මත ඇදී යත්ම පට - පට හඬ නංවමින් සබන් පෙණ සමගින් ඝන රැවුළු ගස් කැපී ඉවත් විය. පියා ඇඟිල්ලෙන් සම පැත්තට ඇද යළිත් සියුම් ලෙස දැලි පිහිය ඇද්දේය. ඔහුගේ දෙනෙත් භාරදූර කටයුත්තක නිරතව සිටින බැව් හඟවමින් බැරෑරුම් විය.

එවිට කැඩපත මත සංචෝ පෙනී සිටියේය.

"පා, ආයුබෝවන් !"

"සැරදේවා" යි විහිළු ලෙස පිළිවදන් දුන් පියා ආචාර කරන්නාක් මෙන් දැලි පිහිය එසවීය. "කොහොමද ඉස්කෝලේ වැඩ?"

"අද කියවන විට ලිවීමේ අභ්‍යාසයේ දී මම වැරදි පහළොවක් කළා !"

"ඉතින් බිංදුව ලැබුණ ද?"

"නැහැ... මාරියා පාව්ලොව්නා මට ලකුණු දුන්නේ නැහැ. එයා කිව්වා, ඒක ස්වාභාවිකයි කියලා"

"ඒක ස්වාභාවිකයි" යාන්ත්‍රිකව කී පියා තවමත් රැවුළ නොබෑ කම්මුලේ සබන් තවරා ගත්තේය.

"ඒ වුණාට මම පිනුම්වලට පහක්[3] ගත්තා"

3 රුසියාවේ පාසල්වල ලකුණු ලබා දෙනුයේ එකේ සිට පහ දක්වාය.

"ඒ මොකද්ද - පිනුම්?"

සංචෝ සිනාසුණේය. ළමුන් අතර ජනප්‍රිය එම වචනය ගැන පියා නොදන සිටීම ගැන ඔහු මවිත විය.

"ඒ සරඹ ක්‍රීඩාව (ජිම්නාස්ටික්)" යි සංචෝ පැහැදිලි කළේය.

"ආ... ආ..." කී පියා වඩාත් පහසුවෙන් රැවුළ බෑමට කම්මුල පුම්බා ගත්තේය.

සංචෝ සබන් පෙණ සහිත බුරුසුව අතට ගෙන සිය දෙකොපුලෙහි සහ නිකට යට තවරා ගත්තේය. දැන් ඔහු එක්වරම වයසින් මහලු වූවා සේ දිස් විය. හරියට පුංචි හිම සීයා කෙනෙක් මෙනි.

"දඟ වැඩ එපා !"යි පියා සිනා පාමින් කීවේය. "රැවුළ සමග ඔට්ටු වීමට නුඹට තව කල් තියෙනවා. බය නැතිව ඉඳපන්. නුඹටත් කම්බි වගේ ඝන රැවුළක් ඉක්මනින් මතු වේවි. විදුලි රේසරයකින් වැඩි පරෙස්සම්"

"කවදාහරි මම රැවුළ කපන්නෙත් අවදානම් දැලි පිහියෙන් ම තමයි" තරයේ පැවසූ සංචෝ සබන් පෙණ සෝදා ගත්තේය.

"පා, රීතාගේ උපන් දිනේ තව දින තුනකින් !"

"හැබෑවට ම !"උස් හඬින් කී පියා කැඩපතට එබී සිය මුහුණ දෙස අවධානයෙන් බැලුවේය. "එහෙනම් ඇයට තෑග්ගක් සූදානම් කරන්න වේවි"

"මම ඉතාමත්ම බැගෑපත්ව ඉල්ලා සිටිනවා ඔබගෙන් පා, කරුණාකර බෝනික්කෙක් නම් මිලදී ගන්න එපා ! සෝවියට් දේශයේ ගැහැනු ළමයි බෝනික්කොත් එක්ක සෙල්ලම් කරන්නේ නැහැ"

"හැබැට? ඉතින් ඒ ගොල්ලෝ මොනවා එක්ක ද සෙල්ලම් කරන්නේ?" යි සංචෝ දෙසට හැරෙමින් පියා විමසීය.

සංචෝ මොහොතක් කල්පනා කොට මෙසේ පැවසීය.

"ඒ ගොල්ලෝ සෙල්ලම් කරන්නේ පිරිමි ළමයි වගේ"

"හැබැටම ! නුඹ මා ඉදිරියේ තැබුවේ සුළුපටු ගැටලුවක් නෙමෙයි. පොදුවේ ගැහැනු ළමුන් බෝනික්කන් එක්කයි සෙල්ලම"

ඒ මොහොතේ නාන කාමරයේ දොරටුව අසල ක්රේදෝ මහතා පෙනී සිටියේය.

"පොදුවේ ගැහැනු ළමයින් බෝනික්කන් එක්කයි සෙල්ලම" යි පියාගේ වදන් ඔහු පුනරුච්චාරණය කළේය.

"ඒ වුණත් හිතවත් රොද්‍රිගෙස්, අපි මුහුණේ දැලි ගා ගන්ට නරකයි. අපි එකතු වෙලා හොඳ තෑග්ගක් ගැන කල්පනා කරමු"

"ස්තුතියි !" සංචෝ අමුත්තාට ඉත සිතින් කෘතඥ විය. "ස්තුතියි, ක්රේදෝ මහත්මයා!"

වැඩිහිටියන් දෙදෙනා එකතු වී ඒ ගැන සුදුසු තීරණයකට එළඹෙතැයි ඔහු උදක් ම බලාපොරොත්තු වූයේය. සියල්ලට ම වඩා ඔවුන් මුහුණේ දැලි ගා ගැනීමට සූදානම් නැත.

රීතාගේ උපන් දිනයට පෙර දින ක්රේදෝ මහත්මයා තෑග්ගක් රැගෙන ආවේය. ඇත්ත වශයෙන් ම මච්බිමෙන් ආ අමුත්තා මුහුණේ දැලි ගා ගැනීමට කැමැති නැත ! විශාල පෙට්ටියෙහි නිකල් පැහැයෙන් බබළන රොකට්ටුවකි. ක්රේදෝ මහතා සිය මහත ඇඟිලිවලින් අල්ලා සෙල්ලම් බඩුව පෙට්ටියෙන් එළියට ගෙන හිසට ඉහළින් එසවීය.

"දැන් පෙන්වනවා, දැන් පෙන්වනවා !"

මව සහ පියා ඔහුගේ හඬින් තැග්ග නැරඹීමට එහි දිව ආවෝය.

"ආනේ ! මොන තරම් ලස්සනද?" යි අම්මා සතුටින් කෑගැවාය.

"ලස්සනයි ද? ඔබ තවම දුටුවේ නැහැ මෙහි නියම ලස්සන!" යි පුරසාරම් දෙඩූ ක්රේදෝ මහතා රොකට්ටුව මේසය මත සිටෙව්වේය. "කොහි සිට ද අපි මේක උඩ අරින්නේ ? කරගන්දාවෙන් ?[4] හා-හා-හා!" යි සිය විහිළුවෙන් ප්‍රමෝදයට පත් ඔහු හඬ නගා සිනාසුණේය. "ඔන්න එහෙනම් පහයි, හතරයි, තුනයි, දෙකයි, එකයි !"

ඔහු සෙල්ලම් රොකටයේ බොත්තම තද කරත් ම, එතුළින් සැබෑ රොකටයක හඬ නැංවෙන්නට වූයේ, එහි යටි පෙදෙසින් දීප්තිමත් ගිනි දලු පිට කරමිනි. මේ දැන් පෘථිවියෙන් ඉගිළී අජටාකාශයට ගමන් කරන්නට සූදානමින් මෙන් රොකට්ටුව ගැහෙන්නට වූයේය. දැන් දැන් එය නිවසේ සිවිලිමත්, වහලයත් විදගෙන ගුවන් ගත වනු ඇත.

ක්රේදෝ මහත්මයා යළිත් බොත්තම එබුවේය. ගිනි දැල් එසැණින් නිවී ගියේය. රොකටය නිහඬ විය.

"කොහොමද හාණ්ඩේ ?"

"අති විශිෂ්ටයි !" පියා කීවේය. "ඔය වගේ සෙල්ලම් බඩුවක් එක්ක මම ඉතා ම සතුටින් සෙල්ලම් කරනවා!"

---

4 කරගන්දාව - අභ්‍යවකාශ රොකට් ගුවන් ගත කිරීම සඳහා භාවිත කළ සෝවියට් දේශයේ නගරයකි.

"ඇත්තමයි, ඔය වගේ සෙල්ලම් බඩුවකට මම මගේ කැමතිම බෝනික්කා හුවමාරු කරගන්න වුණත් ලෑස්තියි !" අම්මා සතුටින් කීවාය.

"හැබැයි මේ ගැන වචනයක්වත් සංචෝට කියන්න එපා!" යි ක්රේදෝ මහතා ඉල්ලා සිටියේය. "එයාට පුදුම වෙන්න ඉඩ අරිමු !"

සැවොම ඒ තීරණයට එකඟ වූහ.

සංචෝ පාසල් ගොස් ගෙදර ආ සැණින් පියා ඔහු කැඳවීය.

"මෙන්න තෑග්ග !"

තෑග්ග දිළිසෙන කවරයක ඔතා ලස්සන පීත්ත පටියකින් ගැට ගසා තිබුණේය.

"මේක ඇතුළේ මොකද්ද තියෙන්නේ?" යි සංචෝ විමසීය.

"හෙට දැනගනින්. ඒක රීතාටයි, නුඹටයි පුදුමයක් !"

"ස්තුතියි පා ! ඔබට ආරංචි ද? මී කොං ගංගා ඩෙල්ටාවේදී[5] අපේ අය අධිරාජ්‍යවාදී රූකඩයන්ට යස රඟට බැට දීලා !

"මොනවා, අපේ අය?" යි ඉමහත් විමතියෙන් පියා සිහිවිකල වූවාක් මෙන් උඩ පැන්නේය. "කවදා ඉඳල ද ඔවුන් අපේ අය වුණේ ?"

"අපි අද ලෝහ වර්ග එකතු කළා... වියට්නාමයේ විරෝදාර සටනට උපකාර කිරීමට" යි සංචෝ කීවේය. "ඇයි? නරකද?"

5 වියට්නාමයේ මී කොං ගංගා ඩෙල්ටාවේදී ඇමරිකානු අධිරාජ්‍යවාදී හමුදාව අන්ත පරාජයකට පත් විය.

"එහෙනම් එකතු කළා..." යි පියා විපිළිසර ලෙස පැවසීය.

"ඔය යන විදියට තව සතියකින් දෙකකින් නුඹ පරිසමාප්ත පයනියර් භටයෙක් වේවි !"

අවසන් වැකිය කවටකමට හරවා ගැනීමට පියා කැමති වුවද, සංචෝ ඔහු දෙස විමතියෙන් බලා සිය කාමරයට පිය මැන්නේය.

"තෑග්ග හෙට අරගන්න. ඒක එළියට අරන් බලන්න තහනම්!" පිටව යන පුතුට පියා හඬ ගා කීවේය.

පසුදින අම්මා සිය පුතණුවන් උපන්දින සාදය සඳහා අන්දවන්නට වූවාය. ඇය අල්මාරිය හැර කමිසයක් එළියට ගත්තාය. හරියට ම එහි පපුව මත ගෙම්බෙකුගේ රුවක් සිත්තම් කොට තිබුණේය.

"මේක බොහෝම ශෝභනයි !" අම්මා කීවාය.

එහෙත් පුතාගේ පිළිතුර මෙසේ විය.

"ඒක නම් අඳින්න බැහැ !"

"ඒ මොකෝ සංචෝ?"

"මම රස්තියාදුකාරයෙක් නෙමෙයි" පුතාගේ පිළිතුර දැඩිය.

"රස්තියාදුකාරයෝ විතරයි ඔය වගේ ගෙම්බෝ අඳින්නේ. අපේ කොල්ලෝ ඕවා අඳින්නේ නෑ...!"

"එහෙනම් ඔයාලගේ කොල්ලෝ මොනවද අඳින්නේ ?"

"රතු ටයි පටි"

"හොඳයි" අම්මා ඉවසිලිවන්තව කීවාය. "මම තාත්තාගේ රතු ටයි පටියක් හොයලා ගන්නම්"

"තාත්තා- පයනියර් හටයෙක් නෙවෙයි ! එයාගේ ටයි පටිය ගැළපෙන්නේ නැහැ. මට දෙන්න නිකම් කමිසයක්"

අනතුරුව සංචෝ ධනපතියන් පළඳිතැයි චෝදනා කරමින් රත්තරන් පැහැ බොත්තම් කමිසය ද, ගැහැනු ළමුන් වැනි යැයි චෝදනා කරමින් ඔප දැමූ සපත්තු ද, සුවඳ විලවුන් සහ පොමාද ගා හිස පීරීම ද ප්‍රතික්ෂේප කර සිටියේය. අන්තිමේදී අම්මා සිත අමනාප කර ගත්තාය. මන්දයත්, සිය ආදරණීය පුතු අන් හැමදෙනාට ම වඩා ජේත්තුවට ඇඳ පැළඳ සිටීම ඇයගේ පැතුම වූ බැවිනි.

"මම පරක්කුයි නේද?" යි මිනිත්තුවක් පාසා සංචෝ ප්‍රශ්න නැගුවේය.

"දැන් වේලාව කීයද? අපේ ඔරලෝසුවේ වරදක් නැහැ නේද?"

"උත්සවයට කවුද එන්නේ?" යි අම්මා ඇසුවාය.

"අපේ ළමයි ටික තමයි" සංචෝ තෑගි පාර්සලය ඩැහැ ගත්තේය. "තව පොඩ්ඩෙන් ඒක අමතක වෙනවා!" යි කී ඔහු ගමනට පමා වූවාක් සේ කඩිනමින් පිට වී ගියේය.

****

නිවසේ ස්වාමි දුව රීතා ඔහුට දොර විවර කළාය.

"සංචෝ ! එන්න ඇතුළට, සංචෝ !"

සංචෝ එළිපත්ත මත සිටගෙන යන්තමින් පයක් නවමින් කදිම ලෙස හිස පහත් කොට ආචාර කළේය.

"රීතා නුඹට සුබ උපන් දිනයක් වේවා...! මෙන්න කරුණාකර අරගන්න..."

ඔහු දැරිය වෙත තෑගි පාර්සලය දිගු කළේය.

ඉරා සහ අලීසා දොරටුව වෙත දිව ආවෝය. ඔවුහු ඉතා කදිමට ඇඳ පැළඳ ගෙන සිටියහ. දුටු පමණින් ඔවුන් හැඳින ගැනීමට අපොහොසත් වූ සංචෝ ඔවුනට ද හිස නමා ආචාර කළේය. එය දැරියන් දෙදෙනාගේ සිත් ගත්තේය. ඔවුහු විනෝදයෙන් කුල්මත් වුව ද, රීතා ඔවුනට බාධා කළාය.

"යමු ! යමු !"

කෑම මේසය තවමත් ඉඳුල් කර නොතිබිණි. එය අතින් ඇල්ලීමට තහනම් මනහර ප්‍රදර්ශන කවුළුවක උත්සවාකාරී සිරියක් ගත්තේය. සුදු පැහැති රුවල් නැව් සිහිගන්වන කැඳ දමා මදින ලද අත්පිස්නා සෑම පිඟානක් මත ම සිටුවා තිබිණි. මේසය මත සම්පූර්ණ රුවල් නැව් හමුදාවක් ම සීරුවෙන් තැබුවාක් මෙන් ඒවා දිස්විය. අබ්‍රිකොස් දිග් දණ්ඩා සහ පළුදු වූ රාමුව සහිත උපැස් යුවළ පැලඳගත් ෂූරික් අසුන් මත හිඳ සිටියෝය. ඔවුන්ගේ පෙනුම පමණට වඩා විනීත ස්වභාවයක් ගත්තේය. හරියට ඔවුන් කළ තකතීරු කමකට දඬුවම් ලබා දෙන්නට විදුහල්පති නම හඬ ගසන තෙක් බලා සිටින්නාක් බඳු පෙනුමක් ඔවුන් කෙරෙන් දිස් විය.

සංචෝ සගයන්ට අතට අත දී ආචාර කොට ඔවුන් අසලින් හිඳ ගත්තේය.

"ඔයාලා මම්බෝ නටන්නේ නැද්ද?" යි ඔහු විමසීය.

ළමයි එකිනෙකා මුහුණින් මුහුණ බලා ගත්තෝ, පිළිතුරු නොදුන්හ.

"අපේ රටේ නම් කොලේජ් එකේ මම්බෝ නටනවා. පුංචි ළමයි පවා !" යි සංචෝ පැහැදිලි කළේය. "ඒක අපේ රටේ ජනප්‍රිය නැටුම් සම්ප්‍රදායක්"

ඉරා සිය කොණ්ඩ කරලේ කෙළවර ඇඟිලි තුඩුවලින් අඹරමින් මෙසේ කීවාය.

"අපටත් උගන්වන්නකෝ සංචෝ!"

"ඒක බොහොම ලේසියි. සංගීතය අවශ්‍යයි"

ඔහු අඩ ස්වරයෙන් මම්බෝ නැටුම් තාලය ගයමින්, විළුඹෙන් හඬක් නංවමින් රිද්මය ගත්තේය.

"එක පාරටම කියන්න ඇහැකි, නුඹේ සීයා නියම සංගීත ශිල්පියෙක් බව !" යි ෂූරික් කීය.

"සද්ද එපා!" යි ඉරා හරස් කැපුවාය.

"අනේ අපටත් පෙන්නන්නකෝ, එයා නුඹට තෑගි දුන්නේ මොනවාද කියලා" යි අලීසා ශබ්ද නගා රීතාගේ කනට කෙඳිරිය.

"පස්සේ" යි රීතා කීවාය. "මමවත් තාම දැක්කේ නැහැ"

"ඇයි මම තවම දැක්කෙත් නැහැ !" යි යෙහෙළියන්ගේ කතාවට මැදිහත්වෙමින් සංචෝ පැවසීය. "තාත්තා කිව්වා ඒක මට පුදුමයක් වෙයිලු"

"එන්න, අපි බලමු" යි අබ්‍රිකොස් යෝජනා කළේය.

"එන්න ! එන්න !"

ළමයි රංචුව හනික රීතාගේ කාමරයට පියඹා ගියෝය.

එහි මේසය මත සුවඳ වහනය වන තෑගි පාර්සලය තබා තිබුණේය.

කවරය ලිහා තෑග්ග විවර වී උපන් දින කාරියගේ අතෙහි අජටාකාශ යානය පෙනී සිටිත් ම සැවොම ඔල්වරසන් දුන්නෝය. ඉමහත් ප්‍රමෝදයට පත් සංචෝ තෑග්ග ස්පර්ශ කරන්නටත්, එහා මෙහා කරකවා බලන්නටත්, යානයේ වටකුරු කුඩා කවුළු තුළින් එබිකම් කරන්නටත් වීය.

"නොවරදවා ම ඒක වැඩ කරන්න ඕන" අබ්‍රිකොස් නුවණක්කාර ලෙස ප්‍රකාශ කළේය.

"බොත්තමක් තියෙන්න ඕන" යි ෂූරික් යන්ත්‍රය වටහා ගනිමින් පැවසීය.

ඔවුහු ඉක්මනින් බොත්තම සොයා ගත්හ. රීතා බොත්තම තද කළ සැණින් රොකට්ටුව පණ ලැබුවේය. එය වෙව්ලන්නට පටන් ගත්තේය. හඬ නගන්නට වූයේය. සංඥා එළි නිවි නිවී දැල්විණි. රොකට්ටුව යටින් රක්ත වර්ණ ගිනි දළු නැටවිණි.

"ඒක නම් මාර බඩුවක් !"

"පිටරට එකක් !"

"පියාඹන්නත් පුළුවන් ද?"

ඒ සියලු ප්‍රශ්න යොමු වූයේ සංචෝ වෙතටය. එහෙත් අවංකව ඔහු ද මේ අපූරු සෙල්ලම් බඩුව මුල්වරට දුටුවේ දැන්ය. එහෙයින් ඔහු නිරුත්තර විය.

ඒ මොහොතේ අල්ලපු කාමරයේ සිට රීතාගේ මවගේ කටහඬ රැව් දුන්නේය.

"ආදරණීය අමුත්තනි, කෑම මේසයට ආරාධනා කරන්නෙමි !"

ළමා කැළ යළිත් කෑම මේසය අසල පෙනී සිටියෝය.

කෑම මේසය අසල දී සංචෝ මහලු මිනිසෙකු දුටුවේය. කළු පැහැති කබායක් හැඳ සිටි ඔහු අත සැරයටියකි. පෙනෙන හැටියට එම සැරයටිය දිවිය පුරාම ඔහු සමග සිටි සගයෙකු මෙනි. ඔහුගේ මුහුණෙහි එක් පසෙක පැරණි පිළිස්සුම් තුවාලයක සලකුණකි. එම නිල් පැහැති පිළිස්සුම් සලකුණ මහල්ලාගේ මුහුණට අමුතු පෙනුමක් ආරූඪ කළේය.

"සීයේ, සීයේ !" යි රීතා උස් හඬින් කෑගැවාය.

"හඳුනාගන්න මේ මගේ යාළුවා සංචෝ ! එයාගේ සීයාත් යුද්ධෙට ගියා. එයා... සංචෝ, නුඹේ සීයා යුද්ධෙදි කවුරු හැටියට ද උන්නේ?"

"ආයුබෝවන් !" යැයි සංචෝ සීයාට ආචාර කළේය. "එයාගේ නම හුයන් - මරියා... ඔබට එයාව යුද්ධෙදි මුණ ගැසුණේ නැද්ද? "

රීතාගේ සීයා හිස වැනුවේය.

"ඇත්ත තමයි, කොහොම මුණ ගැහෙන්නද?" යි යමක් අවබෝධ වූවාක් මෙන් සංචෝ දොම්නසින් පැවසීය. "මගේ සීයා බැංචෝ කාරයෙක් විතරයිනේ"

"ආදරණීය සංචෝ, තේරුම් ගනින්" යයි කී රීතාගේ සීයා හැඟුම්බර විය. "ඒ මහා යුද්ධයේ දී දිවි පිදුවේ කවුද - ඔහු වීරයෙක්. කොටින් ම කරත්තයක් දක්කපු කෙනා පවා... නැත්තම් යුද පෙරමුණට ලියුම් රැගෙන ගිය කෙනා පවා..."

"ඒ කියන්නේ මගේ සීයාත් වීරයෙක් ද?" යි කඩිනමින් සංචෝ ප්‍රශ්න කළේය. පිළිතුරක් බලාපොරොත්තුව නොසිටි ඔහු මෙසේ ද එකතු කළේය. "ඒ වගේ ම වීරයෝ හැමෝම මිය ගියේ නැහැ නොවැ?"

උසැති දේහධාරී හමුදා නිලධාරියෙක් කාමරයට ඇතුළු විය. ඔහුගේ සමතලා දිළිසෙන කෙස් වැටිය අකලට පැසුනාක් මෙනි.

"නුඹේ සාගරයෙන් එපිට මිතුරාට මාව හඳුන්වා දෙන්නේ නැද්ද?" යි ඔහු රීතාගෙන් ඇසුවේය. "සංචෝ ? නුඹේ නම සංචෝ නේද?" යි අසමින් සංචෝ වෙත සමීප වූ නිලධාරියා සිය අත, කොලුවාගේ උරය මත මිතුරු ලෙස තැබුවේය. "නරක නැහැ, අපි දෙන්නාගේ ගැළපීම. සංචෝ පංසා සහ දොන් - කිහොත්. මොකද කියන්නේ ගැළපෙනවා නේද?"

ඔහුගේ විහිළුවෙන් සැවොම සිනාසෙන්නට වූහ.

පසුව අමුත්තෝ මේසයට හිඳ ගත්හ. භෝජන සංග්‍රහය ඇරඹිණි. ළමුන් මේසයේ එක් පසෙකට රැස් වූයේ වැඩිහිටියන්ගෙන් වෙන්වන්නටය. ළමුන්ට තමන්ට වෙන් වූ කතාබහ, විහිළු සහ රහස් තිබුණේය. වැඩිහිටියන්ගේ ලෝකයට එය නොපැහිණි.

සංචෝ හට තමා අවට සියලු දේ පුදුමාකාර අත්දැකීමක් විය. ඔහු තවමත් කිසිම දෙයක් නොකෑවේය. යන්තමින් හෝ ඔහු ගැරුප්පුව අතට ගත්තේ රීතාගේ විධානය සමගිනි.

"කන්න !"

කාමරයේ මුල්ලක සිටුවා තිබූ, පිළිස්සුම් සලකුණු සහිත රිදී පැහැ අවරපෙත්ත දෙස සංචෝ විටින් විට බැලුම්

හෙලුවේය. එය අසල බිත්තියේ එල්ලා තිබූ පින්තූරයේ නිරූපිත යුද ගුවන් නියමුවා, එහි සිටි වැඩිහිටියන් අතරෙහි ඔහු සොයන්නට වෑයම් කළේය. ඇයගේ පියා කවුදැයි රීතාගෙන් අසා දැනගන්නට පළමුව ඔහු තීරණය කළ ද, පසුව ඒ අදහස වෙනස් කර ගත්තේය.

අවරපෙත්ත අසලින් කැබිනෙට්ටුව මත සංචෝගේ තෑග්ග සිටුවා තිබුණේය. සිය අසල්වැසි ගුවන් සගයා අසල එය නිකම් පුහු සෙල්ලම් බඩුවක් නොව, පරිමාණයෙන් පමණක් කුඩා නියම රොකට්ටුවක් ලෙස පෙනී සිටියේය.

"කහ සරුංගලේ සැපදුක් කොහොමද?" යයි හිටිගමන් ෂූරික් ප්‍රශ්න කළේය.

"ඕ ! ගිම්හාන ඍතුව එනතුරු එයා ඇඟිලි ගනිමින් බලා ඉන්නවා" යයි සංචෝ සතුටින් පිළිතුරු දුන්නේය. "අපට පුළුවනි ජලය මත එයා සමග වේගයෙන් පාවී යන්න. හැබැටම කොහෙන් ද අපි ජලය මත පදින්න ගන්න ලීෂී පටි සොයාගන්නේ ?"

"කොහෙන් හරි හොයාගමු" අබ්‍රිකොස් උදාසීනව කීවේය.

"අනේ...! කොයි තරම් අපූරු ද?" යි ඔල්වරසන් දුන් අලීසා උඩ පැන්නාය.

ළමුන් ආහාර ගනිමින් එකිනෙකා හට කොඳුරන්නට වූයේ කුමන්ත්‍රණකරුවන් මෙනි. ස්වකීය රහස් වැඩිහිටියන් සමගින් බෙදා හදා ගන්නට ඔවුහු කොහෙත් ම කැමති නොවූහ.

පසුව උසැති හමුදා නිලධාරියා ගිටාරයක් අත ඇතිව පෙනී සිටියේය. ඔහු ගීයක් ගයන්නට වූයේය. යළි ගුවන්

තොටුපොළට නොපැමිණි ගුවන් නියමුවෙක් ගැන එම ගීතයෙන් කියැවිණි.

දුර ඈත කොහේදෝ - වලා මත ඉතිරි වූ
සිසිල් වී වියැකෙනා - උණුසුම් සලකුණු
දයාබර මවුබිමේ ගිනිගත් දෑතින්,
බදා වැළඳගති, නියමුවා ගුවන්...

ඔහු මතින් ඇවිල නගිනා ගිනි දලු
අතර අරුණෝදයේ වැතිර ලේ විලක් මැද
අඟහරු ලොවේ සිට යළි පැමිණියා මෙනි,
ගුවන් ගැබ දැවී ගිය තරුවක්...

සංචෝ එම දුක්බර හමුදා ගීතයට බලවත් හැඟීමකින් සවන් දී සිටියේය. එම ගීතය ගැයෙන්නේ තම සීයා පිළිබඳව යැයි ඔහුට හැඟුණේය. ඔහු ගුවන් නියමුවෙකු නොවූව ද, ඔහුට එහි වෙනසක් නොදැනිනි.

භෝජන සංග්‍රහය අවසන් වූ පසු අමුත්තෝ මේසයෙන් නැගී සිටියෝය. සංචෝ අවරපෙත්ත අසලට විත් මහත් ආසාවෙන් එය අතගෑවේය.

"ගුවන් නියමුවෙකු වීමට ඇත්නම්... මොන තරම් අපූරුද?" යි ඔහු තෙපළීය. එවිට රීතා ඔහු දෙස අවධානයෙන් බලා සිටින අයුරු ඔහුගේ නෙත ගැටිණි.

"රීතා, නුඹ කවුරුවෙන්නද කැමැති? මෝස්තර නිරූපිකාවක්?"

දැරිය නැතැයි හඟවමින් හිස වැනුවාය.

"එහෙනම්... රූපවාහිනී නිවේදිකාවක්?" සංචෝ අනුමාන කළේය. "අපේ රටේ කොලීජියේ ඔක්කොම ගැහැනු ළමයි හීන දකින්නේ රූපවාහිනියේ..."

"මම කැමති පියාඹන්න !" යි රීතා එක්වරම කීවාය.

"එහෙනම් නුඹ කැමති... ගුවන් සේවිකාවක් වෙන්නයි?" අන්තිමේදී සංචෝ අනුමාන කළේය.

එහෙත් රීතා නැතැයි හඟවමින් උරහිස් වැනුවාය.

"මට ඕනා ගුවන් යානා පරීක්ෂණ නියමුවෙක් වෙන්නයි, එතකොට නුඹ?"

කාමරය තුළ දැනටමත් ඔවුන් දෙදෙනා හැර කිසිවෙක් නොවූහ. සංචෝ සිය යෙහෙළිය දෙස මවිතයෙන් බැලුවේය. පසුව ඔහු හැඟුම්බර ලෙස විනාශ වූ ගුවන් යානයේ සීතල අවරපෙත්තට සිය කම්මුල තද කර ගත්තේය.

"තාත්තා කියනවා, සැබෑ දේ ගැන විතරක් හිතන්නලු... සමහර විට මම කොම්පැනියේ කොටස්කාරයෙක් වේවි..."

"නුඹ කැමති ද සංචෝ ධනවාදියෙක් වෙන්න?" යි රීතා ඔහුට ඒත්තු ගන්වන්නට මෙන් ප්‍රශ්න කළාය. "නුඹට තමුන්ගෙම සිහින නැද්ද?"

"මමත්... ආසයි පියාඹන්න" යි මොහොතක් කල්පනාවේ නිමග්නව සිටි සංචෝ පැවසීය. "නමුත් අපේ රටේ ගුවන් නියමුවෙකු වීම කොහොමටවත් කළ නොහැකි දෙයක්. ඊටත් වඩා ගුවන් යානා පරීක්ෂා කරන්න අපට අපේ ම කියලා ගුවන් යානා නැහැ... අපි මිලදී ගන්නේ පරීක්ෂා කර අත්හදා බැලූ ඒවා..."

සංචෝගේ හදවතේ දැඩි ශෝකයක් හට ගත්තේය. රීතා ඔහු වෙත සමීපව සතුටින් මෙසේ කීවාය.

"දුක් වෙන්න එපා සංචෝ? කවුද දන්නේ බාගදා නුඹ ඇත්තට ම ගුවන් නියමුවෙක් වේවි !"

ඇය සෙල්ලම් අජටාකාශ යානය පණ ගැන්වූවාය. එක්වරම එය ගිනි දලු නංවමින්, ගැහෙමින් දූන් දූන් ගුවන්ගත වීමට සූදානම් වන්නාක් මෙන් සංඥා එළි දල්වූයේය.

8

එදින රාත්‍රියේ දිගු වේලාවක් නිදි නැතිව ඔහු බලා සිටියේය. දනටමත් කවුළුවට එපිට වීදියේ ඉඳහිට කලාතුරකින් පමණක් මගියෙකුගේ පා ගැටෙන හඬ නද දුන්නේය. නගරය මධ්‍යයේ සිට වරින් වර දුම්රිය නගන 'හූ' හඬ යන්තමින් ඇසුණේය. සංචෝ විවර කරගත් දෑසින් ඇඳ මත වැතිර සිටියේය. ඔහු ඉදිරියේ තිරයක් මත සිතුවමක් දිග හැරෙන්නාක් මෙන් රීතාගේ උපන් දින සාදය මැවී පෙනුණේය. ඔහුට ප්‍රීතිමත් ළමුන්ගේ මුහුණු පෙනුණේය. ඔවුන්ගේ කටහඬ ඇසුණේය. රස කැවිලිවල සුවඳ දැනුණේය. එපමණ ද? පිළිස්සුම් සලකුණු සහිත අවර පෙත්තේ සිසිල් ලෝහයේ පහස ද ඔහුගේ කම්මුලට දැනුණේය.

උසැති හමුදා නිලධාරියා - දොන් කිහොත් - ගිටාරය වයමින්, සටනට ගොස් යළි නොආ ගුවන් නියමුවා පිළිබඳ ගීතය ගයන සැටි ඔහු අසා සිටියේය. එම ගීතය කොතරම්

පැහැදිලිව ඔහුට ඇසුණේ ද යත්, කොහේදෝ ළඟ පාත තැනකින් එය පැන නැංගාක් මෙනි.

සංචෝ දෙනෙත් හැර ඇඳ මත හිඳ ගත්තේය. ගීතයේ හඬ දිගටම ඇසෙයි. එය අල්ලපු කාමරයේ සිට පැතිරෙන්නාක් මෙනි. කොලුවා ඇඟිලි තුඩුවලින් රහසේ ඇවිදිමින් පියාගේ කන්තෝරු කාමරය වෙත ඇදුණේය. ඔහු එහි දොරටුව යන්තමින් විවර කොට කන් දුන්නේය. විවර කළ දොර තුළින් ගීතයේ හඬ වඩාත් උස්ව ඇසුණේය.

නිවී ඇද වැටුණු තැන පෙන්වන්න මෙන්,
ගුවන් ගැබ දිළිසෙනා තරුවක් ය...
ගිගුම් දෙන මහ හඬින් ඉහළ නැගි,
ගුවන් යානා බල ඇණියේ මිතුරු කැල,
වහා පියඹා විත් ඇද වැටුණු තරුව වෙත,
නිසල නියමුවාගේ සීතලව ගිය සිරුර
වසා දමුවා සෙබළ - කබායෙන් උණුසුම්...

සංචෝ දොරටුව අසල කමිසයක් රහිතව සිටගෙන සිටියේය. හුරු පුරුදු, ශෝකාන්විත ගීතය ඉතා සමීපව ගැයුණේය. සිය පියාගේ කන්තෝරු කාමරය ඉදිරිපිට නොව රීතලාගේ නිවසේ කෑම කාමරයේ සිටගෙන ඉන්නාක් මෙන් ඔහුට හැඟුණේය.

සංචෝ කන්තෝරු කාමරයට හීන්සැරේ එබිකම් කළේය. ක්රේදෝ මහතාගේ වටකුරු නැබුලු පිට ඔහුගේ නෙත ගැටුණේය. සිහින් කලිසම් පටි ක්රේදෝ මහතාගේ දෙවුර හරහා කතිර හැඩයට වැටී තිබුණේය. කාලවර්ණ බොකුටු හිසකේ මැද රෝස පැහැ තට්ටය දිළිසිණි. මවිබිමෙන්

ආ අමුත්තා ඉදිරි පිට රේඩියෝ යන්ත්‍රයකි. ඇතැම් විට ගුවන්විදුලිය මගින් එම ගීය ප්‍රචාරය කරනවා විය යුතුය.

හරියට ම ඒ මොහොතේ ගීතය අවසන් විය. රේඩියෝ යන්ත්‍රය තුළින් හුරු පුරුදු කටහඬක් ඇසුණේය. සංචෝ ඒ කටහඬ හඳුනා ගත්තේය. ඒ රීතාගේ සීයාගේ කටහඬයි. අනතුරුව උසැති හමුදා නිලධාරියාගේ කටහඬ - ඊළඟට රීතාගේ... සංචෝ තුළ ඉවසිය නොහැකි ලජ්ජාවක් ඇති විය. තමා පිට ගෙදරක දොරටුව අසල හොරෙන් සැඟවී පිට අයගේ කතබහට රහසේ සවන් දෙන්නාක් වැනි ජුගුප්සාජනක හැඟීමක් ඔහු කෙරෙන් පැන නැග්ගේය. නැත ! රහසේ සවන් දෙන්නේ ඔහු නොවේ. මච්ඡිමෙන් ආ අමුත්තාය. ඔහු රීතලාගේ නිවසට හොරෙන් රිංගා සිය ඉදිකටු වැනි විනිවිදින දෑස් ගෙතුළට යොමු කරයි. අහා ! එවැනි දෙයකට ඔහු කෙසේ නිර්භීත වූයේ ද? සංචෝ ඉමහත් ආවේගයකින් කන්තෝරු කාමරයේ දොර හැරියේය.

"ක්රේදෝ මහත්තයා?"

අමුත්තා එක්වරම තිගැස්සී, පහතට නැඹුරු වූයේ, ඔහුගේ හිස පිටුපසින් ප්‍රහාරයක් බලාපොරොත්තු වූවාක් මෙනි. ඔහු සෙමෙන් හිස හැරවීය. සංචෝ දුටු ඔහුගේ වත සුදුමැලි විය.

එම තරබාරු මිනිසා, සංචෝ වෙත එක්වරම පිම්මක් පැන්නේ, ඇදහිය නොහැකි තරම් සැහැල්ලු කඩිසර විලාසයකිනි. 'දඩස්' ගා හඬ නංවමින් වැරෙන් දොරටුව වසාලූ ඔහු යතුරු තහඩුව දෙවරක් කරකවා දොරගුලු ලෑවේය.

කුමක් කළ යුතු දැයි නොදත් සංචෝ වසා දැමූ දොර අසල තාන්තුවාවෙන් සිටගෙන සිටියේය. ඔහුගේ සිතුවිලි

නොසන්සුන්තාවයෙන් සහ අසීරුවෙන් පෙළුණේය. කුමක් හෝ කළ යුතුයි ! රීතාට අනතුරු ඇඟවිය යුතුයි ! ක්රේදෝගේ රේඩියෝ යන්ත්‍රය වහාම නිහඬ කළ යුතුයි !

රීතාට තෑගි දුන් කුඩා අජටාකාශ යානය ඔහුගේ මතකයට ආවේය. එම රොකට්ටුව අසීරු අත්හදා බැලීමකදී විනාශ වූ ගුවන් යානයේ අවරපෙත්ත අසලින් තබා තිබුණේය. එම රොකට්ටුව රැගෙන ආවේ ක්රේදෝ මහතා නොවේද? තරබාරු වටකුරු පිට කොන්ද, රෝස පැහැ තට්ටය, රේඩියෝ යන්ත්‍රය, රීතලාගේ නිවසේ සිදුවන දෑ - මේ සියල්ල ඔහුගේ හිස වටා භ්‍රමණය වෙමින් යළි යළිත් මැවී පෙනුණේය.

නැත ! එය කිසිසේත් සාඩම්බර අජටාකාශ යානයක් නම් නොවේ ! එය චර පුරුෂ යානයකි ! පාවා දෙන්නෙකි ! ද්‍රෝහියෙකි!

වැසුණු දොරටුවට සංචෝ පිටු පෑවේය. සිය ඇඳ වෙත යළි හැරී ආ ඔහු කඩිනමින් ඇඳුම් ඇඟලා ගත්තේය.

****

කබායේ බොත්තම් පියවීම පවා අමතක කර දමමින් ඔහු නිවසින් එළියට පැන දුවන්නට පටන් ගත්තේය. දන්න හඳුනන ගෙවල් දොරවල්, මංසන්ධි, නිවා දැමුණු ප්‍රදර්ශන කවුළු, නිදිගත් සංඥා කුලුනු පසු කරමින් ඔහු වේගයෙන් දිව්වේය. නගරයෙන් පිටත කොහේදෝ ඈතක සිට සුළං පහර විසින් උණුසුම් පාන් සුවඳක් රැගෙන එන ලදී. නොබෝ දිනකින් මුළු මහත් පරිසරයම හරිත පැහැයෙන් බබළවන්නට සූදානමින් කුඩා පොහොට්ටු වන් දලු රිකිලි ලියලන, තුරු ගොමුව අන්ධකාරයේ ගැලී තිබුණේය. එහෙත් සැඟවී රැක

සිටින වසන්තයේ ශෝභාව සංචෝ නොදිටීය. ඔහු වේගයෙන් දිව ගියේය. සටනට ගොස් යළි නොපැමිණි ගුවන් නියමුවා පිළිබඳ ගීතය ඔහුගේ සවන් තුළ රැව් දුන්නේය. දැන් සංචෝ සටනට යමින් සිටියි. ඇතැම් විට ක්රේදෝ මහතා පාලනය කරන ඒ රහස් සංග්‍රාමයෙන් ඔහු යළි නොපැමිණෙනු ඇත. අහෝ ! ඒ නපුරු ක්රේදෝ ! රීතාගේ පියා යුද ගුවන් යානා අත්හදා බලන්නෙකු බව දැනගත් ඔහු සිය අදෘශ්‍යමාන සහකරු කුට ලෙස රීතාගේ නිවසට රිංගවූයේය. කඩිනමින් එහි යා යුතුය! මච්බිමෙන් ආ අමුත්තාට දැන ගැනීමට අවැසි වැදගත් යමක් ඔවුන්ගේ නිවසේ කතා බහ වෙනවාට පෙර එහි දිව යා යුතුය.

සංචෝට දෙගා බල්ලා සිහි විය. පාදය උළුක්කු වී හිම මත අසරණව වැතිර සිටිය දී ඒ ශක්තිමත් විශාල සුනඛයා, දිවැවිත් ඔහුගේ කම්මුල උණුසුම් දිවෙන් ලෙව කැවේය. ඔහුට දැන් ෂූරික් මෙන් කැගසා විධානය දීමට අවැසි විය. "දෙගා - මා ළඟට" ඇත්ත වශයෙන් ම දෙගා සමත් වන්නේ කම්මුල ලෙවකෑමට පමණක් නොවේ. සතුරන් හඹා ගොස් අල්ලා ගැනීමට ද ඌ හපනෙකි. දැන් ඌ දිවැවිත් ක්රේදෝ මහතාගේ කරින් අල්ලා ගතහොත් කොතරම් අපූරු ද?

සඳලුතල උරෙන් උසුලාගත් රැවුළුකාර ශෛලමය ප්‍රතිමාවන්ගෙන් සමන්විත නිවස හමුවන තෙක් සංචෝ නොනැවතී දිව්වේය.

මේ අතර ක්රේදෝ මහතා රේඩියෝ යන්ත්‍රයට සවන් දී සිටියේය.

"කවුද ඒ?" යි එක් කටහඬක් ප්‍රශ්න කරන සැටි රේඩියෝවෙන් ඔහුට ඇසුණේය.

"පරක්කු වුණු අමුත්තෙක් වගෙයි" තවෙකෙක් කීවේය.

"ආ - සමහරවිට සුබ පැතුම් විදුලි පුවතක් වෙන්න ඇති !"

එවිට එක්වරම කැලඹිලි සහගත කාන්තා කටහඬක් රේඩියෝවෙන් නිකුත් විය.

"සංචෝ! මොකද මේ? මොකද මේ නුඹේ මුහුණට වෙලා තියෙන්නේ ? කවුරු හරි නුඹට බැන්නද?"

එවිට කොලුවාගේ වේගවත් හතිලෑම ක්රේදෝ මහතාගේ සවනෙහි වැකිණි. කොලුවා කිසිත් නොබිණීය. වේගයෙන් හුස්ම ගන්නවා පමණකි.

එසැණින් මහා පිපිරුම් හඬක් නික්මිණි. අනතුරුව රේඩියෝ යන්ත්‍රය ගොළු විය.

ක්රේදෝ මහතා රේඩියෝව සුසර කළේය. එහෙත් එය නිෂ්ඵල කාරියකි. රේඩියෝ යන්ත්‍රය නිහඬය. පසුව එයින් කැඩුණු කටහඬවල්, සංගීත ඛණ්ඩ සහ විවිධ සංඥා හඬ අපැහැදිලි ලෙස ඇසුණේය. එහෙත් ඒ කෙසෙල් කොම්පැනියේ නියෝජිතයාට අවැසි වූ දේ නම් නොවේ.

මවුබිමෙන් ආ අමුත්තාට සිදු වූ සියල්ල සැණින් වැටහිණි. ඔහු ඉක්මනින් දොර වෙත ගොස් එය හැරියේය. සංචෝගේ ඇඳ හිස්ය. හිතුවක්කාර කොලුවාගේ ඇඳ මත ඉබේටම ඉන්ද වුණු අමුත්තා දෑතින් හිස බදා ගත්තේය.

****

සංචෝ කාමරය මැද සිට ගෙන සිටියි. ඔහුගේ දෙපා අබියස කැබලි වූ අජටාකාශ යානය වැටී තිබුණේය. එහි දිළිසෙන ආවරණය පොඩි වී, ගිනි දලු සංඥා එළි නිකුත් කළ

විදුලි පහන් බිඳී ගොස් ඇත. රොකටයේ බිඳුණු බඳ තුළින් වයරයක් එළියට පැනලාය.

"සංචෝ ! මොකද්ද මේ වැඩේ තේරුම, ආ?"

ඔහුගේ අතින් අල්ලා අදිමින් රීතා සංවේගයෙන් ප්‍රශ්න කළාය.

"ඒ මිනිහා... අමුත්තා... අහගෙන ඉන්නේ..." යයි කොලුවා කොඳුරන්නට වූයේය.

"මොන අමුත්තා ද? ඇයි නුඹ ඒ වටිනා තෑග්ග පොළොවේ ගැහැව්වේ?"

"ඒ තෑග්ග... ඔත්තුකාරයෙක් !"

"ඔත්තුකාරයෙක්?"

රීතා කිසිත් වටහාගත නොහී සංචෝ දෙස බැලුවාය. උසැති හමුදා නිලධාරියා අසුනින් නැගී සිටියේය. ඔහු සංචෝ වෙත විත් බිම වැටී කැබලි වූ අජටාකාශ රොකටය ඇහිඳ අතට ගෙන සිය සාක්කුව තුළින් පෑන් පිහියක් එළියට ගත්තේය.

"හොඳයි, අපි බලමු !" යයි කී ඔහු අවාසනාවන්ත සෙල්ලම් බඩුව කැබලිවලට කඩා වෙන් කරන්නට පටන් ගත්තේය.

"එයා ආවා... ඇවිත් මට දුන්නා... මේ තෑග්ග... එයා හැම දේම අහගෙන ඉන්නවා..." යි කඩින් කඩ වචන ගොත ගසමින් සංචෝ කාරණය පැහැදිලි කරන්නට වෑයම් කළ ද, සිදුව ඇති දේ ක්ෂණයකින් සැවොම වටහා ගත්හ.

"සටන තවමත් ඉවර නැහැ වගේ..." යි රීතාගේ සීයා සෙමෙන් පැවසීය.

"දැන් ඉතින් මං විනාශයි ! මගේ තාත්තාව කොම්පැනියෙන් පන්නා දමාවි!"

සංචෝ හැරුණේය. ඔහුගේ දෙනෙත් රීතාගේ දෙනෙත් හා හමු විය. ඔහුගේ මිතුරිය ඔහු අසලින් ම සිටගෙන සිටියා, ඉමහත් අවධානයෙන් ඔහු දෙස බලා සිටියාය. ඇයගේ දෙනෙත් තුළ දෝෂාරෝපණයක් දකින්නට ඔහු අපේක්ෂා කළ ද, එහි ගැබ්ව ඇත්තේ මුළුමනින් ම වෙනස් අරුතකි. අළු - නිල් පැහැති රීතාගේ දෙනෙත් පුදුමාකාර නොසන්සුන් බවකින් දැල්විණි. මීට නොබෝ කලකට පෙර සංචෝ සිය නිර්භීතභාවය පෙන්වමින්, දුම්රිය වේල්ල මත දී දුවන දුම්රියේ රෝද අසලින් ම අඹ යුෂ ටිං බඳුන ඇදගත් අවස්ථාවේදී ඔහු එවැනි දිදුලන දෑසක් ඇයගෙන් දිටීය.

"නුඹ සැබෑ මිතුරෙක්, සංචෝ !" යි හැඟුම්බර ලෙස ඇය සෙමෙන් කීවාය.

"ඇත්තම ද?"

"ඇත්තමයි !"

කෘතඥතාව පිරි බැල්මකින් සංචෝ සිය මිතුරියට සංග්‍රහ කළේය. ඇය මේ අසීරු මොහොතේ සිය මිතුරා කෙරෙහි විශ්වාසය තැබුවාය. ඒ හරියටම පෙර දිනක දුම්රිය වේල්ල මත දී ඔහු සිය නිර්භීතභාවය පෙන් වූ දිනයේ දී මෙන්ය. වැදගත් ම දෙය මිතුරන්ගේ විශ්වාසයයි. එවිට අන් කිසිවක් බියකරු නොවේ !

හමුදා නිලධාරියා සෙල්ලම් බඩුව පරීක්ෂා කොට අවසන් කළේය.

"මෙන්න පුංචි මයික්‍රෝෆෝනයක් !" යයි කී ඔහු සූක්ෂ්ම ලෙස සැකසූ කුඩා කෝෂයක් සිය අත්ල මත තබා පෙන්වූයේය.

"හැබෑටම මේ ක්‍රේදෝ මහතා අදහස් කළේ මොනවාද? මේ නිවසින් ඔහුට දැන ගැනීමට උවමනා රහස් මොනවාද?"

"රීතාගේ තාත්තා යුද ගුවන් යානා අත්හදා බලනවා" යි පැවසූ සංචෝ අවර පෙත්ත අසල බිත්තියේ එල්ලා තිබූ ගුවන් නියමුවාගේ සේයාරුව දෙස බැලුවේය.

"ඒ මගේ තාත්තා නොවෙයි!" යි රීතා උස් හඬින් කීවාය. "ඒ මගේ සීයා ! සීයේ... දැක්කද, සංචෝ ඔයාගේ පින්තූරේ මගේ තාත්තා යැයි වරද්දගෙන... මගේ තාත්තා නාවිකයෙක්... එයා දැන් ගොඩාක් ඈත ඉන්නේ..."

"අනේ මම හිතුවේ ඒ ඔයාගේ තාත්තා කියලයි..." සංචෝ ලජ්ජාවෙන් රතු වෙමින් සරදම් සිනාවක් පෑවේය. "ඒ වගේ ම ක්‍රේදෝ මහත්මයාත් හිතුවේ... ඒ ඔහු කියලා..."

"නුඹේ මහත්තයා පරක්කු වැඩියි පුතේ... ඒක සිද්ධ වෙලා දැන් අවුරුදු විස්සකටත් වැඩියි." සරදම් සිනාවක් පෑ රීතාගේ සීයා පැවසීය. පසුව සිනාව නැවැත් වූ ඔහු බැරෑරුම් වෙසක් මවා ගත්තේය. "නුඹේ සීයා පැසිස්ට්වරුන්ට එරෙහිව යුද්ධයේ දී වීරයෙක් ලෙස දිවි පිදුවා... සංචෝ, නුඹත් නුඹේ සීයාට බොහොම සමානයි"

"ඇත්තම ද?" කොලුවාගේ වත ආලෝකමත් විය. "සීයා වගේ ම ද?"

****

ඒ අතර සංචෝගේ නිවසේ තත්ත්වය ව්‍යාකූල විය. මව සහ පියා සංචෝගේ කාමරයේ දොරකඩ සිට ගෙන උන්නෝය. සිය පුතුගේ සයනය මත හිඳ දෑතින් හිස බදාගෙන හුන් අමුත්තා දෙස ඔවුහු මවිතයෙන් බැලුවෝය.

"ක්රේදෝ මහත්මයා, කෝ සංචෝ ?"

"සංචෝ ?" යි ප්‍රශ්න කළ අමුත්තා හිස එසවීය.

"ඔව්, මම ටක්කෙටම කියන්නම්. කොහේද ඔහේලගේ මහ ලොකු පුතණ්ඩියා ඉන්නේ කියලා. උන්දෑ ගියා තමුන්ගේ ගරු කටයුතු අමුත්තාව පාවා දෙන්න... හාම්පුතාව පාවා දෙන්න..."

"මොකක්? පාවා දෙන්න? හැබෑවට ම ඔබව පාවා දෙන්න ඇහැකිද?" යි අන්දුන් කුන්දුන් වූ පියා විමසීය.

"ඇහැකියි ! ඇහැකියි ! අපොයි, ඒ කැත වැඩේ උඹේ පුතණ්ඩියා කළා රොද්‍රිගෙස් ! හිඳ ගනින්, දැන් ඉතින් එනතුරු බලාගෙන ඉමු !"

"සංචෝ එනතුරු ?" යි අසමින් පියා ඇඳ මත හිඳගත්තේය.

"අපොයි නැහැ ! දැන් දොරේ සීනුව හැඬවේවි. සද්දන්ත මහත්තුරු දැන් ඉතින් මාව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුව අරගෙන ඒවි !"

"මොකක්? අත්අඩංගුවට ගන්න?"

"ඔව්, ඔව්... ඔත්තු බැලීමේ චෝදනාවට..."

"ඔබ?" තිගැස්සුණු පියා ඇඳෙන් නැගී සිටියේය. "ඔබ... ඔත්තු බැලීමේ චෝදනාවට ?"

"අනේ දෙයියනේ, මොන තරම් නීච වැඩක් ද?" යි පිළිකුලෙන් කී අම්මා සුසුම් ලෑවාය.

එවදන් කන වැකුණු සැණින් ක්රේදෝ මහතා කඩියෙක් දෂ්ට කළාක් මෙන් උඩ පැන්නේය. ඔහු සිය විනිවිදින දෑසින් ඇය දවා හළුකර දැමීමට මෙන් බැලුවේය.

"එතකොට ඔහේලා? ඔහේලාට රසවත් කෑම බීම එපාද? ගෙවල් දොරවල්, යාන වාහන එපාද? නවීන ගේ දොර උපකරණ?"

"කිසි දෙයක් එපා!" යි අම්මා තෙපළුවාය. "අපට ඔය කිසි දෙයක් එපා"

"එය මාතෘ භූමියේ අවශ්‍යතාවක් !" යැයි එක්වරම ස්වාධිකාරී ලෙසින් අමුත්තා ප්‍රකාශ කළේය.

"ශබ්දයේ වේගය පරයන යුද ගුවන් යානා පිළිබඳ රහස්වලින් අපේ මාතෘ භූමියට ඇති පලය කුමක්ද? අඩුම තරමින් සාමාන්‍ය සැහැල්ලු ගුවන් යානයක්වත් අපේ රටේ නිෂ්පාදනය නොකරන විට?" යි පියා සන්සුන්ව තර්ක කළේය. "ඔබ කා වෙනුවෙන් ද වැඩ කරන්නේ, ක්රේදෝ?"

"ඒයි, රොද්‍රිගෙස් ! අමතක කරන්න එපා තමුසේ තවමත් මගේ සේවකයා ! සුළුවෙන් තකන්න එපා ! සුළුවෙන් තකන්න එපා! තමුන්ගේ පුතණ්ඩියා ගැන ලජ්ජා වෙයන් !"

"මම එයා ගැන ආඩම්බර වෙනවා" යි සෙමෙන් කී අම්මා තරවටු බැල්මකින් අමුත්තා නිහඬ කරවීය.

****

අහෝ, එම අවාසනාවන්ත තෑග්ග ! සිහිනෙකින්වත් නොසිතූ විරූ ලෙස නින්දා සහගත ඉරණමකට ගොදුරු වූ අජටාකාශ යානය... අහිමි වූ අතීත දිළිසීමෙන් යුතු, බිඳී පොඩි පට්ටම්ව ගිය අජඨාකාශ යානය සිය ගමන් මග කසල ගොඩකින් අවසන් කිරීමට නියමිතව සිටියේය. ඊට පෙර එය සිය අවසන් රාජකාරිය සඳහා ආගමන විගමන අමාත්‍යාංශයේ

එක් වගකිව යුතු නිලධාරියෙකුගේ මේසය මතට ආවේය. මේසයේ වීදුරු තහඩුව මත එය පරවූ මලක් මෙන් අප්‍රාණිකව තිබුණේය. ඒ අසලම සදාකාලික නිහඬතාවට පත් කුඩා ලෝහමය කෝෂය - ක්ෂුද්‍ර මයික්‍රෝෆෝනය තබා තිබුණේය.

එකී අජධ්‍යාකාශ - ඔත්තුකරු, දැන් මෙහි පැමිණිල්ලේ ප්‍රධාන සාක්කිකරු බවට පත් වී සිටියි.

"ඔබ මේ සෙල්ලම් බඩුව හඳුනනවාද? ක්රේදෝ මහත්මයා?"

"හඳුනනවා" යි කෙසෙල් කොම්පැනියේ කොටස්කරු කෙටියෙන් පිළිතුරු සැපයීය.

"ව්‍යාපාරිකයෙක් හැටියට සෝවියට් දේශය තුළ ක්‍රියා කොට ඇති පරස්පර විරෝධී ක්‍රියාකාරීත්වයේ බරපතලකම ඔබ දන්නවාද?"

ක්රේදෝ මහතා 'සෙල්ලම් බඩුව' දෙස බැල්මක් හෙලා කෙටියෙන් පිළිතුරු දුන්නේය.

"දන්නවා !"

"ඔබව මේ රටේ දේශ සීමාවලින් එපිටට පිටුවහල් කරන බව දැනුම් දෙන්නෙමු... ඔබේ වෙළෙඳ ව්‍යාපාරය වසා දමනු ලැබේ. කරුණාකර මේ ලියවිල්ලට අත්සන් කරන්න."

සාක්කුවෙන් පෑනක් එළියට ගත් ක්රේදෝ මහතා ලියවිල්ලට අත්සන් කරනු පිණිස මේසය මතට නැඹුරු විය. ඔහුගේ බැල්ම කුඩා ප්‍රචාරකයා - මයික්‍රෝෆෝනය - වෙත යොමු විය. එම කුඩා මයික්‍රෝෆෝනය එක්වරම අදිසි බලවේගයකින් ක්‍රියාකාරී වූවා සේ ද, දැන් එය මුළුමහත්

ලෝකයටම තමාගේ අපකීර්තිය ගැන ප්‍රචාරය කරතැයි ද ක්රේදෝ මහතාට හැඟුණේය.

"මාව නිදහස් කරනවද?"

"ඔව්. වහාම අප රටෙන් පිට වී යන්න. රුසියාව කෙසෙල්වලට බොහොම කැමතියි. එහෙත් මේ වගේ අයුතු දේවලට නම් නොවේ"

අමාත්‍යාංශයේ නිලධාරියා හිසින් සන්කොට මයික්‍රෝෆෝනය පෙන්වමින් පැවසීය.

ක්රේදෝ මහතා හිස නමා ආචාර කොට පිටවන දොරටුව දෙසට පා නැගුවේය.

****

මිනිසුන් සදහටම පිටව යන විට ඔවුන්ගේ නිවෙස් දුම්රිය පොළක සිරි ගනියි. විශාල පෙට්ටි, සූට්කේස් සහ පාර්සල්වලින් මුළුමහත් ගෘහයම පිරෙයි. කඩිසර බව සහ කලබලය විසින් එදිනෙදා සාමාන්‍ය දිවි පෙවෙත පලවා හරිනු ලබයි. කෙනෙක් තවෙකෙකුට බාධා කෙරෙයි. කෙනෙක් තවකෙකුට කෝප වෙයි.

"හා - හා, ඉක්මනට ! දැනටමත් පරක්කුයි !"

"මගේ සපත්තු දෙක කොහාට විසි කරලද ? ඒක මේ දැන් මෙතන තිබුණා නේ?"

එහෙත් සපත්තු නොමැත. මෙවැනි කලබලකාරී මොහොතක මිනිත්තුවක් පාසාම බඩු බාහිරාදිය අතුරුදහන් වෙයි. එක්වරම ඒවාට එහෙ මෙහෙ පැන දුවන්නට සහ සැඟවගන්නට හැකියාව ලැබුණාක් මෙනි.

"මගේ පාඩම් පොත් ටික මෙතනනේ තිබුණේ... මා, කෝ මගේ පාඩම් පොත්?"

"නුඹට ඒවායින් මින් මත්තට පලක් නැහැ"

"පලක් තියෙනවා ! මම ආපහු රුසියාවට එනවා. මට මෙහේ යාළුවෝ ඉන්නවා !"

එවිට දොරටුව අසල මුහුණ අඳුරු කරගත් පියා පෙනී සිටියේය.

"අමතක කර දමාපන් ඔය රුසියාව ගැනයි යහළුවෝ ගැනයි පුතේ. නුඹ දැන් බැරෑරුම් ලෙස ව්‍යාපාර ගිණුම්කරණය ඉගෙන ගැනීමට සූදානම් විය යුතුයි. අඩුම තරමින් නුඹට කොම්පැනියක ලිපිකරුවෙක් වත් වෙන්න හැකි වේවි... ඉන් එහා නම් නොවෙයි!"

"මට ඕනෑ ගුවන් යානා අත්හදා බලන්න !" යි සංචෝ දැඩිව කියා සිටියේය.

"මට ඕන පියාසර කරන්න !"

"පියාසර කරන්න? නුඹ දැන් හිතන්න ඕන බඩට පාන් කෑල්ලක් ගැන විතරයි ! බහු බූත පියැඹිල්ලක් ගැන නොවෙයි! මගේ හිතේ දූනටමත් අපේ ජීවිකාව අහිමි වෙලා"

"හැබෑටම පා, මිනිස්සු ජීවිකාව උපයා ගන්නේ ප්‍රෝඩාවෙන් විතරම ද?"යි සංචෝ ප්‍රශ්න කළේය.

"හැමෝම තම තමන්ට හැකි විදියට හරි හම්බ කරගන්නවා" යි පියා කීවේය.

"අපි හැකි උපරිම ආකාරයෙන් අවංකව ජීවිකාව උපයා ගන්න වෑයම් කරමු පුතේ!"

අම්මා නිහඬව සිය ගවුම් ලොකු ඇඳුම් පෙට්ටියේ ඇසිරුවාය. ඇගේ වත දොම්නසින් මැල වී තිබේ. ශෝකී අවස්ථාවල පලඳින කළු පැහැති සාලුව ඇය පෙට්ටියේ තැන්පත් කළාය.

"සූදානම් වෙන්න සංචෝ" යයි ඇය පහත් හඬින් තෙපළාය. "තව පැයකින් වාහනය ඒවි"

සියලු බඩු බාහිරාදිය දැනටමත් අසුරා අවසන්ව තිබිණි. එහෙත් අල්මාරිය මත අනාථ දරුවෙකු සේ කහ සරුංගලය වැතිරී සිටියි. සිය ස්වාමියා පිටව යාමට සැරසෙන බවත්, ඔහු සමග තමා රැගෙන නොයන බවත් එය ඉවෙන් මෙන් දැනගත්තාක් මෙනි. එහි කොළ පැහැති දෙනෙත් ශෝකී බවක් පෙන්වීය. සංචෝ සරුංගලය දුටුවේය. අල්මාරිය අසලින් පුටුවක් තබා ඒ මත නැගුණු සංචෝ සරුංගලය අතට ගත්තේය.

සරුංගලය විශාල එකකි. එහෙත් දැන් එය ඉතාමත් සැහැල්ලු වී තිබුණේ, මන්දෝත්සාහය සහ ශෝකී බව නිසා වැහැරී කෙට්ටු වූවාක් මෙනි.

සරුංගලය අත ඇතිව සංචෝ දොර වෙතට ගියේය.

"නුඹ කොහේ යන්නද?" යි අම්මා ප්‍රශ්න කළාය.

"මම දැන්ම ආපහු එනවා"

****

ඔහු සරුංගලය සමගින් වීදිය දිගේ ඇවිද ගියේය. සියලු මගියෝ නැවතී ඔහු දෙස අවධානය යොමු කළහ. මගීහු පාරේ ඉඩ දෙමින් යමක් මිමිනූහ. සෑම කුඩා දරුවෙක් ම

පාහේ එම අපූරු සරුංගලය අතින් ඇල්ලීමට කුල්මත් විය. සැහැල්ලු සුළං රැලි සරුංගලයේ පියාපත් මත දැවටුණෙන්, එය සර-සර හඬ නංවමින් සෙලවෙන්නට පටන් ගත්තේය. එයට ඉගිළ යන්නට වුවමනා වූවාක් මෙනි. එහෙත් ශක්තිය නොසැහිණි.

අවසන් වරට සංචෝ, යටි රැවුළු සහිත ශෛලමය යෝධයන් උරෙන් ගත් සඳලුතල ඇති නිවෙස ඉදිරිපිට නතර විය. අවසන් වරට ඔහු උණුසුම් රුසියානු පාන්වල ප්‍රණීත සුවඳ ළය පුරා ආශ්වාස කළේය.

සීනුව නාද විය. රීතා දොර හැරියාය.

"සංචෝ ? නුඹ තනිව ම?"

"මම සරුංගලයත් එක්ක" යයි සිය සගයා පෙන්වමින් සංචෝ උත්තර දුන්නේය.

"එන්න ඇතුළට.. දෙන්නම"

සංචෝ සරුංගලයත් රැගෙන ගෙට ඇතුළු විය.

"එයා නුඹට ගැහුවද?" යි රීතා ඇසුවාය. "අර ඔත්තුකාර මහත්තයා ?"

සංචෝ නිහඬව සිටියේය.

"එයා නුඹට රිදෙන්න ගැහුව ද?" යි රීතා අනුකම්පාවෙන් විචාළාය.

"නැහැ. එයා ගැහුවේ නැහැ..." යි කොලුවා පිළිතුරු දුන්නේය. "නමුත් එයා තාත්තාට කිව්වා, මම ද්‍රෝහියෙක්ලු... රීතා, අනේ මම ද්‍රෝහියෙක් ද?"

"නුඹ ද්‍රෝහියෙක් නොවෙයි සංචෝ... නුඹ... නුඹ..." යි සුදුසු වදනක් තෝරාගන්නට මෙන් ඇය සිතන්නට වූවාය. "නුඹ උදාර මිනිහෙක් සංචෝ...! හරියට දොන් - කිහෝත් වගේ..."

"දොන්- කිහෝත් අවංක යාළුවෙක් නේද, රීතා?"

"ඔව්, සංචෝ. නුඹ යනවාද?"

"තව පැයකින් වාහනය ඒවි..."

"මෙහෙම වෙන බව මං දන හිටියා..."

"මම ලොකු වෙලා කවදා හරි ආපහු එනවාමයි"

"නොවරදවාම ආපහු එන්න සංචෝ. නුඹ අවංක මිත්‍රයෙක්!"

"මම හැමදාමත් නුඹේ අවංක මිත්‍රයා වෙන්නම් රීතා... ඔයාලාගේ රටේ ගුවන් නියමුවෙක් වීමට ඉගෙන ගන්න පුළුවන් ද?"

"ඇත්තටම පුළුවනි. ලෝකයේ හැම රටකින් ම අපේ රටට එනවා, ගුවන් නියමුවෙක් වීමට ඉගෙන ගැනීමට..."

"ඔය ඇත්තමද?"

"ඇත්තමයි, සංචෝ"

"ඒත් මම බාගදා, කවදාවත්ම පොහොසතෙක් නොවේවි. තාත්තා කියනවා, මම සූදානම් විය යුතුයිලු ව්‍යාපාර ගිණුම්කරණය ඉගෙන ගැනීමට... මම කෙසෙල් කොම්පැනියේ ලිපිකරුවෙක් වේවි... මට ඕනෑ නෑ ලිපිකරුවෙක් වෙන්න. මට ඕන නැහැ, ඔය කෙහෙල්මල් කොම්පැනිය. කොම්පැනිය හංග වේවා!"



"කොම්පැනිය හංග වේවා !" යි රීතා උද්වේගයෙන් කීවාය. "සරුංගලය අරගෙන එන්න සංචෝ"

ඇය සංචෝ කැටුව, මිය ගිය ගුවන් යානයේ පිළිස්සුම් පැල්ලම් සහිත අවර පෙත්ත අසලට ම පා නැගුවාය.

"නුඹේ සරුංගලය මෙතන ආරක්ෂිතව තිබුණාවේ... අවරපෙත්ත අසලින් ම... හැබැවට ම එය පවා පියාසර කළා නොවැ. නුඹේ සරුංගලය අවංකයි. ඔහු ද්‍රෝහියෙක් නොවෙයි."

"ඔහු ද්‍රෝහියෙක් නොවෙයි, අර රොකට්ටුව වගේ ! මමයි එය හැදුවේ..."

"අපි ෂූරික්ට එයාගේ දෙගා බල්ලත් එක්කරගෙන එන්නැයි කියමු... එයා ඔත්තුකාර මහත්තුරු අල්ලාවි... එයාගේ ලොකුම සිහිනය..."

"අල්ලන්න ඕන රීතා... ඒත් මට දැන් යන්න වේලාව හරි..."

"මම නුඹව ඇරලවන්නම්"

****

ඇඳුම් පෙට්ටිවල සහ පාර්සල්වල හැපෙමින් පියා කාමරය පුරා නොඉසිල්ලෙන් සක්මන් කරන්නට වූයේය. ඔහු කෝපයෙනි.

"ආන්නා, කෝ අපේ පුතණ්ඩියා?"

"අපේ පුතා..." යි අම්මා සුසුම් ලෑවාය. "එයා මේ දැන් ඒවි... අනේ ඉවසන්නකෝ...!"

"මට ඇහැකි ඉවසන්න. ඒත් පෑන් ඇමෙරිකන් ගුවන් සේවය පොඩි එකෙක් වෙනුවෙන් ඉවසන්නේ නැහැ"

රොද්‍රිගෙස් මහතා කෝපයෙන් කවුළුව වෙත පිය නැගුවේය. ඔහු සිය පුත්‍රයා කවුළුවෙන් දුටුවේය. මිතුරන්

පිරිවරා ගත් සංචෝ වීදියේ එමින් සිටියේය. ඔහුගේ වත තලඑළලු පැහැ ගත්ත ද, හිසකේ කාල වර්ණයෙන් බැබුලුණ ද, ඔහු සිය රුසියානු සගයින්ට බෙහෙවින් සමාන විය. වීදියේ පියවර නගන සංචෝ දුටු දෙමාපියෝ, මින් පෙර කිසි කලෙක නොදුටු විරු පෞරුෂයක් දක ඉමහත් මවිතයට පත් වූවෝය.

"මිනිහා දැන් යස ඉලන්දාරියා !" යි අම්මා පැවසීය.

සංචෝ අසලින් කාල වර්ණ කරපටියක් පැළඳගත් විශාල එඬේර බල්ලෙක් දිව එමින් සිටියේය...

****

පොළොවට ඉතා ඉහළින් පියාසර කරන විට, ගුවන් යානය රොකටයක වේගයෙන් ඉගිලී ගිය ද, එය ගමන් ගන්නා බව යානයේ සිටිනවුන් හට නොතේරෙයි. හරියට ම ගුවන් තොටිල්ලේ එක තැන නතර වී ඇති සෙයකි. එමෙන් ම ඔවුන්ට සීතල ද නොදැනෙයි... යානයෙන් පිටත වායු ගෝලයේ උෂ්ණත්වය උත්තර ධ්‍රැවයටත් වඩා පහළ ගොස් ඇති විට පවා...

යුද හමුදා සෙබළියක වැනි ගුවන් සේවිකාව බීම වර්ග පිරි ගැලක් තල්ලු කරගෙන යමින් මගීන්ගෙන් මෙසේ විමසයි.

"ජින්, විස්කි, කොකා-කෝලා, ජූස්...

සංචෝ ගුවන් සේවිකාවට කන් නොදුන්නේය. ඔහුට බීමට ආසාවක් නොමැත. වටකුරු කවුළුවෙන් ඔහු ඉවත බලා සිටියේය. වලාකුළු රහිත පැහැදිලි අහස ! අළු දම් පැහැති සිහින් මීදුම් පටලයෙන් වැසුණු රුසියානු භූමිය !

ඔහු එදෙස බලා සිටියේය. ඔහුගේ හදවත කඩා වැටුණාක් මෙනි... ඒ තරම් ආත්මීය භූමිය අතහැර යාමට ඔහුට සිත් නොදෙයි. සීත ඍතුවේ දවසක සරුංගලය සමගින් ඔහු හිම කෙළියේ යෙදුණු සුදෝ සුදු විල ගුවනේ සිට දක ගැනීමට ඔහු වෑයම් කළේය. එහෙත් පහළින් වැතිරගත් මහා භූමියේ කොතරම් විල් පිහිටා තිබේද? ඒවා එකිනෙකට කොතරම් වෙනස් වී ද?

එක්වරම ගුවන් සේවිකාව මෙසේ නිවේදනය කළාය.

"අපි දැන් සෝවියට් දේශයේ ගුවන් සීමාව පසුකර යාමට සැරසෙන්නෙමු !"

විදුලිය සහිත කම්බියක් ගත දැවටුණාක් මෙන් සංචෝ එක්වරම තිගැස්සිණි. වටකුරු වීදුරු කවුළුවට ඔහු මුහුණ තදින් ඔබා ගත්තේය. ඔහුගේ නාසය තැලී පැතලි විය. කවුළුවට එපිටින්, ගුවන් යානය අසලින් ම කහ සරුංගලය පියාසර කරන සැටි ඔහු දුටුවේය. එය සිය කොළ පැහැති නෙත් යොමා සංචෝ දෙස බැලුවේ, අවසන් වරට 'සමාවෙන්න' යැයි පවසන්නාක් මෙනි. සරුංගලයේ සිට මහ පොළොව තෙක් පණුතී නූලක් ඇදුනේය. එහි පහළ කෙළවර රැසියානු පොළොව මත, ඔහුගේ සැබෑ සෝවියට් මිතුරෝ එය දැඩිව අල්ලාගෙන සිටිති. රීතා, ෂූරික්, අබ්‍රිකොස්, -අලීෂා ඈ සියලු මිතුරෝ... එම ජීවයෙන් පිරි හුය සංචෝගේ හදවත විනිවිද ගියේ, යළි කිසි දිනෙක වෙන් නොවන අටියෙනි...

Санчо и желтый змей

යූරි යාකොව්ලෙව්

සංචෝ සහ කහ සරුංගලය

සංචෝ සහ කහ සරුංගලය සෝවියට් දේශයේත්, ඉන් පිටත විදේශයන්හිත් ඉමහත් ජනාදරයට පත් කෙටි නවකතාවකි. ලතින් ඇමරිකානු රටකින් සෝවියට් දේශයට පැමිණෙන සංචෝ නම් කුඩා දරුවකු වටා ගෙතෙන මෙම කතාව ජාතීන් අතර මිත්‍රත්වය, ළමා අවංකත්වය, උදාර හා සත්‍යවාදී බව මෙන් ම, සීත යුද සමයේ එක් අඳුරු පැතිකඩක් ද යථාර්ථවාදී ලෙස විස්තර කරයි.

යූරි යාකොව්ලෙව්ච් යාකොලෙව් (1922-1995) සෝවියට් රුසියානු ලේඛකයෙකි. සිනමා තිර පිටපත් රචකයෙකි. ළමයින් හා තරුණයන් වෙනුවෙන් බොහෝ පොත පත ලියූ ලේඛකයෙකි.

1922 රුසියාවේ ලෙනින්ග්‍රාඩ් හි උපත ලැබූ ඔහු 1940 දී සිය මාතෘ භූමිය වෙනුවෙන් දෙවන ලෝක සංග්‍රාමයට එක් විය. මොස්කව් නුවර ආරක්ෂා කිරීමේ මහ සටනට සහභාගි වී ඔහු බරපතල ලෙස තුවාල ලැබූ අතර, ජර්මන් හමුදා විසින් ලෙනින්ග්‍රාඩ් වටලන ලද අවස්ථාවේ ඔහු ගේ මව මිය ගියා ය. 1952 දී මක්සිම් ගෝර්කි සාහිත්‍ය සරසවියෙන් පිටවූ හෙතෙම පුවත්පත් කලාවේදියකු ලෙස සේවය කරමින් මුළු මහත් සෝවියට් දේශය පුරා සැරිසැරුවේ ය. එය ඔහු ගේ අසමසම සාහිත්‍ය නිර්මාණ සඳහා ජීව ගුණය සැපැයී ය.

ඔහු ගේ සාහිත්‍ය නිර්මාණ ආරම්භ වූයේ කාව්‍ය කෘති වශයෙනි. 1949 දී ඔහු ගේ පළමු ළමා කෘතිය වන "අපේ ලිපිනය" ප්‍රකාශයට පත් විය. "අපේ බලකායෙහි", "කොල්ලන් ගේ නැවතුම් පොළ", "අණ දෙන්නා ගේ දියණිය", "මට සිංහයකු සිටියි", "මම සයිබීරියාවේ උපන්නෙමි", "නැගී සිටීමේ චතුරස්‍රය", සහ "සිරියෝෂා ගේ සිහින", පාඨක ආදරය දිනාගත් ඔහු ගේ කෘති අතරින් කිහිපයකි.

රුසියාව ප්‍රකාශකයෝ

මිල රු. 850/-

බෙදාහැරීම: දුයිෂෙන්ගේ පොත්හල, නුගේගොඩ. 076 900 5931

Layout, Cover Design & Print | NEO GRAPHICS

ISBN 978-955-0745-09-8